# හෘදසාක්ෂියේ
# සම්මුතිය

## ජාතික වැඩපිළිවෙළ

**ජනතා විමුක්ති පෙරමුණ**

නියමුවා ප්‍රකාශන

© නියමුවා ප්‍රකාශන
ISBN 978-955-8696-41-5

පළමු මුද්‍රණය - 2015 ජුලි

**මුද්‍රණය:**

ප්‍රින්ටෙල් ප්‍රයිවට් ලිමිටඩ්
21/11,
04 වෙනි පටුමග,
අරලිය උයන,
දෙපානම,
පන්නිපිටිය.

**ප්‍රකාශනය:**

නියමුවා ප්‍රකාශන
464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**විමසීම්:**

දුරකථනː- +94112785612
ෆැක්ස්ː- +94112786050
ඊ-මේල්ː- niyamuwa@jvpsrilanka.com
වෙබ්ː- www.jvpsrilanka.com

# පටුන

## ජනතාවාදී පාලනයක්


01. රාජ්‍ය ව්‍යුහය
    1. රාජ්‍ය බලය
    2. රාජ්‍ය ක්‍රියාකාරිත්වය
02. මූලික අයිතීන්
03. ජාතික ආරක්ෂාව
04. ජාතික සමගිය
05. විදේශ ප්‍රතිපත්තිය


## උසස් මානව සම්පතක්


01. අධ්‍යාපනය
02. සෞඛ්‍යය
03. ජලය, ආහාර හා පෝෂණය සහ සනීපාරක්ෂාව
04. ක්‍රීඩා සහ ශරීර සුවතාවය
05. විද්‍යා හා තාක්ෂණ


## නවීකරණය හා කාර්මීකරණය වූ රටක්


01. ආර්ථික ක්ෂේත්‍රය
02. කර්මාන්ත
03. කෘෂිකර්මාන්තය
04. පශු සම්පත්
05. ධීවර හා ජලජ කර්මාන්තය
06. වැවිලි කර්මාන්තය
07. සංචාරක කර්මාන්තය

08. ඉඩම්
09. ජල කළමනාකරණය සහ වාරිමාර්ග
10. දේශීය සහ විදේශීය වෙළඳම
11. මූල්‍ය ක්ෂේත්‍රය
12. බලශක්තිය
13. ප්‍රවාහනය සහ මහාමාර්ග
14. නිවාස
15. පරිසරය
16. රැකියා
17. විදේශගත ශ්‍රී ලාංකිකයින්
18. ග්‍රාමීය සංවර්ධනය

## සාධාරණ සමාජයක්

01. ආණ්ඩුවේ කාර්යභාරය
- මූලික මිනිස් අයිතීන්
- අධිකරණය
- අපරාධ හා බන්ධනාගාර
- කාන්තා හා ළමා අයිතිවාසිකම්
- වැඩිහිටි, ආබාධිත සහ වෙනස්වූ හැකියාවන් සහිත පුරවැසියන්
- සමාජ සුභසාධනය
- නාස්තිය, දූෂණය සහ වංචා වැළැක්වීම

02.පෞද්ගලික සමාගම්වල හා ආයතනවල කාර්යභාරය
03. පවුල සහ පුද්ගල කාර්යභාරය

## නිවහල් මිනිසෙක්

# හැඳින්වීම

1948දී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ සෘජු යටත්විජිත පාලනයෙන් මිදී ලංකාවට ලැබුණු අර්ධ නිදහසත් සමග ලාංකේය ජනතාව තමන්ගේ ඡන්දයෙන් ආණ්ඩුවක් පිහිටුවා ගනු ලැබුවේ මහත් බලාපොරොත්තු පොදි බැඳගෙනය. නිදහසින් පසු බලයට පත් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ සිට මේ වන විට පුරා වසර 67ක් අපේ රටේ ජනතාවගේ ඡන්දයෙන් බලයට පත්ව මෙරට පාලනය කළේ එජාප හා ශ්‍රීලනිප ප්‍රමුඛ හවුල් ආණ්ඩුය.

රට සංවර්ධනය කරන බවට, දුප්පත්කම නැති කරන බවට, රට හදන බවට දහසක් පොරොන්දු ලබා දෙමින් බලයට පත්ව රට පාලනය කළ පාලක කණ්ඩායම් දෙකේ වසර 67ක පාලනයෙන් පසු රට පත්ව ඇත්තේ ඉතාම කණගාටුදායක තත්වයකටය. ජනතාව පත්ව සිටින්නේ ඉතාම දුෂ්කර හා දුක්ඛිත තත්වයකටය.

නිෂ්පාදන ක්ෂේත්‍රය මුළුමනින්ම නොසලකා හැරීමේ හා විනාශ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මේ වන විට අපේ රට 'ණයට කන', විදේශ හා දේශීය ණය මත යැපෙන රටක් බවට පත්කර තිබේ. එහි ප්‍රතිඵලය වී ඇත්තේ, ලංකාවේ සෑම පුරවැසියෙක්ම රු. ලක්ෂ 04ක පමණ ණයකාරයෙක් වීමය. කලින් ගත් ණය සඳහා වාරික හා පොලී ගෙවීම සඳහාද යළි ණය ලබා ගැනීමට සිදුවීමෙන් රට ණය උගුලක සිරවී එහි බර පොදු ජනතාව මත පැටවී ඇති බව රහසක් නොවේ.

අනෙක් අතට සංවර්ධනය පිළිබඳ පුරසාරම්, මුසාවන් බවට පත්වද්දී රටේ ආදායම් බෙදී යාමේ විෂමතාවය වැඩිවී දිළින්දන් ප්‍රමාණය වැඩිවී ඇත. ලංකාවේ ජනගහනයෙන් පොහොසත්ම පවුල් 20% ජාතික ආදායමෙන් 55%ක් පමණ අත්කර ගනිද්දී ජනගහනයෙන් දුප්පත්ම පවුල් 20% අත්කර ගන්නා ප්‍රමාණය ජාතික ආදායමෙන් 3.6%ක් තරම් කුඩාවී තිබේ.

ලංකාව විශාල මූල්‍ය අර්බුදයකට මුහුණ දී සිටින අතර පැහැදිලි ආර්ථික ප්‍රතිපත්තියක් නොමැතිකමින් හා අවශ්‍ය තරම් මූල්‍ය ප්‍රතිපාදන වෙන් නොකිරීමත් නිසා ජනතාවගේ අධ්‍යාපන, සෞඛ්‍ය, ගමනාගමන, නිවාස ආදී සේවා බිඳ වැටී ඇත. ලංකාවේ වසරකට දරුවන් 360,000ක් පාසැල්වලට ඇතුළත් වෙද්දී විශ්වවිද්‍යාලවලට ඇතුළත්ව උපාධියක් ලබා පිටවන්නේ උපරිම 30,000ක් පමණය. ඉන් කියවෙන්නේ, පළමු පන්තියෙන් පාසැල්වලට ඇතුලත්වන ළමුන්ගෙන්
330,000ක්ම අතර මගදී අධ්‍යාපනයෙන් පිටමං කෙරෙන බවය. ලංකාවේ වසරකට රැකියා අපේක්ෂාවෙන් රැකියා වෙළඳපොළට ඇතුල්වන තරුණ තරුණියන් ප්‍රමාණය ලක්ෂ 03ක් පමණ වන විට රාජ්‍ය අංශයේ හා විධිමත් පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා ලැබෙන්නේ ඉන් 65,000කට පමණි. ඉතිරි 235,000 ජීවත්වීමට මඟක් නොමැති අය බවට පත්වේ. ඉන්

සිදුව ඇත්තේ අනාගතයක් නැති ජනතාවක් බිහිවීමය.

මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ, සමාජය තුළ අපරාධ ඉහළ යෑම සහ සමාජය සංස්කෘතික වශයෙන් පිරිහීමට ලක්වීමය. පොලිස් වාර්තාවන්ට අනුව සෑම පැය 03කට වරක් ස්ත්‍රී දූෂණයක් සිදුවේ. ලංකාවේ මත්කුඩුවලට ඇබ්බැහිවූවන් ලක්ෂයක් සිටින අතර ඒ අනුව සෑම පවුල් 50කටම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවෙක් සිටී. ලංකාවේ සෑම දිනකම 14 දෙනෙකු දිවි නසා ගන්නා බව වාර්තා වේ. මේ වසර 67ක තට්ටුමාරු දේශපාලනයේ අවසන් ප්‍රතිඵලයය.

අනෙක් අතට ලංකාවේ ජාතික සමගිය ගොඩනැගීම තවම සිදුවී නොමැති අතර ජාතිවාදයන් හා ආගමික අන්තවාදයන්ගෙන් ජනතාවට පීඩාවට පත්වේ.

රට තුළ වංචා, දූෂණ ඉහවහා ගොස් ඇති අතර මර්දනය වැඩිවීම, බලය අයුතු ලෙස භාවිතය තුළ ප්‍රජාතන්ත්‍රවාදය අභියෝගයට ලක්ව තිබේ. මේ සියල්ල පොදුවේ ගත්විට ලංකාව ඉතාමත් බරපතළ සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික අර්බුදයක ගිලී ඇති බව පැහැදිලිය.

පසුගිය 2015 ජනවාරි 08වනදා ජනාධිපතිවරණයෙන් ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලනය වෙනුවෙන් මෙරට ජනතාව ඉදිරි පියවරක් තැබුවද එම පියවර ආපසු හැරවීමේ හා එයට පිටුපෑමේ ක්‍රියාදාමයක් සිදුවෙමින් තිබේ. මෙම කරුණු මගින් ඔප්පුකර තිබෙන්නේ, මෙතෙක් රට පාලනය කළ කිසිදු පාලක කණ්ඩායමක් පිළිබඳ විශ්වාසය තැබිය නොහැකි බව මිස අන් දෙයක් නොවේ.

මේ තත්වය විසින් ඉල්ලා සිටින්නේ කුමක්ද? ඒ සරල ප්‍රතිසංස්කරණවලට සීමා නොවී සමාජයේත් සමාජ ආර්ථික දේහයේත් ගැඹුරු පරිවර්තනයක් සිදුකළ යුතුව ඇති බවය. ඒ සඳහා නිවැරදි දැක්මක් මත සකස් කරන ප්‍රතිපත්ති මාලාවක් හා එය ක්‍රියාවට නැගීමට කැපවන විශ්වාසවන්ත නායකත්වයක අවශ්‍යතාවය තිබෙන බවය.

ලංකාව වර්තමානයේ මුහුණ දී ඇති බරපතළ අර්බුදයන්ට ඇත්තේ, එක් සැබෑ විසඳුමක් පමණි. එනම් පවතින වැරදි සමාජ ආර්ථික දේශපාලන ක්‍රමය එහි පදනමින්ම වෙනස් කරන ගැඹුරු හා පුළුල් පරිවර්තනයකි. සැබෑ ආර්ථික සංවර්ධනය, සමාජ සාධාරණත්වය, ප්‍රජාතන්ත්‍රවාදය, සැබෑ ජාතික සමගිය, සැබෑ ජාතික නිදහස, පුද්ගල නිදහස හා යහපාලනය ගොඩනැගිය හැකි හා තහවුරු කළ හැකි සමාජයකි. ජනතාවගේ දෛනික දැවෙන ගැටලුවලට වහාම විසඳුම් ලබා දිය හැකි පාලනයකි. එනම් වර්තමානයේ අපේ රටට ගැලපෙන නවීන සමාජවාදී ප්‍රතිපත්ති මත පදනම් වූ ජනතා පාලනයකි. මේ වෙනුවෙන් පසුගිය 2014 පෙබරවාරි මාසයේ පැවැත්වූ ජනතා විමුක්ති පෙරමුණේ 07වන ජාතික මහා සමුළුව විසින් අනුමත කරන ලද "අපේ දැක්ම" ප්‍රතිපත්ති මාලාව පදනම් කරගනිමින්, එය වත්මන් තත්වයට අවශ්‍ය පරිදි පුළුල් හා විස්තීර්ණ කරමින් හා විවිධ සංවිධානවල, පුද්ගලයන්ගේ හා ඒ ඒ ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගේ අදහස් හා යෝජනා එකතුකර ගනිමින් සකස් කළ මෙම ජාතික වැඩපිළිවෙළ
"හෘදසාක්ෂියේ සම්මුතිය" ලෙසින් ලාංකේය ජනතාව වෙත මෙසේ ඉදිරිපත් කරමු.

මේ සඳහා සිය යෝජනා හා අදහස් ලබාදෙමින් හා අප දිරිමත් කරමින් මෙම කාර්යයට දායක වූ සියලුම දෙනාට අපගේ ස්තුතිය පිරිනැමීමටද මෙය අවස්ථාවක් කර ගනිමු.

2015 ජුලි 22

# ජනතාවාදී
# පාලනයක්

# 01. රාජ්‍ය ව්‍යුහය

1948 සිට ලංකාවේ පවතින්නේ, බ්‍රිතාන්‍යයන් විසින් අප මත පටවා ගිය හා පසුව බලයට පත් දේශීය පාලක කණ්ඩායම් විසින් තම බල අරමුණු වෙනුවෙන් වෙනස්කම් කරමින් පවත්වාගෙන යන රාජ්‍ය පාලනයකි; රාජ්‍ය ව්‍යුහයකි. මෙම රාජ්‍ය පාලනයත් රාජ්‍ය ව්‍යුහයත් එහි මූලධර්මත් සකස් කර ඇත්තේ, පාලක අධිපති කණ්ඩායම්වල වුවමනාවන් රැකෙන ආකාරයෙන් මිස ලාංකේය සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ඇතුළු සියලු ජනතාවන්ගේ අභිලාෂයන් සහ අයිතීන් රැකෙන ආකාරයට නොවේ.

මෙතෙක් රට පාලනය කළ ප්‍රභූ පවුල් කීපයකට අයත් සුළු පිරිසගේ පාලනය රටේ ව්‍යවස්ථාදායකයේ නීති පැනවීමේ සිට පාසලට දරුවකු ඇතුළු කිරීම දක්වා වූ සෑම සමාජ ආයතනයකටම, ක්‍රියාවලියකටම මැදිහත්වන ක්‍රමයක් නිර්මාණය කර තිබේ. ඒ නිසාම සියලු රාජ්‍ය ආයතන හා කළමනාකරණ පද්ධතීන් බිඳ වැටුණු, දේශපාලනඥයා පමණක් එකම ආයතනය හා ක්‍රියාකාරිත්වය වූ ක්‍රමයක් බවට මෙය පත්ව තිබේ. ආණ්ඩු බලය ලබා ගන්නා කණ්ඩායම සහ ඔවුන් වටා එකතුවන පිරිසක් විසින් පමණක් ආර්ථික හා සමාජ ප්‍රතිලාභ සහ වරප්‍රසාද භුක්ති විඳිනවා පමණක් නොව ඔවුහු විසින් සාමාන්‍ය ජනතාව පීඩාවට සහ මුලාවටද පත් කරති.

සමාජ ජීවිතයේ එකම දර්ශකය සහ දර්ශනය ලාභය, මුදල් සහ වැඩිම භාණ්ඩ හා සේවා ප්‍රමාණයක් භුක්ති විඳීම මත පදනම්ව මුදල් සෙවීමට සමාජය පොළඹවන අධිපරිභෝජනවාදයෙන් ජනතාව මංමුලා කරන ආර්ථික ක්‍රමයක් එම තට්ටුමාරු පාලන ක්‍රමය විසින් දශක කීපයක් පුරා පවත්වාගෙන යමින් සිටින අතර රාජ්‍ය පාලනයත් රාජ්‍ය ව්‍යුහයත් නීති රීතිත් සකස් කර ඇත්තේ ඊට අනුවය. එම නිසා මෙම තත්වයන් වෙනස් කර නව රාජ්‍ය ව්‍යුහයක් හා රාජ්‍ය පාලනයක් නිර්මාණය කළ යුතුව ඇත.

**ජනතා විමුක්ති පෙරමුණේ අප රටට ඇවැසි ජනතාවාදී පාලනයක් ලෙස දකින්නේ, අප රට අනාගතයට ගෙන යා හැකි, මිනිසකු විසින් මිනිසකු සූරා නොකන, ජාතියක් විසින් තවත් ජාතියක් පීඩාවට පත් නොකරන, ආර්ථික සමෘද්ධියෙන් හා සමාජ සාධාරණත්වයෙන් යුත් උසස් මිනිස් සමාජයක්, එනම් නවීන සමාජවාදී ප්‍රතිපත්ති මත පදනම් වන නව සමාජයක් ගොඩනැගීම ඉලක්ක කර ගනිමින් ඒ සඳහා පූර්ව පදනම සකස් කරන ජනතාවාදී පාලනයකි.**

සමානාත්මතාවය, ප්‍රජාතන්ත්‍රවාදය, සමාජ සාධාරණත්වය, පුද්ගල නිදහස හා ආරක්ෂාව සහ සහජීවනය යන කුළුණු පහ මත එම ජනතාවාදී පාලනය ගොඩනැංවේ.

# ක්‍රියාමාර්ග

## 1. රාජ්‍ය බලය

- සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ඇතුළු සියලුම ජනතාවන්ට ආර්ථික, දේශපාලන, සමාජමය හා සංස්කෘතික ක්ෂේත්‍රවල සමාන අයිතිය සහ ප්‍රජාතන්ත්‍රවාදී හිමිකම තහවුරු කරන රාජ්‍ය බලයක් සහ රාජ්‍ය ක්‍රියාකාරිත්වයක් ස්ථාපිත කෙරේ. ඒ සඳහා පවතින ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව වෙනුවට ජනතාව ඉදිරිපත් කරන යෝජනා සහ අදහස් සැලකිල්ලට ගෙන කෙටුම්පත් කෙරෙන නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් වසරක් තුළ ජනමත විචාරණයක් මගින් සම්මත කෙරේ.
- ජනතා පරමාධිපත්‍යය ආරක්ෂා කෙරේ.
- විධායක ජනාධිපති ක්‍රමය මුළුමනින්ම අහෝසි කෙරේ.
- පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් ස්ථාපිත කෙරේ.
- දැනට පවතින මැතිවරණ ක්‍රමයේ දුර්වලතා ඉවත් කරමින් රටේ සියලු ජන කණ්ඩායම්වල කැමැත්ත මහජන ආයතන තුළ සාධාරණ ලෙස නියෝජනය වන වඩාත් නිවැරදි හා විද්‍යාත්මක නව මැතිවරණ ක්‍රමයක් සකස් කෙරේ.
- පක්ෂය මාරු කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ මන්ත්‍රීධූර අහෝසි කෙරෙන නීති සම්පාදනය කෙරේ.
- ඇමති මණ්ඩලය 25 දෙනෙකුට සීමා කෙරේ. ආණ්ඩුවේ සියලු තීරණ, ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලයේ සාමූහික වගකීම සහතික කෙරේ.
- මහජන නියෝජිතයින් සඳහා ආචාරධර්ම පද්ධතියක් හඳුන්වා දී ක්‍රියාවට නැගේ.
- මහජන නියෝජිත ආයතනවල මන්ත්‍රීවරුන් සහ නිලධාරීන් සඳහා වූ නාස්තිකාර වරප්‍රසාද සියල්ලම අහෝසි කෙරේ.

  - පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබා දෙන විශ්‍රාම වැටුප අහෝසි කෙරේ.

  - මහජන නියෝජිතයින්ට පෞද්ගලික සුඛෝපභෝගී වාහන බලපත්‍ර ලබා දීම වෙනුවට මහජන නියෝජිතයින්ගේ කටයුතු සඳහා රජයෙන් වාහන සැපයේ.
- ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඇතුළු මර්දන අණපනත් අහෝසි කෙරේ.

- සිවිල් යුද්ධ හෝ වෙනත් ගැටලු නිසා ශ්‍රී ලංකාවට සංක්‍රමණය වන විවිධ සංක්‍රමණිකයන්ට රැකවරණය සහ ආරක්ෂාව ලබාදීම වෙනුවෙන් සංක්‍රමණික යුක්තිය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව කටයුතු කෙරේ.
- තොරතුරු දැනගැනීමේ අයිතිය පනත ක්‍රියාත්මක කෙරේ.
- ජාතික විගණන පනත ක්‍රියාත්මක කෙරේ.

## 2. රාජ්‍ය ක්‍රියාකාරිත්වය

- ජාතික ප්‍රතිපත්ති සහ සැලසුම් සකස් කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් සභාවක් පිහිටවනු ලබන අතර එයට පොදු ජනතාවගෙන්ද දේශපාලනඥයන්ගෙන්ද විෂයයන් හා වෘත්තීන් පිළිබඳ විශේෂඥයින්ගෙන්ද අදහස් සහ යෝජනා ලබා ගැනීමට කටයුතු කෙරේ.
- ජාතික ප්‍රතිපත්තීන් සියලු ජනතාවට දැනගත හැකිවන සේ ලේඛනගත කර ප්‍රසිද්ධ කරනු ලැබේ.
- දැනට පවතින ප්‍රාදේශීය සංවර්ධන ක්‍රියාදාමය සඳහා ප්‍රතිපාදන වෙන්වීම සිදුකරන්නේ විද්‍යාත්මක පදනමකින් නොව අදාල ප්‍රදේශයේ දේශපාලන බලවතාගේ රුචි අරුචිකම් මත හා මුදල් අමාත්‍යාංශයේ තීරණ මත පමණක් පදනම්වය. ඒ වෙනුවට සෑම දිස්ත්‍රික්කයකම පවතින සංවර්ධන විෂමතාවයන් සහ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන ඒ ඒ දිස්ත්‍රික්කවලට රාජ්‍ය අයවැයෙන් නිශ්චිත ප්‍රතිශතයක් නීතිගතකර වෙන් කරනු ලැබේ.
- රාජ්‍ය ආයතනවලින් මහජන සේවාවන් නිසි පරිදි ඉටු නොවන අවස්ථාවලදී ඒ පිළිබඳ විමසීමට හා ඒවා ඉටුකර දීම සඳහා මැදිහත්වන "මහජන සේවා අධීක්ෂණ අධිකාරියක්" ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් පිහිටුවනු ඇත.
- රාජ්‍ය ආයතනවලින් ජනතා සේවය නිවැරදිව ඉටු නොවන අවස්ථාවලදී ඒ පිළිබඳව දැනුම් දීම සඳහා දින 365 පැය 24 පුරා ක්‍රියාත්මක පැමිණිලි මධ්‍යස්ථාන ඉහත අධිකාරියට සමගාමීව ක්‍රියාත්මක කෙරේ.

# 02. මූලික අයිතීන්

මෙතෙක් බලයට පැමිණි සියලු ආණ්ඩු විසින් නොසලකා හරින ලද ප්‍රධානතම කරුණක් වූයේ මූලික මිනිස් අයිතිවාසිකම්ය. බොහෝ විට මිනිස් අයිතිවාසිකම් පවතින ක්‍රමය යටතේ ව්‍යවස්ථාවල වගන්ති පමණක් බවට සීමා විය. කොතරම් ලේඛනගත කළද මෙම අයිතිවාසිකම් සැබෑ ජීවිතයේදී නොලැබී ගොස් ඇත්තේ, එම අයිතිවාසිකම් නිරායාසයෙන් හිමිවන දේශපාලන, පරිපාලන සහ ආර්ථික ක්‍රමයක් පාලකයින් විසින් පවත්වාගෙන නොයෑම

සහ ජනතාවට තමන්ට හිමි අයිතිවාසිකම් මොනවාදැයි අවබෝධයක් ලබා නොදීම හේතුවෙනි. නිදහසේ ජීවත්වීමට ඇවැසි පුද්ගල ආරක්ෂාව පවා අද වන විට අහිමි වී ඇත.

## ක්‍රියාමාර්ග

- රටේ මූලික නීතිය වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මගින් මූලික මිනිස් අයිතීන් ආරක්ෂාව තහවුරු කරනු ලැබේ. ඒ අනුව කථා කිරීමේ, රැස්වීමේ, ප්‍රකාශනයේ, තමන් කැමති දේශපාලනය කිරීමේ, කැමැති ආගමක් ඇදහීමේ සහ හෘදසාක්ෂියේ නිදහස සහතික කෙරේ. ජීවත්වීමේ අයිතිය, වැඩ කිරීමේ අයිතිය, විවේකය හා විනෝදාස්වාදය සඳහා ඇති අයිතිය, සෞඛ්‍ය සම්පන්නව ජීවත්වීමේ අයිතිය, අධ්‍යාපනය ලැබීමේ අයිතිය, නිවසකට ඇති අයිතිය, සංස්කෘතික ඵල ප්‍රයෝජන භුක්ති විඳීමේ අයිතිය, විද්‍යාත්මක ශිල්පීය හා කලාත්මක කටයුතු සඳහා වූ නිදහස සහ අයිතිය, ස්ත්‍රී පුරුෂ සමානත්වය පිළිබඳ අයිතිය යන මූලික අයිතීන් සහතික කෙරේ.
- දේශපාලනික, ආගමික, ජාතිකත්ව ආදී කිසිදු පදනමක් මත පුරවැසියන්ට වෙනස්කම් සිදු කිරීම තහනම් කෙරේ.
- මූලික මිනිස් අයිතිවාසිකම් හිමිවන ආර්ථික, පරිපාලන සහ දේශපාලන යාන්ත්‍රණයක් පවත්වාගෙන යනු ලැබේ.
- මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳව පුරවැසි සමාජය දැනුවත් කර සමාජය බලගැන්වේ.
- රජය විසින් හෝ පෞද්ගලික අංශයේ ආයතන විසින් එම මූලික අයිතීන් උල්ලංඝනය කරන අවස්ථාවලදී රජයට එරෙහිව මෙන්ම පෞද්ගලික ආයතනවලට එරෙහිවද අධිකරණය ඉදිරියට යාමට පුරවැසියන්ට ඇති අයිතිය තහවුරු කෙරේ.
- අවුරුදු 18 ඉක්මවූ සෑම පුරවැසියකුටම ඕනෑම මහජන නියෝජිත ආයතනයක් සඳහා තේරීපත් වීමේ අයිතිය ලබා දෙන අතර වයස 16 ඉක්ම වූ සියලු දෙනාටම ඡන්ද බලය ලබාදේ.
- විදේශගත ශ්‍රී ලාංකික පුරවැසියන්ට විදේශයන්හි සිට ඡන්දය භාවිතා කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස් කෙරේ.

# 03. ජාතික ආරක්ෂාව

රටේ ස්වෛරීත්වයත් භෞමික අඛණ්ඩතාවයත් අභිමානයත්, රටේ සියලුම පුරවැසියන්ගේ නිදහස සහ ජීවිත ආරක්ෂාව පූර්ණ වශයෙන් සහතික කිරීමත් ඕනෑම රාජ්‍ය පාලනයක ප්‍රධානතම වගකීම වේ. ඒ අනුව ජාතික ආරක්ෂාවට සිදුවන යුධමය, දේශපාලනමය,

ආර්ථිකමය, සංස්කෘතිකමය, රාජ්‍යතාන්ත්‍රික බාධාවන් සහ පීඩාවන්ගෙන් ශ්‍රී ලාංකේය රාජ්‍යයත් එහි පුරවැසියනුත් ආරක්ෂා කිරීම අරමුණු කරගත් සංයුක්ත ආරක්ෂක වැඩපිළිවෙළක් අපගේ පාලනයක් තුළ ක්‍රියාවට නැඟේ. එමගින් දැනට සන්නද්ධ සේවාවන්ට පමණක් සීමාවී ඇති "ජාතික ආරක්ෂාව" පිළිබඳ පටු අර්ථකථනයෙන් ඔබ්බට ගිය සුරක්ෂිත රටක් නිර්මාණය කිරීමට හැකිවනු ඇත.

## ක්‍රියාමාර්ග

- ශ්‍රී ලාංකේය භූමිය, ශ්‍රී ලංකාවට අයිති මුහුදු සීමාව හා ගුවන ආරක්ෂා කෙරේ.
- ත්‍රිවිධ හමුදා සහ පොලීසිය දේශපාලන බලපෑමෙන් නිදහස් කෙරේ.
- බෙදුම්වාදය, ත්‍රස්තවාදය හා අන්තවාදයෙන් රටට හා ජනතාවට එල්ලවිය හැකි අනතුරු වැළැක්වීමට ගත යුතු සෑම පියවරක්ම අනුගමනය කෙරේ.
- ආර්ථික, රාජ්‍යතාන්ත්‍රික හා සංස්කෘතික ක්ෂේත්‍ර මගින් රටේ ආරක්ෂාවට හා ස්වෛරීත්වයට එල්ලවිය හැකි අනතුරු පිළිබඳව විශ්ලේෂණය කර ඒ පිළිබඳ සැලසුම් සකස් කිරීම සඳහා විශේෂඥයින්ගෙන් සැදුම්ලත් පාර්ලිමේන්තුවට වග කියන විශේෂ කමිටුවක් පත් කෙරේ.
- ත්‍රිවිධ හමුදා සහ පොලීසියේ සේවය කරන සියලු දෙනා තුළ පවතින පීඩාකාරී තත්වය හා අප්‍රසන්න වටපිටාව අහෝසි කිරීම සඳහා වහාම පියවර ගනු ලැබේ.

# 04. ජාතික සමගිය

බ්‍රිතාන්‍ය පාලන සමයේ සිට ජනතාව බෙදා වෙන්කර පාලනය කිරීමේ සහ අසාධාරණ ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලාංකේය ජාතිය නිර්මාණය වීම අඩාල වූ අතර 1948න් පසු බලයට පැමිණි පාලකයින්ගේ අත්තනෝමතිකභාවය විසින් එය තවදුරටත් තීව්‍ර කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස ජාතිකත්වයන් අතර විරසකයන් වර්ධනය වීමත් ඒවා යුද තත්වයන් දක්වා වර්ධනය වීමත් පසුගිය කාලය පුරා සිදුවිය. ඒ හේතුවෙන් අප රට දැවැන්ත සමාජ-ආර්ථික අර්බුදයකට ලක්කර ඇත. යුද්ධය නිමා වීමෙන් පසු නිර්මාණය වූ නව තත්වය ජාතික සමඟිය ගොඩනැගීම සඳහා යොදා ගන්නවා වෙනුවට පාලකයින් විසින් එය යොදා ගනු ලැබුවේ තමන්ගේ බලය තරකර ගැනීම සඳහාය.

ලංකාව පාලනය කළ සියලු පාලකයින් තම බලය වෙනුවෙන් ජාතිකත්වයන් බෙදා වෙන් කිරීම සඳහා ජාතිවාදය වැපිරූ අතර ඒ සඳහා විවිධ කල්ලි කණ්ඩායම් නිර්මාණය කිරීම අදටත් සිදු කරයි. එමගින් ඔවුන් සිය නොහැකියාව වසා ගන්නා අතර ජනතාව බෙදා තබමින් සිය අත්තනෝමතික පාලනය දිගටම පවත්වාගෙන යාම සිදු කරයි.

## විසඳුම

සියලු ජන කොටස්වලට ප්‍රජාතන්ත්‍රවාදය හා සමානතා පදනම මත අයිතීන් ලබාදීම තහවුරු වන දේශපාලන සහ ආර්ථික ක්‍රමවේදයක් ස්ථාපිත කෙරේ.

ශ්‍රී ලංකාව සියලු ජාතිකත්වයන්, සියලු ආගම්, සියලු සංස්කෘතීන්ගේ විවිධත්වය පිළිගන්නා ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් ලෙස පවත්වා ගැනීමත් ඒ තුළ සැබෑ ජාතික සමගිය ගොඩනැගීමත් සිදු කෙරේ.

## ක්‍රියාමාර්ග

- ජනතා විමුක්ති පෙරමුණ තම ආරම්භක අවධියේ සිට ජාතික ගැටලුව නිවැරදිව අර්ථකථනය කරමින් විද්‍යාත්මකව එය විසඳීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ඇතුළත් කර ප්‍රසිද්ධ කරන ලද "ජාතික ගැටලුව විසඳීම සඳහා ප්‍රවේශය" මගින් ඉදිරිපත් කළ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කෙරේ. ඒ යටතේ,

  1. ජනමත විචාරණයකින් සම්මත කරනු ලබන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් විවිධ ජාතිකත්වයන්ට වෙනස් ලෙස සැලකීමත් සියලුම ජාතිවාදයනුත් විවිධ ජන කණ්ඩායම් සහ ආගම් අතර අසමගිය සහ ගැටුම් නිර්මාණය වීමටත් හේතුවන සියලු ක්‍රියාවන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම තහනම් කෙරේ. එමෙන්ම සියලු ජන කණ්ඩායම්වල සමාන අයිතීන් ව්‍යවස්ථාවෙන් තහවුරු කෙරේ.

  2. විවිධ හේතූන් මත පීඩාවට පත් ජන කණ්ඩායම්, එනම් ජාතිකත්ව හෝ ආගමික පීඩනයට ලක්වූ ජන කණ්ඩායම් හා ධනේශ්වර සංවර්ධනයේ ඉතාමත් පිටුපසින් සිටින ප්‍රදේශ ඉලක්ක කර ගනිමින් ඒවායේ ආර්ථික සංවර්ධනය, පරිපාලන ගැටලු විසඳීම, සංස්කෘතිකමය අනන්‍යතාව ආරක්ෂා කිරීම හා පවත්වාගෙන යාම අරමුණු කරගත් විශේෂ පාලන ව්‍යුහයක් ලෙස "ජනතා සභා" ස්ථාපිත කෙරේ.

- ජනතා සභා පිහිටුවන ප්‍රදේශ තීරණය කිරීම සඳහා විද්වතුන්ගෙන්, පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂ නියෝජිතයින්ගෙන්, පරිපාලන නිලධාරින්ගෙන් සමන්විත "ජනතා සභා සීමා නිර්ණය කිරීමේ කොමිසමක්" පත් කෙරේ.
- ජනතා සභා මහජන ඡන්දයෙන් පත් කරන අතර ඒවායේ වලංගු කාල සීමාව වසර 05ක් විය යුතුය. නියමිත කාලයට කලින් ජනතා සභා විසුරුවා නොහැරේ.
- මෙම ජනතා සභාවලින් එක් නියෝජිතයෙක් නිල බලයෙන් පාර්ලිමේන්තුවට පත් කිරීමේ අයිතිය ජනතා සභාවට ලැබේ.
- ජනතා සභාවේ ආර්ථික, සමාජ සංස්කෘතික වර්ධනයට අදාල සියලු කටයුතු සඳහා අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ප්‍රමාණවත් ලෙස ඒවාට ලබා දිය යුතුය.

3. භාෂාවන් නිසා ඇතිවන පීඩාවන් අහෝසි කිරීම සඳහා ත්‍රෛභාෂා ප්‍රතිපත්තිය පිළිගනිමින් ලංකාවේ පුරවැසියන් භාවිතා කරන සිංහල, දෙමළ, ඉංග්‍රිසි භාෂා ජාතික භාෂා ලෙස ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මගින් ස්ථාපිත කර එකී ඕනෑම භාෂාවකින් කටයුතු කිරීමට පුරවැසියන්ට ඇති අයිතිය පිළිගැනේ. ඒ අනුව කටයුතු කෙරේ. එහිදී විශේෂයෙන්ම උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල උසාවි, පොලිස් ස්ථාන, රජයේ කාර්යාල වැනි සිවිල් පාලනයට අදාල ආයතනවල හා සෞඛ්‍ය, ගමනාගමනය වැනි පොදු සේවා සඳහා දෙමළ භාෂාවෙන් කටයුතු කරන නිලධාරීන් හා රජයේ සේවකයින් පත් කිරීමට පියවර ගැනේ.

- ඒ යටතේ අධිකරණයේ, පොලීසියේ, ආරක්ෂක හමුදා හා රාජ්‍ය ආයතනවල සේවය කරන සියලු දෙනාට ජාතික භාෂා ඉගැන්වීමට විශේෂ වැඩපිළිවෙළක් සකස් කරන අතර ඒ සඳහා ඔවුන් දිරිගැන්වීමද අවශ්‍ය සියලු පහසුකම් ලබා දීමද සිදු කෙරේ.

4. ජාතිකත්ව ආගමික හෝ වෙනත් කිසිදු වෙනස්කමක් මත කිසිදු පුරවැසියකු නින්දාවට, අපහාසයට, අසාධාරණයට පත් කිරීම සපුරා තහනම් කෙරෙන අතර එවැනි තත්වයන්ට පාත්‍රවන සියලු දෙනාගේ පැමිණිලි භාර ගැනීමට, ඒවා පරීක්ෂණය කිරීමට හා ඒ පිළිබඳ චූදිතයින් අධිකරණයට පැමිණවීමට බලය ඇති "වෙනස්කම් වැළැක්වීමේ කොමිෂන් සභාවක්" (Commission Against Discrimination) ස්ථාපිත කෙරේ.

5. උතුරේ පැවති තිස් අවුරුදු යුද්ධයෙන් විවිධාකාරයෙන් පීඩාවට පත්වූ හා හානි සිදුවූ සැමට තම දුක් ගැනවිලි ඉදිරිපත් කිරීමටත් ඒවා පිළිබඳ සත්‍ය සොයා බලා පීඩාවට පත්වූවන්ට සහන ලබා දීමටත් ජාතික සමගිය ප්‍රවර්ධනය කිරීමේ හා ප්‍රතිසන්ධානගත කිරීමේ පනතක් මගින් සත්‍ය විමර්ශන කොමිසමක් (Truth and Reconciliation Commission) පත් කෙරේ.

6. යුද්ධය නිසා නිවාස අහිමි වූ ජනතාවට සුදුසු ස්ථිර නිවාසයක් ඉදිකර ගැනීමට පසුගිය රජයන් විසින් ලබා දුන් මුදල් ප්‍රමාණවත් නොවන බැවින් නිවාස අහිමි වූ සැමට රු. ලක්ෂ 05ක නිවාස ආධාරයක් ලබා දේ.

7. යුද්ධය නිසා ඉන්දියාවට ගොස් සරණාගතයින් බවට පත්ව සිටින ශ්‍රී ලාංකික පුරවැසියන් මෙරට ගෙන්වා ගැනීමට හා පැමිණ ජීවත්වීම සඳහා අවශ්‍ය පහසුකම් සැලැස්වීමේ ව්‍යාපෘතියක් කඩිනමින් ආරම්භ කෙරේ.

8. උතුරේ මතුව ඇති ඉඩම් ප්‍රශ්නය ඉතා බරපතළ හා සංවේදී ප්‍රශ්නයක්ව ඇති නිසා වහාම එය විසඳීමට පියවර ගැනේ. ඒ සඳහා උතුරේ ඉඩම් අහිමිවූවන්ගේ ගැටලු හඳුනා ගැනීම සඳහාත් ඉඩම්වල මුල් අයිතිකරුවන් හඳුනාගෙන තහවුරු කර එම ඉඩම් ඔවුන්ට භාර දීම සඳහාත් අත්‍යවශ්‍ය හේතූන් මත දැනටමත් රජයට පවරා ගෙන ඇති ඉඩම් සඳහා ප්‍රමාණවත් වන්දි මුදල් ලබා දීම හෝ අයිතිකරුවන්ගේ

කැමැත්ත අනුව විකල්ප ඉඩම් ලබා දීම සඳහාත් ජනතා නියෝජිතයින්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා ඉඩම් අමාත්‍යාංශ නිලධාරීන්ගෙන් සමන්විත පූර්ණ බලැති ඉඩම් කොමිසමක් පිහිටුවා එමගින් ඉඩම් ගැටලුව විසඳීමට කඩිනමින් පියවර ගැනේ.

9. විවිධ ජාතිකත්වයන්ගේ අයිතීන් ව්‍යවස්ථාව මගින්ම තහවුරු කිරීමට පියවර ගැනීමත් ඔවුන් මුහුණපාන ගැටලුවලට ක්ෂණික විසඳුම් ලබා දීමත් පරිපාලන ව්‍යුහයක් ලෙස ජනතා සභා පිහිටුවීමත් සමග ජාතික ගැටලුව විසඳීමට කිසිදු ලෙසකින් හේතුකාරක නොවන හා දැනටමත් අසාර්ථකව ඇති පළාත් සභා ක්‍රමය අහෝසි වී යාමට ඉඩ සැලැස්වේ.

# 05. විදේශ සබඳතා

මෙතෙක් කාලයක් බලයට පත්වූ ආණ්ඩුවල විදේශ ප්‍රතිපත්ති සකස් වූයේ අධිරාජ්‍යගැති හා බටහිරගැති බව පදනම් කර ගෙනය. ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වය හා ස්වෛරීත්වය ගැන නොතැකූ පාලකයින් විසින් ශ්‍රී ලංකාව ලෝකයට පරාධීන හා කොන්වූ රාජ්‍යයක් බවට පත් කර තිබේ.

බලයට පත් විවිධ පාලක කණ්ඩායම්වල පුද්ගලික රුචි අරුචිකම් මත විදේශ ප්‍රතිපත්තිය තීරණය කිරීම හේතුවෙන් වෙනත් ජාතීන් අතර අප රටේ අභිමානය හෑල්ලුවට ලක්වී ඇත. ආර්ථික වශයෙන් නව යටත්විජිතවාදයේ ගොදුරක් බවට පත් කිරීමට අමතරව දේශපාලනික වශයෙන් බලවත් රාජ්‍යයන්ගේ අතපෙවීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කර ඇත.

## විසඳුම

ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය ආරක්ෂා කරන, අධිරාජ්‍ය විරෝධී, යටත්විජිත විරෝධී මෙන්ම සියලු රටවල් සමග සාමකාමී සහජීවනය සහ සහයෝගීතාව වර්ධනය කර ගැනීම මත පදනම් වූ විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම ඇරඹේ.

## ක්‍රියාමාර්ග

- දකුණු ආසියානු කලාපීය සහයෝගීතාව වර්ධනය කර ගැනීම සඳහා ප්‍රමුඛතාවය ලබා දේ.
- විදේශ සේවය ආයතනගත වෙනස්කම්වලට භාජනය කරන අතර අකාර්යක්ෂමතාව, දේශපාලන පත්වීම් සහ නාස්තිය වළක්වා විදේශ සේවයේ වැදගත්බව හා වගකීම් සහගතබව ආරක්ෂා වන පරිදි විදේශ සේවාව ප්‍රතිසංවිධානය කෙරේ.

- විදේශ සේවයේ නියුතු නිලධාරීන් සඳහා වෙනස්වන ජාතික හා ජාත්‍යන්තර තත්වයන්ද නව ජාතික දේශපාලන හා ආර්ථික වුවමනා පිළිබඳවද දැනුම සහ අවබෝධය ලබා දෙන දේශීය සහ ජාත්‍යන්තර විද්වතුන්ගෙන් සමන්විත විදේශ සේවා ඇකඩමියක් ආරම්භ කෙරේ.
- සමාජවාදී රටවල් සමග සමීප සම්බන්ධතාවන් පවත්වා ගෙන යන අතර අධිරාජ්‍ය විරෝධී සහ මානව ප්‍රගතිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යායාමයන් සමඟ සහයෝගයෙන් කටයුතු කෙරේ.
- අවශ්‍ය සමාලෝචනයන් සිදුකර විදේශගත ශ්‍රී ලාංකිකයින් වැඩිපුර සිටින (උදාහරණයක් ලෙස සයිප්‍රසය) රාජ්‍යයන් තුළ නව ශ්‍රී ලංකා තානාපති කාර්යාල ආරම්භ කිරීමට පියවර ගැනේ.

# උසස්
# මානව සම්පතක්

අප රටේ සංවර්ධන උපාය මාර්ගයේ කේන්ද්‍රය කරගත යුත්තේ මානව සම්පත් සංවර්ධනයයි. 1948 සිට දශක 07කට ආසන්න කාලයක් පුරා රට වැරදි හා අරාජික ආර්ථික උපායමාර්ගයක ගමන් කරවීම හේතුවෙන් ලෝක හා කලාපීය ආර්ථිකයන් තුළ ඒ ඒ මොහොතේදී අත්පත් කරගත යුතුව තිබූ කාර්මික හා කෘෂිකාර්මික නිෂ්පාදනයේ ජයග්‍රාහී අවස්ථා රටේ ජනතාවට අහිමි වී ඇත.

අනාගත ලෝකය තුළ උසස් මට්ටමේ ශිල්පීය පදනමක් මත භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සංවිධානය කෙරෙන තත්වයක් නිර්මාණය වී ඇත. ශ්‍රී ලංකාවටද ගෝලීය වෙළඳපොළට මෙන්ම දේශීය වෙළඳපොළට භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේදී ඉහළ මට්ටමේ තාක්ෂණවේදීන් හා වෘත්තීයවේදීන් විශාල වශයෙන් අවශ්‍ය වන්නේය.

රටේ ආර්ථික සංවර්ධනයේ ප්‍රධාන උපාය මාර්ගය උසස් මානව සම්පත වන බැවින් ඊට අදාල අධ්‍යාපනය, සෞඛ්‍යය, ක්‍රීඩා සහ ව්‍යායාම, විද්‍යාත්මක පර්යේෂණ හා වෘත්තීය පුහුණුව ඇතුළු විවිධ ක්ෂේත්‍ර පුළුල් කිරීම හා නවීකරණය කිරීම සිදු කෙරේ. ඒ සඳහා කරනු ලබන වියදම් සහ දරන උත්සාහයන් ආර්ථික වශයෙන් අනිවාර්ය ප්‍රතිඵල ලැබෙන රාජ්‍ය ආයෝජනයන් ලෙස සැලකේ.

## 01. අධ්‍යාපනය

මෙතෙක් යම් ප්‍රමාණයකට හෝ පැවති නිදහස් අධ්‍යාපනය අහෝසි කරමින් රජය ක්‍රමානුකූලව අධ්‍යාපනයේ වගකීමෙන් ඉවත් වෙමින් සිටී. දැනටමත් රජය අධ්‍යාපනය සඳහා වෙන් කරන්නේ දළ දේශීය නිෂ්පාදනයෙන් 1.27% වැනි ඉතා සුළු මුදලකි. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ජාතික ප්‍රතිපත්තියක් නොමැතිව අරාජිකවී දෙමව්පියන්ටත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටත් පුද්ගලිකව අධික වියදම් දැරීමට සිදුවන තත්වය දක්වා වෙළඳපළකරණය කර ඇත.

පාසැල් යා යුතු වයසේ දරුවන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් පාසල්වලට ඇතුළත් නොවන අතර අධ්‍යාපනය ලබන්නන්ගෙන් විශාල ප්‍රමාණයකට අතරමඟදී අධ්‍යාපනය හැර යාමට සිදුවී ඇත. වසරක් පාසා නව දරු උපත් 360,000 සිදුවන අතර මෙයින් 60,000ක්

10වැනි ශ්‍රේණිය හෝ සම්පූර්ණ නොකර පාසැල් හැර යති. උසස් පෙළ හැදෑරීමේ අවස්ථාව ලැබෙන්නේ ලක්ෂ දෙකක පමණ පිරිසකටය. වාර්ෂිකව විශ්වවිද්‍යාල සඳහා බඳවා ගනු ලබන්නේ උපරිම 30,000ක් පමණ වූ සිසු සිසුවියන් සංඛ්‍යාවකි.

වෙනස්වන සමාජ-ආර්ථික වුවමනාවන්ට අනුව අධ්‍යාපනය නවීකරණය නොවීම සහ අධ්‍යාපනයේ පැරණි නොගැලපෙන ක්‍රමයන් වෙනුවට නව විද්‍යාත්මක ක්‍රමයන් එකතු නොකිරීම බරපතළ ගැටලුවකි. ගොඩනැගිලි, උපකරණ ආදී භෞතික සම්පත්වල සහ ගුරුවරුන්ගේ දැඩි හිඟයක් පවතී. තිබෙන සීමිත සම්පත් ප්‍රමාණය පවා බෙදී යාමේ විෂමතාව හේතුවෙන් ග්‍රාමීය ප්‍රදේශවල අධ්‍යාපනය බරපතළ අර්බුදයකට ලක්ව තිබේ. සම්පත් හිඟය සහ තිබෙන සම්පත් බෙදී යාමේ විෂමතාවයත්, පාසැලට ඇතුල් වීමට අසාධාරණ නිර්ණායකයන් නිර්දේශ කිරීමත් හේතුවෙන් ළමුන්ට නිදහසේ ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය ලැබීමට ඇති මූලික අයිතිය උල්ලංඝනය කර ඇත.

ලෝක බැංකු නිර්දේශවලට අවනත වෙමින් තෘතීයික අධ්‍යාපනය සඳහා වියදම් අඩු කර පෞද්ගලික අංශයට ආධාර අනුබල දීම පැවති රජයන්ගේ ප්‍රතිපත්තියක් වීම හේතුවෙන් තෘතීයික අධ්‍යාපනයද බරපතළ අර්බුදයකට ලක්ව ඇත.

## විසඳුම

සියලු දරුවන්ට සහ වැඩිහිටියන්ට අධ්‍යාපනය ලැබීමේ අයිතිය මූලික මානව අයිතිවාසිකමක් ලෙස පිළිගන්නා අතර වාසය කරන ප්‍රදේශය, ජාති, ආගම්, කුල, පංති හෝ වෙනත් ඕනෑම ආකාරයක භේදයකින් තොරව සියල්ලන්ටම සමාන අධ්‍යාපන අවස්ථා ලැබෙන පරිදි අධ්‍යාපනය මුළුමනින්ම රජයේ වගකීමක් බවට පත්කෙරේ.

## ක්‍රියාමාර්ග

- අධ්‍යාපනයේ සම අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කෙරේ. සෑම පුද්ගලයකුටම පුද්ගල දක්ෂතා සහ ජාතික අවශ්‍යතා මත පදනම්ව අඛණ්ඩ අධ්‍යාපනයක්, පුහුණුවක් සහ උසස් අධ්‍යාපනයක් ලබා දීම රජය මගින් තහවුරු කෙරේ.
- අධ්‍යාපනය සඳහා කරනු ලබන වියදම අවම වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් 06%ක් ලෙස වෙන්කෙරේ. මෙම ප්‍රතිපාදන අධ්‍යාපනයේ සම අයිතියත් එහි ගුණාත්මකභාවයත් අධ්‍යාපනයට අදාළ යටිතල පහසුකම් වර්ධනය කිරීමත් අරමුණු කරගනිමින් යෙදවේ.
- ඒ ඒ ක්ෂේත්‍රවල විෂය ප්‍රවීණයින්ගෙන් සහ විවිධ වෘත්තීන්හි විශේෂඥයින්ගෙන් සැදුම් ලත් රාජ්‍ය අධ්‍යාපන කොමිෂන් සභාවක් මගින් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් වසරක් තුළ සකස් කිරීම හා එය අඛණ්ඩව යාවත්කාලීන කිරීම සිදු කෙරේ.

- පෙර පාසැල් අධ්‍යාපනය රජයේ වගකීමක් කොට සලකා ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියේ අත්‍යවශ්‍ය කොටසක් බවට පත්කරන අතර විද්‍යාත්මක පදනමක් මත ඒවා ප්‍රමිතිකරණය කර ගුරුවරියන් දැනුමෙන් සහ කුසලතාවන්ගෙන් පොහොසත් කිරීමටත් සියලු පෙර පාසැල් අත්‍යවශ්‍ය පහසුකම්වලින් සංවර්ධනය කිරීමටත් පියවර ගැනේ.
- මෙම ක්‍රියාවලිය සම්පූර්ණ වනතෙක් ක්ෂණික අවශ්‍යතාවයක් ලෙස සලකා පෙර පාසල් සංවර්ධනය කිරීම සඳහා ලක්ෂ 03ක ණය මුදලක් ලබාදේ.
- පෙර පාසැල් අධ්‍යාපනයද ඇතුළු අධ්‍යාපනය සඳහාම වෙන්වූ රූපවාහිනී නාලිකාවක් ආරම්භ කෙරේ.
- චන්ද්‍රිකා තාක්ෂණය යොදා ගනිමින් ගුරු පුහුණු වැඩසටහන් පෙර පාසැල් ගුරුවරියන් අතරට ගෙන යාමත් ඔවුන් ඇගයීම පිණිස විභාග ක්‍රමයක් සකස් කර සහතික පත් පිරිනැමීමත් අදාල විභාගයෙන් සමත්වන සහතිකලාභී ගුරුවරියන්ට ස්ථිර පත්වීම ලබා දීමත් දිරි දීමනාවක් ලෙස රු. ලක්ෂ 02ක මුදලක් පිරිනැමීමත් සිදු කෙරේ.
- පළාත් සභා පාසල්, ජාතික පාසැල්, සපිරි පාසැල්, නවෝද්‍යා පාසැල් ආදී විවිධාකාරයේ අවිද්‍යාත්මක සහ දේශපාලනික අරමුණු මත සිදු කරනු ලැබූ සහ අනවශ්‍ය තරඟකාරීත්වයකට මගපාදා ඇති සියලු බෙදීම් අහෝසි කෙරේ.
- ප්‍රාථමික ශ්‍රේණිවලට ළමුන් ඇතුළත් කිරීමට අදාල නිර්ණායක හැකිතාක් සරල කරන අතර ප්‍රාථමික අධ්‍යාපනය ලබා ගත හැකි ආකාරයට සියලු පාසැල්වල සමාන සම්පත් ලබා දීම තුළින් ප්‍රාථමික අංශයට ළමුන් ඇතුළත් කිරීමේ තරඟකාරීත්වය ඉවත් කෙරේ.
- ප්‍රාථමික පාසැල් උසස් ප්‍රමිතියට පත් කිරීමේ ප්‍රධාන අරමුණ ඇතිව දැනට ඇති ප්‍රාථමික පාසැල්වලින් වසරකට පාසැල් 500 බැගින් තෝරා ගෙන පාසැල් අතර ඇති දුර, දරුවන්ගේ අධ්‍යාපනික සාධනය, යන නිර්ණායක මත වසර 05 තුළදී ප්‍රාථමික පාසැල් 2500ක් සඳහා පරිඝනක මධ්‍යස්ථානයක්, ක්‍රීඩා සංකීර්ණයක්, ළමුන් 250කට පහසුකම් සහිත නව දෙමහල් ගොඩනැගිල්ලක්, ඉහළ මට්ටමමේ වැසිකිළි පද්ධතියක් සහ දන්ත හා ළමා සෞඛ්‍ය සායනයක් ලබා දේ.
- සිසු දරුවන් අධ්‍යාපනයට ආකර්ෂණය කරගත හැකි සහ විවිධ විෂයයන් අවබෝධ කර දීම පහසු කරන (රට තුළ සහ විදේශයන්හි) භාවිතාවන විශේෂ ක්‍රමවේදයන් (Best Practices - උදා: ගණිතාගාර වැනි) හඳුනාගෙන ඒවා දිවයින පුරා ප්‍රචලිත කිරීමට ප්‍රමුඛතාව ලබාදේ.

- නිපුණතාවන්ට බලනොපාන පරිදි ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන්ට නිවසේදී හෝ බාහිර පන්ති මගින් කිරීමට සිදුවන අධ්‍යාපන කටයුතු අවමකර දරුවන්ගේ සමාජ ජීවිතය ඉහළ නැංවීමටත් දෙමව්පියන්ට විඳීමට සිදුවන අවහිරතා අවම කිරීමටත් පියවර ගැනේ. ඒ යටතේ 1, 2, 3 වසරවල දරුවන්ට ගෙදර වැඩ (Home work) ලබා දීම නතර කිරීමට යෝජනා කෙරේ.
- පාසල් අධ්‍යාපනය ලබන සියලුම දරුවන්ට නොමිලේ පාසැල් පොත්, නිල ඇඳුම් සහ පෝෂ්‍යදායක දිවා ආහාරයක් සැපයේ.
- සෑම සරසවි සිසුවකුටම රජය මගින් නොමිලේ ලැප්ටොප් පරිඝනකයක් ලබා දේ.
- නවීන අධ්‍යාපනයේ මූලික ලක්ෂණයක් වී ඇති සෑම සිසුවකුටම පරිඝනකයක් ලබාදීම හා පංති කාමර ඩිජිටල් තාක්ෂණයෙන් යුත් ඒවා බවට පත් කිරීම අනාගතය සඳහා අත්‍යාවශ්‍ය නවීකරණයකි. මේ සඳහා පළමු වසර තුළ පාසල් 100ක පංති කාමර 500ක්ද වසර පහ තුළදී පාසැල් 1000ක පංති කාමර 5000ක් ඩිජිටල්කරණය කිරීමට කටයුතු කෙරේ.
- සියලු පෙළ පොත් අන්තර්ජාලය හරහා පරිශීලනය කිරීමට පහසුකම් සලසා දේ.
- ප්‍රාථමික ශ්‍රේණිවල දරුවන්ගේ පෝෂණ ඌණතා හා වැරදි ආහාර පුරුදු හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය පිළියම් යෙදීමට සහ අවශ්‍ය මඟපෙන්වීම් කිරීමට සෑම පාසැලකටම පෝෂණවේදියෙකුගේ සේවය ලබා දේ.
- සෞඛ්‍ය සහ ශාරීරික සුවතා අධ්‍යාපනය අනිවාර්ය කර ව්‍යායාම සහ ක්‍රීඩා පහසුකම් ඇති කෙරේ.
- දරුවන්ගේ කියවීම දියුණු කිරීම සඳහා "ප්‍රබුද්ධ පාඨක සමාජ" පිහිටුවා පාසැල් දරුවන් අතර ඊට අදාල ජාතික තරඟාවලියක් ආරම්භ කෙරේ.
- පාසැල් ප්‍රවාහන සේවා විධිමත් සහ ආරක්ෂාකාරී කිරීම සඳහා නීතිමය තත්වයන් සහ තාක්ෂණික සහායයන් ලබා දීමට කටයුතු කෙරේ.
- පාසැල් සිසුන් ප්‍රවාහනය සඳහා යොදා ගන්නා බස් රථ සහ වෑන් රථ ආනයන බද්දෙන් නිදහස් කෙරේ.
- දරුවන්ගේ මානසික සුවතාවය, වයසත් සමග සිදුවන ශාරීරික සහ මානසික වෙනස්වීම්, පාරිසරික හා පවුල් තුළ සිදුවන ගැටලු හේතුවෙන් දරුවන් මුහුණ දෙන මානසික ගැටලු සඳහා අවශ්‍ය උපදේශනය ලබා දීමට සෑම පාසැලක් සඳහාම පුහුණුව ලත් එක් ගුරුවරයකු හෝ පත් කිරීම හා සිසුන්ගේ මානසික ගැටලු නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සහ අවශ්‍යතාවය පරිදි ප්‍රතිකාර සඳහා යොමු කිරීම සඳහා පියවර ගැනේ.

- සාමාන්‍ය පෙළ විභාගයෙන් පසු නව විෂය ධාරාවන් 09ක් හඳුන්වා දෙන අතර ඉන් තමන් කැමති තෝරාගත් විෂය ධාරාවක් ඔස්සේ ඉදිරියට යාමට සිසු දරුවන්ට අවස්ථාව සලසා දේ. ඒ අනුව (i)විද්‍යා විෂය ධාරාව, (ii)ගණිත විෂය ධාරාව, (iii)සමාජ විද්‍යා විෂය ධාරාව, (iv)වාණිජ විෂය ධාරාව, (v)තාක්ෂණ විෂය ධාරාව, (vi)පරිඝනක විෂය ධාරාව, (vii)ව්‍යාපාර විෂය ධාරාව, (viii)සෞන්දර්ය විෂය ධාරාව සහ (ix)ක්‍රීඩා විෂය ධාරාව ලෙස විෂය ධාරාවන් නවයක් හඳුන්වා දේ.
- පාසල්වල ජාතික භාෂාවන් තුනෙන්ම (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි) විෂයයන් ඉගැන්වීමට අවශ්‍ය සියලු පහසුකම් සැපයේ.
- ගුරු හිඟය සහ ගුරුවරුන්ගේ කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කර ගුරු හිඟය සහ අකාර්යක්ෂමතාව නැති කිරීමට පියවර ගැනේ. ඒ සඳහා ආරම්භයක් ලෙස දුෂ්කර පාසැල්වල සේවය කරන ගුරුවරුන්ට වැටුපට අමතරව මූලික වැටුපෙන් 50%ක දීමනාවක් ලබා දේ.
- ගුරු වෘත්තිය තෘප්තිමත්ව සහ ආත්ම ගරුත්වයක් ඇති සේවාවක් බවට පත් කිරීම සඳහා ගුරුභවතුන් පොදුවේ මුහුණ දෙන නිල නිවාස, මාරු කිරීම්, වැටුප්, උසස්වීම්, අඛණ්ඩ අධ්‍යාපනය, ණය හා සුභසාධන පහසුකම්, වැඩ හා වගකීම් බෙදී යාමේ විෂමතාවන් වැනි දැවෙන වෘත්තීය ගැටලු සම්බන්ධයෙන් සොයා බලා අදාළ වන පරිදි වෙනත් රාජ්‍ය අංශ සමගද එක්ව ඒවා විසඳීම සඳහා වෙන්වූ විශේෂිත ඒකකයක් අධ්‍යාපන අමාත්‍යාංශය තුළ ස්ථාපිත කෙරේ.
- උපාධි, පශ්චාත් උපාධි ඇතුළු වැඩිදුර අධ්‍යාපනය සහ විශේෂයෙන්ම පර්යේෂණ කටයුතු සඳහා ගුරුවරුන් පෙළඹවීමට කටයුතු කරනු ලැබේ. ඒ යටතේ වසරකට ගුරුවරුන් 1000කට පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා අමාත්‍යාංශයෙන් මූල්‍ය අනුග්‍රහය ලබා දේ.
- දැනට පවතින ගුරු පුහුණු විදුහල් 18, ගුරුවරුන් පුහුණු කිරීමේ විශ්වවිද්‍යාල බවට පත් කර වසරකට ගුරු වෘත්තිය වෙනුවෙන් කරනු ලබන බඳවා ගැනීම් සංඛ්‍යාව 3500 සිට 6000 දක්වා වැඩි කිරීමට පියවර ගැනේ.
- උසස් පෙළ සමත්වන සියලු සිසුන්ට විශ්වවිද්‍යාලයට ඇතුල් වීමේ පහසුකම ලබා දීම ඉලක්ක කර ගනිමින් විශ්වවිද්‍යාල පද්ධතිය පුළුල් කෙරේ.
- විශ්වවිද්‍යාල බුද්ධියේ කේන්ද්‍රස්ථානයන් ලෙස සලකන අතර උසස් තත්වයේ පර්යේෂණ, බුද්ධිමය සංවාද, ඒවායේ ජනනය වන දැනුම සහ තාක්ෂණය බෙදා හැරීමට රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සම්බන්ධ කරගත් ක්‍රමවේදයක් සකස්කර ක්‍රියාවට නැංවේ.
- සියලු සරසවි සහ උසස් අධ්‍යාපන ආයතනවල ආචාර්යවරුන්ට හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයට සහ සිසුන්ට නේවාසික පහසුකම් ලබා දීමට කටයුතු කෙරේ.

- පශ්චාත් උපාධි ලබා දීම සඳහා දැනට පවතින අක්‍රමවත් විධික්‍රම සියල්ල මධ්‍යගත කර ජාතික පශ්චාත් උපාධි ආයතනයක් ස්ථාපිත කෙරේ.
- සරසවි ආචාර්ය හිඟයට හා බුද්ධිගලනයට විසඳුමක් වශයෙනුත් වැඩි පිරිසක් සරසවි ආචාර්යවරුන් ලෙස බඳවා ගැනීමේ අරමුණිනුත් වාර්ෂිකව 10%කින් වැඩිවන පරිදි ස්ථිර කථිකාචාර්යවරයකුගේ ආරම්භක වැටුප රුපියල් 100,000 බවට පත් කෙරේ.
- පශ්චාත් උපාධි සම්පූර්ණ කර වෙනත් රැකියාවල නිරත උගතුන් සරසවි පද්ධතියට එක් කර ගැනීම සඳහා ඔවුන් දිරිමත් කිරීමේ වැඩසටහනක් සකස් කෙරේ.
- ශ්‍රී ලංකාවේ සරසවිවල වාර්ෂිකව ඉහළම සාමාර්ථ ලබන සිසුන් 500කට විදේශීය දියුණු විශ්වවිද්‍යාල සමග ඇතිකර ගන්නා රාජ්‍ය ගිවිසුම් මගින් පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව පිරිනැමේ.

# 02. සෞඛ්‍යය

පසුගිය සියවසේ මුල්භාගයේ මෙරට ක්‍රියාත්මකවූ සෞඛ්‍යය සහ අධ්‍යාපනය ඇතුළු සමාජ සුභසාධන ප්‍රතිපත්තීන්ගේ ප්‍රතිඵලයක් ලෙස එවකට බරපතළ සෞඛ්‍ය ගැටලු ලෙස පැවති බෝවන රෝග, මාතෘ හා ළමා රෝගාබාධ මෙන්ම පෝෂණ ඌණතා ජයගෙන පුරවැසියන්ගේ ආයු කාලය දශක දෙකකින් පමණ ඉහළ දැමීමට හැකියාව ලැබිණි. තුන්වන ලෝකයේ වෙනත් බොහෝ රටවල් අතර අපගේ සෞඛ්‍ය සේවාවට ඉහළ පිළිගැනීමක් ලැබීමට හේතුවූයේ එම සේවාව නිදහස් සෞඛ්‍ය සේවාවක් ලෙස විධිමත්ව පවත්වා ගනිමින් වඩාත් ජනතාවට සමීප සේවාවක් ලෙස පවත්වා ගෙන ගිය බැවිනි. එහෙත් පසුගිය දශක කීපය තුළ සෞඛ්‍ය සේවාවේත් සෞඛ්‍ය අවශ්‍යතාවන්ගේත් මූලික වෙනස්වීම් කීපයක් සිදුවූ අතර ඒම වෙනස්වීම්වල අවසාන ප්‍රතිඵලය වී ඇත්තේ, අප රටේ සෞඛ්‍ය සේවාවට රටේ මහජනතාවගේ මෙන්ම විදේශයන්හි තිබූ විශ්වාසනීයත්වය පළුදු වීම සහ වර්තමාන සෞඛ්‍ය අවශ්‍යතා ඉටු කිරීමට නොහැකි දුර්වල තත්වයට එම සේවාව පත්වීමය.

අද වන විට රටේ ජනගහනය වැඩිවී ඇත. වැඩිහිටි ජනගහනය වැඩිවන පරිදි ජන සංයුතිය වෙනස්වී ඇත. රෝගාබාධ රටාව වෙනස් වී ඇත. ගෝලීය වශයෙන් ගත් කළ වෛද්‍ය විද්‍යාව තාක්ෂණික ලෙස දියුණු වී ඇතත් ප්‍රතිජීවක ප්‍රතිරෝධය, දේශගුණ විපර්යාස, ගෝලීයව පැතිර යන ආසාදන වැනි තාක්ෂණික අභියෝග බරපතළ වී ඇත. ජනතාවගේ සෞඛ්‍ය පිළිබඳ අපේක්ෂාවන් ඉහළ ගොස් ඇත. ඒ අතර පැවති පාලනයන් විසින් අපගේ සෞඛ්‍ය සේවාවද අපට නොදැනීම වෙනස් කරනු ලැබ ඇත. 1980 දශකය පමණ වනතෙක් මුළුමනින්ම රජයේ වගකීම මත ක්‍රියාත්මකවූ සෞඛ්‍ය සේවාවෙන් රජය ක්‍රමයෙන් ඉවත්වී හෝ ප්‍රමාණවත් පරිදි මැදිහත් නොවී එම සේවාව වෙළඳපොළට භාරදෙමින් සිටියි.

සෞඛ්‍ය සේවාව සඳහා වියදම ලෝකයේ සාමාන්‍ය අගය දළ දේශීය නිෂ්පාදිතයෙන් 9.1% කි. අප රටේ එය 3.3% කි. ලෝකයේ සමස්තයක් ලෙස ගත්කල රජයන් විසින් සෞඛ්‍යයට කරන වියදම සමස්ත සෞඛ්‍ය වියදමින් 57% කි. එහෙත් අප රටේ රජය දරන වියදම සමස්ත සෞඛ්‍ය වියදමින් 39%කි. 61%ක් වූ ඉතිරිය මහජනතාව පෞද්ගලිකව වියදම් කරයි. රජය එක් පුරවැසියකුගේ සෞඛ්‍යය වෙනුවෙන් වෙන් කරන මුදල ඇතැම් ධනවත් රටවල ඇ.ඩොලර් 8000ක් පමණ වන අතර ලෝකයේ සමාන්‍යයක් ලෙස ඇ.ඩොලර් 615ක් පමණ වේ. ශ්‍රී ලංකා ආණ්ඩුව වෙන් කරන්නේ ඇ.ඩොලර් 34කට ආසන්න මුදලකි. එහි ප්‍රතිඵලයක් ලෙස වෛද්‍යවරුන් ඇතුළු සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේත් ඖෂධ ඇතුළු භෞතික සම්පත්වලත් දැඩි හිඟයක් ඇතිව තිබේ. රාජ්‍ය සේවාවේ අඩු වැටුපත් අතෘප්තිමත් සේවා තත්ත්වයනුත් හේතුවෙන් බොහෝ පුහුණු සෞඛ්‍ය වෘත්තිකයෝ රට හැර යමින් සිටිති. මෙරට උපාධිධාරී වෛද්‍යවරුන්ගෙන් 50% ක් පමණ රට හැර ගොස් ඇත.

අවසාන ප්‍රතිඵලය ලෙස ජනතාව අත්විඳිමින් සිටින්නේ තමාත් දරු දැරියනුත් කවර මොහොතක හෝ යම් වසංගතයක, රෝගයක හෝ අනතුරක ගොදුරක් බවට පත්වනු ඇතැයිද එසේ වුවහොත් නිසි ප්‍රතිකාරයක් ලැබේද කොතරම් මුදලක් වියදම් කිරීමට සිදුවේදැයි යන නිරන්තර සැකයෙන් හා බියෙන් ජීවත්වීමය. ඩෙංගු, ඒඩ්ස්, මී උණ වැනි බෝවන රෝගවලට අමතරව ඉන්ෆ්ලුවෙන්සා වැනි වසංගතයන්ද පැතිරෙමින් පවතී. වකුගඩු රෝග, දියවැඩියාව, පිළිකා, හෘදයාබාධ, අංශභාගය, මානසික ආබාධ, විෂවීම්, පුද්ගල ගැටුම්, අනතුරු වැනි බෝ නොවන ගණයේ රෝගී තත්වයන් ව්‍යාප්ත වීම වැඩිවීමත් ඒවායින් මියයන සහ ආබාධිත වන සංඛ්‍යාව ඉහළ යාමෙනුත් පෙන්නුම් කරන්නේ, ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ සෞඛ්‍ය තත්වය ඉතා අනතුරුදායක මට්ටමක පවතින බවත් සෞඛ්‍යයේ ආරක්ෂාවට පවතින යාන්ත්‍රණයන් ඉතා දුර්වල බවත්ය.

## විසඳුම

සියලු පුරවැසියන්ගේ සෞඛ්‍යාරක්ෂාව ජාතික මට්ටමේ ප්‍රමුඛ කාර්යයක් විය යුතු අතර සෞඛ්‍යය ආරක්ෂා කිරීමේ වගකීම වෙළඳපළට භාර නොදී මුළුමනින්ම රජය විසින් භාරගැනේ. රජයේ පූර්ණ වගකීමෙන් සහ මැදිහත්වීමෙන් සෞඛ්‍ය සේවාව පවත්වාගෙන යාම ලොව පුරා පවතින ප්‍රවණතාවයක් වන අතර ලෝක සෞඛ්‍ය සංවිධානය මගින්ද අවධාරණය කර ඇති පරිදි සෞඛ්‍යය සඳහා රාජ්‍ය වගකීම තහවුරු කෙරේ.

## ක්‍රියාමාර්ග

- උසස් සෞඛ්‍ය තත්වයකින් හෙවත් ඉහළම මානසික, කායික සහ සමාජමය සුවතාවෙන් ජීවත්වීම මූලික මිනිස් අයිතිවාසිකමක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුල් කෙරේ.

- අඩු වියදමකින් ඉහළම සෞඛ්‍ය සේවාවක් පවත්වාගෙන යන කියුබාව ඇතුළු උසස් සෞඛ්‍ය සේවාවන්ගෙන් මෙන්ම ලෝක සෞඛ්‍ය සංවිධානය වැනි සංවිධාන විසින් හඳුනාගෙන ඇති ඵලදායී ක්‍රමවේද (සෞඛ්‍ය සේවාව ලබා ගැනීමේ සැමට සාධාරණ අවස්ථාව, සෞඛ්‍ය සඳහා වරින්වර පුද්ගලිකව වියදම් කිරීමේ අවශ්‍යතාව නැති කිරීම, ප්‍රාථමික සෞඛ්‍යයට මුල් තැන දීම, සෞඛ්‍ය සඳහා බහු ක්ෂේත්‍ර සහභාගිත්වය ආදී) ඇතුල් කරමින් ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියක් සහ ඒ මත ගොඩනැගුණු ඒකාබද්ධ ජාතික සෞඛ්‍ය සේවාවක් ස්ථාපිත කෙරේ.
- එහිදී වැඩිවන ජනගහනය, ජන සංයුතියේ වෙනස්වීම, තාක්ෂණයේ දියුණුව සහ අභියෝග (උදා- ප්‍රතිජීවක ප්‍රතිරෝධය), රට පත්කර ඇති ආර්ථික අර්බුදය, රෝගාබාධ රටාවන් සහ ඒවාට මුල්වන සමාජ-ආර්ථික තත්වයන් ඇතුළු සියලු සාධක, ජනතා අවශ්‍යතා ආදී සියල්ල සැලකිල්ලට ගෙන සෞඛ්‍ය ප්‍රවර්ධනය, රෝගාබාධ නිවාරණය, ප්‍රතිකාර, පුනරුත්ථාපනය යන සෞඛ්‍ය සේවාවේ සියලු අංශ විධිමත් කිරීමටත් අවශ්‍ය පරිදි ප්‍රසාරණය කිරීමටත් පියවර ගැනේ.
- එළඹෙන වසර 05 ඇතුළත සෑම පුද්ගලයකුටම රජය වෙනුවෙන් වගකියන පවුලේ වෛද්‍යවරයකුගේ ආවරණය ලබා දෙන අතර අවම වශයෙන් වසරකට වරක් පූර්ණ වෛද්‍ය පරීක්ෂණයකට ලක් කෙරේ.
- දැනට අවුරුදු 75ක්ව පවතින ශ්‍රී ලාංකිකයින්ගේ ආයු අපේක්ෂා කාලය ඉහළ නැංවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනේ.
- පළාත්පාලන, වෙළඳ, ආහාර, කෘෂි, ධීවර, පශු සම්පත්, අධ්‍යාපන, ජනමාධ්‍ය, රාජ්‍ය මූල්‍ය, ජල, පාරිසරික, තාක්ෂණ සහ පර්යේෂණ ඇතුළු විවිධ ක්ෂේත්‍රයන්හි රාජ්‍ය ආයතන මෙන්ම සිවිල් සමාජ සංවිධානවලද පොදු මහජනතාවගේද දේශීය සහ විදේශීය විශේෂඥයින්ගේ සහ සංවිධානවලද සහභාගිත්වයෙන් සහ සහයෝගයෙන් දැනට බහුලව ව්‍යාප්ත වෙමින් තිබෙන රෝගාබාධ සහ අනතුරු කඩිනමින් පාලනය කිරීම සඳහා ඉලක්කගත වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර ඒ යටතේ ජලභීතිකාව සහ ඩෙංගු රෝගය වසර තුනක් තුළ මුළුමනින් තුරන් කිරීමට පියවර ගැනේ.
- මාතෘ, ළමා සහ නිවාරණ සෞඛ්‍ය සේවාවන්ට මූලිකත්වය ලබා දෙන අතර පාසැල් වයසේ සිට ඉහළට වූ සෑම පුරවැසියකුටම වර්තමාන රෝගාබාධයන්ට ගැලපෙන මූලික සෞඛ්‍ය අධ්‍යාපනයක් ලබා දේ. එහිදී සියලු ආකාරයේ මාධ්‍ය, දේශපාලන වේදිකා, ආගමික අවස්ථා, අධ්‍යාපන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික ආයතන සහ වැඩබිම් යොදා ගැනේ.
- රාජ්‍ය අංශයේ අත්‍යවශ්‍ය ඖෂධ, උපකරණ සහ පරීක්ෂණ පහසුකම් හිඟය සහ ප්‍රමිතියක් නොමැතිවීමේ තත්වය වසර පහක් තුළ මුළුමනින් තුරන් කරන අතර ඒ සියලු අංශ සඳහා පෞද්ගලික අංශයටද බලපාන පරිදි ජාතික ප්‍රතිපත්ති සකස් කෙරේ.

- ඖෂධ පනත වඩාත් ජනතාවාදීව සංශෝධනය කර බලාත්මක කෙරේ.
- නියමිත ප්‍රමිතියෙන් යුත් ඖෂධ පමණක් වෙළඳපොළට නිකුත් කරන අතර ඖෂධවල අන්තර්ගතය සහ ඒවායින් ඇතිවිය හැකි අතුරු ආබාධ පිළිබඳ දැනුවත් කරන පත්‍රිකාවක් (භාෂා තුනෙන්ම) ඖෂධ සමග ලබා දේ.
- දැනට බහුලව පවතින වකුගඩු සහ පිළිකා රෝගවලින් පෙළෙන රෝගීන් සඳහා අවශ්‍ය සියලු ඖෂධ හා අනෙකුත් ප්‍රතිකාර රජය මගින් නොමිලේ ලබා දීමට පියවර ගැනේ.
- දරුවන් නොමැති විවාහක පවුල් සඳහා දරු ඵල හිමිකරදීම පිණිස විශේෂ වෛද්‍ය පහසුකම් සහිත ඒකක රටේ ප්‍රධාන රෝහල් තුළ ඇති කෙරේ.
- පහසු මිලට ගුණාත්මක ඖෂධ ජනතාවට ලබාගත හැකිවන පරිදි රාජ්‍ය ඔසුසැල් ප්‍රමාණය වසරකට 100 බැගින් වසර පහක් තුළ 500ක් ස්ථාපිත කෙරේ.
- ඖෂධ හා උපකරණ දේශීයව නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය-පෞද්ගලික ව්‍යාවසායක අංශවලට දිරි දේ. ඒ වෙනුවෙන් එම නිෂ්පාදනයන් කරන ආයතන පළමු වසර දෙක තුළ බදුවලින් නිදහස් කෙරේ.
- සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ වෘත්තීය තෘප්තිය සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම පිණිස දැනුම සහ කුසලතා යාවත්කාලීන කිරීමටත් ඔවුන් මුහුණ දෙන වැටුප්, දීමනා, නිල නිවාස හිඟය, සුභ සාධන දුර්වලතා ඇතුළු වෘත්තීය ගැටලුවලට සාධාරණ විසඳුම් ලබා දීමටත් උපරිම පියවර ගැනේ.
- ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා වෛද්‍ය, හෙද, පරිපූරක/අතුරු වෛද්‍ය සහ සෙසු වෘත්තිකයින් 50,000ක් වසර 05 ක් තුළ රාජ්‍ය සෞඛ්‍ය සේවාවට අනුයුක්ත කෙරේ.
- සෑම ග්‍රාම සේවා වසමක්ම ආවරණය වනසේ ප්‍රජා සෞඛ්‍ය ඒකකයක් පිහිටුවනු ලැබේ. රෝග වැළැක්වීම සහ අවදානම් අඩු රෝග සඳහා ප්‍රතිකාර දීමට අවශ්‍ය වෛද්‍ය, හෙද කාර්යමණ්ඩලයන් මේ සඳහා අනුයුක්ත කරන අතර එමගින් රජයේ රෝහල්වල තදබදය අවම කෙරේ.
- වෛද්‍ය අධ්‍යාපනය ඇතුළු සියලු සෞඛ්‍ය වෘත්තීය අධ්‍යාපනය රාජ්‍ය විශ්වවිද්‍යාල හා රාජ්‍ය ආයතන මගින් පමණක් සිදු කෙරේ. ඒ සඳහා වෛද්‍ය නොවන වෘත්තීන්ද ඇතුල් වන පරිදි සෞඛ්‍ය විද්‍යාවන් පිළිබඳව සරසවි පීඨ ආරම්භ කෙරේ.
- මෙරට දැනට පවතින 11ක් වන රජයේ හෙද විදුහල් සංඛ්‍යාව වැඩිකිරීමට පියවර ගන්නා අතර එම ආයතන විශ්වවිද්‍යාල මට්ටම දක්වා උසස් කරනු ලැබේ.
- වෛද්‍ය සභාවන්හි ස්වාධීනත්වය, බලතල සහ පහසුකම් පුළුල් කර රට තුළ සේවයේ නියුතු සියලු සෞඛ්‍ය වෘත්තිකයින් උසස් දැනුමෙන්, කුසලතාවෙන් සහ විනයෙන් යුත් බව ජනතාවට සහතික කෙරේ.

- හදිසි සෞඛ්‍ය අවශ්‍යතා සඳහා විශේෂයෙන් වෙන්වූ පැය 24 පුරා ක්‍රියාත්මක දුරකථන අංකයක් හඳුන්වා දෙන අතර සෞඛ්‍ය සේවාවන් පිළිබඳ තොරතුරු ලබා දීමේ මධ්‍යස්ථානයක් පිහිටුවේ.
- ජනාවාස, සේවා ස්ථාන ආදිය පදනම් කර ගනිමින් හදිසි ප්‍රතිකාර සහ රෝගී ප්‍රවාහන සේවාවක් දීප ව්‍යාප්ත මට්ටමින් ක්‍රියාත්මක කෙරේ.
- දැනට ගොඩගැසී ඇති අත්‍යවශ්‍ය ශල්‍යකර්ම (හදවත්, වකුගඩු වැනි) කඩිනමින් සිදු කිරීම සඳහා පෞද්ගලික අංශයේද සහාය ඇතුව වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන අතර ඒ සඳහා දුම්කොළ බද්ද යොදා ගනිමින් විශේෂ අරමුදලක් ස්ථාපිත කෙරේ.
- පළමු ශ්‍රේණියට සිසුන් ඇතුලත් කිරීමේදී එක් එක් සිසුවාට අදාල වෛද්‍ය වාර්තාවක් සැකසීම හා සෞඛ්‍ය අවධානමක් ඇති සිසුන් සඳහා නිරන්තර පරීක්ෂාවට ලක් කිරීමක් සිදු කෙරේ.
- පුද්ගලයින් 200කට වඩා සේවය කරන සේවා ස්ථානවලදී ජංගම පරීක්ෂණාගාර සහ ජංගම ඖෂධශාලා යොදා ගනිමින් බෝ නොවන රෝග සඳහා මාසික සායන පැවැත්වීමට කටයුතු කෙරේ.
- වැඩකරන ජනතාවට බාහිර රෝගී සහ සායන ප්‍රතිකාර ලබා ගැනීම පහසුවන සේ සතියේ දිනවල උදෑසන හයේ සිට රාත්‍රී 10 දක්වා සහ ඉරිදා දිනයන්ද ආවරණයවන සේ එම සේවාවන් දීර්ඝ කිරීමට පියවර ගනු ලැබේ.
- ආයුර්වේද, දේශීය වෛද්‍ය, හෝමියෝපති, යුනානි ආදී වෛද්‍ය ක්‍රම වැඩිදියුණු කිරීම සඳහාත් ඒවා ජනතාවට සමීපකරලීම සඳහාත් විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කෙරේ.
- බටහිර, ආයුර්වේද, හෝමියෝපති, යුනානි හා දේශීය වැනි විවිධ වෛද්‍ය ක්‍රම විද්‍යාත්මක පදනමක් මත ඒකාබද්ධ සේවාවන් ලෙස ජනතාවට ලබා දීමේ හැකියාව එම ක්ෂේත්‍රවල විශේෂඥයින්ගේ සහායයෙන් සොයා බැලේ.
- බටහිර සහ දේශීය සෞඛ්‍ය සේවාවන් පාලනය එක් අමාත්‍යංශයක් යටතට පත් කෙරේ.
- මේ ආකාරයට සෞඛ්‍ය ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේදී අවශ්‍ය පරිදි රජයේ ප්‍රතිපාදන දළ දේශීය නිෂ්පාදිතයෙන් 05% දක්වා වැඩි කිරීමට පියවර ගැනේ.

# 03. ජලය, ආහාර හා පෝෂණය සහ සනීපාරක්ෂාව

වසර දහස් ගණනක් පුරා මිනිස් ජීවයේ පැවැත්මට ලෝකයේ වඩාත් සුදුසුම රටක් බවට ශ්‍රී ලංකාව පත්වූයේ පිරිසිදු ජලය ප්‍රමාණවත් පරිදි තිබීම, ආහාරවලින් ස්වයංපෝෂිත වීම, දේශගුණ විපර්යාසයන් අවම වීම සහ සනීපාරක්ෂාව හා සහයෝගීතාව අගයන සංස්කෘතියක් පැවැතීම යන සාධක මතය. එහෙත් අද වන විට සිදුව ඇත්තේ කුමක්ද? අවිධිමත් කාර්මීකරණය, වැරදි දේශපාලන සහ ආර්ථික ප්‍රතිපත්ති හේතුවෙන් මේ සියල්ල අර්බුදයට ලක්ව මෙම මූලික අවශ්‍යතා පවා ලාංකිකයින්ට අහිමි වෙමින් තිබේ.

ආහාර නිෂ්පාදකයා, අතරමැදි යාන්ත්‍රණය හසුරුවන්නන් සහ පාරිභෝගිකයා යන සියලු දෙනා රජය විසින් අරාජික විවෘත වෙළඳපොළේ අතරමං කර ඇත. අපි අද අත්දකිමින් සිටින්නේ මේ මූලික අර්බුදයේ මතුපිට ප්‍රකාශනයය. නිෂ්පාදකයා තමන්ට නිසි මිලක් නොලැබීමෙන්, අස්වැන්නට අත්වන ඉරණම පිළිබඳ අවිනිශ්චිතභාවයෙන් සහ තාක්ෂණික මගපෙන්වීමක් නොමැති කමින් පීඩා විඳියි. අත්‍යාවශ්‍ය සේවාවක නිරතවන අතරමැදි යාන්ත්‍රණය හසුරුවන්නන් හෙට දවස ගැනවූ ආර්ථික අස්ථාවරත්වය හේතුවෙන් වැඩි ලාභයක් උපයා ගැනීමට ආහාර පාන විකෘති කිරීමේත් වස විස එකතු කිරීමේත්, මිල ඉහළ දැමීමේත් නිරතවන අතර පාරිභෝගියා අධික මිල සහ වස විස එකතුවී ඇතිදැයි නිරන්තර බියකින් නිසි පෝෂණයක් නොලබමින් ජීවත් වෙයි. ළමා පරපුර සහ ඇතැම් වැඩිහිටි කොටස් මන්දපෝෂණයෙන් පෙළෙන අතර ලුණු, මේදය සහ සීනි අධික ආහාර ගැනීමට බල කෙරෙන ආර්ථික රටාව හේතුවෙන් තවත් බොහෝ පිරිසක් දියවැඩියාව, අධිරුධිර පීඩනය, පිළිකා, තරබාරුව, වකුගඩු රෝග වැනි රෝගාබාධවලිනුත් පෙළේ. සාමාන්‍ය ශ්‍රී ලාංකිකයින්ගේ දෛනික සීනි, පිෂ්ඨ, තෙල්, මේද පරිභෝජනය නියමිත ප්‍රමාණයට වඩා දෙගුණයක් පමණ වුවද මාළු, එළවළු, නැවුම් කිරි සහ පළතුරු පරිභෝජනය නියමිත ප්‍රමාණයට වඩා අඩකටත් අඩු බව පර්යේෂකයින් විසින් සොයාගෙන තිබේ. මෙම තත්වය දියවැඩියාව, අධිරුධිර පීඩනය, පිළිකා, ස්ථූලතාව, හෘදයාබාධ සහ ආඝාතය වැනි රෝගාබාධවලට හේතුවී ඇත.

විශේෂයෙන් ජලයේ රසායනික තත්වය සම්බන්ධයෙන් සහතික වීමේ යාන්ත්‍රණය දුර්වල වීම හේතුවෙන් ජලය මගින් වැළඳෙන රෝගද වැඩිවෙමින් තිබේ. ආහාර හා පෝෂණයෙන් ස්වයංපෝෂණය විය හැකි අප රට ආහාරපාන සහ විටමින් ආදිය ආනයනය කිරීමට විදේශ විනිමය බිලියන ගණනක් වැය කරයි. මෙය බරපතළ ඛේදවාචකයකි.

## විසඳුම

පොදු ජනතාවගේ ආහාර, පෝෂණය සහ පානීය ජලය පිළිබඳව නිරන්තරයෙන් සොයා බැලීමත් ප්‍රතිපත්ති සකස් කර ක්‍රියාත්මක කිරීමත් ආණ්ඩුවේ අනුලංඝනීය වගකීමක් බවට පත් කෙරේ.

## ක්‍රියාමාර්ග

- වසර පහකට වරක් ජාතික පෝෂණ තත්ත්ව අධ්‍යයනයක් සිදු කෙරේ.
- කෙටි හා දිගු කාලීන මන්ද පෝෂණයෙන් පෙළෙන දරුවන්ට නොමිලේ විශේෂ ආහාර ලබා දීමට කටයුතු කෙරේ.
- සියලුම පෙර පාසැල් සහ පාසැල් දරුවන්ට නොමිලේ පෝෂණයෙන් පිරුණු දිවා ආහාර වේලක් ලබා දීමට කටයුතු කෙරේ.
- සෞඛ්‍ය සම්පන්න ආහාර රටාවක් සඳහා ළමුන් හුරු කිරීමට අදාල ජාතික වැඩපිළිවෙළක් හා අධ්‍යාපන වැඩසටහන් සකස් කොට ක්‍රියාත්මක කෙරේ.
- ගැබිණි හා කිරි දෙන මව්වරුන්ට හා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට රු.2000ක මුදලක් පෝෂණ සහනාධාරයක් ලෙස මාසිකව ලබා දෙනු ඇත.
- වෙළඳපොළේ සහ ගෘහාශ්‍රිත සියලුම ආහාර සහ ජලයේ සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා අවශ්‍ය ක්ෂේත්‍රගත නිලධාරීන් සහ පර්යේෂණාගාර ඇතුළු වෙනත් පහසුකම් වැඩි කෙරේ.
- ප්‍රමිතියෙන් යුත් වැසිකිළි නොමැති සියලු පවුල් ඒකකවලට පළාත්පාලන ආයතන හරහා නොමිලේ වැසිකිළි ඉදිකර දේ.
- දැනට නගර සහ මාර්ගවල වැසිකිළි පහසුකම් නොමැතිවීමේ ගැටලුවට පිළියමක් ලෙස සංචාරකයින්, පොදු ජනතාව ගැවසෙන ප්‍රමාණයන් සහ නගර අතර මහාමාර්ගයන්හි දුර වැනි කරුණු සැලකිල්ලට ගෙන ඉහළ ප්‍රමිතියෙන් යුත් පොදු සනීපාරක්ෂක ඒකක පද්ධතියක් (Sanitary Unit) දිවයින පුරා ස්ථාපිත කෙරේ.
- ආහාරපාන සකස් කිරීමේදී හා අලෙවියේදී ඊට වස විෂ එකතු කරන හා ප්‍රමිතියෙන් තොරව ආහාරපාන නිෂ්පාදනය කරන හා වෙළඳාමේ යෙදෙන පුද්ගලයින්ට එරෙහිව නීතිය දැඩි ලෙස ක්‍රියාත්මක කෙරේ.
- පළතුරු සහ එළවළු නිෂ්පාදනයේදී, බෙදාහැරීමේදී සහ අලෙවියෙදී සෞඛ්‍යාරක්ෂිත බව සහ නියමිත ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සහතික කෙරේ.

# 04. ක්‍රීඩා සහ ශරීර සුවතාවය

නිරෝගී, විනය ගරුක සහ සමාජශීලී මනා පෞරුෂයකින් යුත් පරපුරක් බිහි කිරීමෙහිලා ක්‍රීඩාව වැදගත් අංගයක් වී තිබේ. සියල්ල මුදලට මිල කරන වත්මන් කොල්ලකාරී ආර්ථිකය තුළ ක්‍රීඩාවේ තිබිය යුතු සාධනීය ලක්ෂණ අහෝසි කර දමා තිබේ. වර්තමානයේ ක්‍රීඩාව පත් කර ඇත්තේ, මුදල් උපයන සූදුවක තත්වයකටය. ඒ නිසාම ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ වංචා, දූෂණ, අල්ලස් සහ විවිධ අපචාර රජ කරමින් තිබේ. ක්‍රීඩාව සඳහා අවශ්‍ය රාජ්‍ය මැදිහත්වීම සිදු නොවන අතර ජාතික ක්‍රීඩා සැලැස්මක් නොමැති වීමද ගැටලුවක් වී තිබේ. ක්‍රීඩකයින් සඳහා

ක්‍රීඩාපිටි, ක්‍රීඩාගාර, ක්‍රීඩා උපකරණ ආදී පහසුකම් නොමැතිවීමත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කිරීම සඳහා වන පුහුණු වැඩසටහන් සහ පුහුණුකරුවන්ගේ හිඟයත් හේතුවෙන් රට පුරා විසිරී සිටින විවිධ දක්ෂතා සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට තම දක්ෂතාවය දැක්වීම සඳහා අවස්ථාව අහිමිවී ඇත.

ළමා වයසේ සිට වයෝවෘධ පුද්ගලයා දක්වා යම් කායික ව්‍යායාමයක නිරතවීම අත්‍යවශ්‍ය වුවද ඒ සඳහා අවස්ථාවන් නිසි පරිදි පුළුල් නොවී ඇති අතර ජනතාව අතර අවබෝධයද ඉතා අවම මට්ටමක පවතී. වැඩි ජනඝනත්වයක් සහිත ප්‍රදේශයන්හි මෙය බරපතළ ගැටලුවක් වන අතර පාසැල්වලින් අඩකටත් වඩා වැඩි ප්‍රමාණයක ක්‍රීඩාපිටි ඇතුළු අනෙකුත් පහසුකම් නොමැත. ව්‍යායාම සහ ක්‍රීඩා සඳහා යොමුවන්නන්ගේ සෞඛ්‍ය තත්වය පරීක්ෂා කිරීමේ සහ මැදිහත්වීමේ රාජ්‍ය යාන්ත්‍රණයක් නොමැතිකම හේතුවෙන් වටිනා ජීවිත ගණනාවක් අහිමි වූ අතර තවමත් එවැන්නක් ස්ථාපිත කර නොමැත.

## විසඳුම

සියලුම ක්‍රීඩාවලට සමානත්වය ලැබෙන පරිදි ක්‍රීඩා දියුණු කිරීමත්, පවත්වාගෙන යාමත් රජයේ වගකීමක් බවට පත් කරන අතර ක්‍රීඩා නගා සිටුවීම සඳහා වූ ඉලක්ක සහිතව ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සහ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කෙරේ.

## ක්‍රියාමාර්ග

- ක්‍රීඩා ක්ෂේත්‍රය නව පරිපාලන, නීති හා විනය පද්ධතියක් මත ප්‍රතිසංවිධානය කෙරේ.
- ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැක බලා ගැනීම, රක්ෂණය කිරීම, මූල්‍ය හා භෞතික සම්පත් ලබා දීම, වෘත්තීය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට වැටුප් සහ වෙනත් දීමනාද නිවාස පහසුකම්ද ක්‍රීඩා උපකරණද සැපයීම සඳහා ජාතික වැඩපිළිවෙළක් කෙරේ.
- වෘත්තීය ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ක්‍රීඩාවෙන් විශ්‍රාම ගැනීමෙන් පසු විශ්‍රාම වැටුපක් ලබා දීමටද කටයුතු කෙරේ.
- සෑම ලියාපදිංචි පාසැල් ක්‍රීඩාවක් සඳහාම දිස්ත්‍රික් මට්ටමේ කුසලතා පෙන්වන පාසැල් ක්‍රීඩකයින් 1000කට මසකට රු. 2000 බැගින් වූ ක්‍රීඩා ශිෂ්‍යත්ව වැඩපිළිවෙළක් ආරම්භ කෙරේ.
- පාසැල් සිසුන් පොත පතට පමණක් සීමාවීම වෙනස් කිරීමටත් ඔවුන්ගේ ශරීර සුවතාවය ඉහළ නැංවීමත් අරමුණු කරගනිමින් සාමාන්‍ය පෙළ විභාගයට විෂයක් ලෙස ක්‍රීඩාවක් අනිවාර්ය කරනු ලැබේ.

- ජාතික මට්ටමේ ක්‍රීඩකයින් ජාත්‍යන්තර තලයට ගෙන ඒම අරමුණු කරගෙන විවිධ ක්‍රීඩා ඉසව් ආවරණය වන සේ වසරකට ක්‍රීඩකයින් 50කට විදේශීය ක්‍රීඩා පුහුණු ශිෂ්‍යත්ව ලබා දේ.
- ක්‍රීඩාවට දක්ෂකම් ඇති ආබාධිත පුද්ගලයින්ට පලපුරුදු පුහුණුකරුවන් යොදා පුහුණුකර ජාත්‍යන්තර තරඟ සඳහා යොමු කිරීමට පියවර ගැනේ.
- පාසැල් මට්ටමේ ක්‍රීඩාව දියුණු කිරීම සඳහා වසරක් තුළදී පාසල් ක්‍රීඩාංගණ 100ක් සම්පූර්ණ පහසුකම් සහිතව සංවර්ධනය කිරීම සඳහා ක්‍රීඩාංගනයකට රු. මිලියන 50 බැගින් වෙන් කෙරේ.
- අවම වශයෙන් එක් දිස්ත්‍රික්කයකට එකක්වන පරිදි අංග සම්පූර්ණ ක්‍රීඩාංගණයක් සහිත ක්‍රීඩා සංකීර්ණයක් බැගින් පිහිටුවනු ලැබේ.
- සෑම මූලික රෝහලක් ආශ්‍රිතවම ක්‍රීඩා වෛද්‍ය ඒකකයක් පිහිටුවා ක්‍රීඩාවට අදාළ සෞඛ්‍ය සේවාවන් සහ අධ්‍යාපනය දෙමව්පියන්, ක්‍රීඩකයින්, පුහුණුකරුවන් සහ සංවිධායකයින් අතරට ව්‍යාප්ත කිරීමට පියවර ගනු ලැබේ.
- සියලු පාසැල් දරුවන්, උසස් අධ්‍යාපන හා වෘත්තීය ආයතනවල සිසු සිසුවියන් සහ නාගරික හා අර්ධ නාගරික පරිසරයන්හි ජීවත්වන්නන් සඳහා ව්‍යායාම පහසුකම් වැඩි දියුණු කිරීමට කටයුතු කෙරේ.
- ක්‍රීඩා සංගම්හි නිලතල දැරීමේදී ප්‍රවීණ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අවස්ථාව ලැබෙන පරිදි ඒවායේ ව්‍යවස්ථා සංශෝධනය කෙරේ.
- ක්‍රීඩකයන්, ක්‍රීඩා ක්ෂේත්‍රයේ තාක්ෂණ ශිල්පීන්, ක්‍රීඩා කළමනාකරුවන්, පුහුණුකරුවන්, තරඟ සංවිධායකයින්, ක්‍රීඩා උපකරණ නිෂ්පාදකයින්, ක්‍රීඩා මාධ්‍යකරුවන් ආදීන් නිර්මාණය කරන සහ පුහුණු කරන ක්‍රීඩා සඳහා වෙන්වූ ජාතික ක්‍රීඩා පාසලක් පළමු වසර තුළදීද ක්‍රීඩා සඳහා වෙන්වූ ජාතික සරසවියක් පළමු වසර 03 තුළදීද ආරම්භ කෙරේ.

සෞඛ්‍ය සඳහා වැයවන වියදම් පාලනය කළ හැකි ප්‍රධානම ක්‍රමය නිරෝගී ශරීරයක් ඇති ජනතාවක් බිහි කිරීමය. ශාරීරික යෝග්‍යතාවය Fitness වැඩි කිරීම මගින් සුවතාවය wellness ඇති කිරීම මෙහි මූලික අරමුණයි. ඒ සඳහා,

1. සෑම රාජ්‍ය හා පුද්ගලික ආයතනයකම ශාරීරික සුවතා මධ්‍යස්ථාන ආරම්භ කිරීම දිරිමත් කෙරේ. කාර්ය මණ්ඩලය 250ට වැඩි සෑම ආයතනයකට මෙය අනිවාර්ය කෙරේ.
2. දැනට ශාරීරික යෝග්‍යතා පුහුණුකරුවන් 20,000ක පමණ අවශ්‍යතාවයක් අප රට තුළ පවතී. ඉදිරි වසර පහ තුළ මෙම ඉලක්කය සපුරා ගැනීමට රාජ්‍ය සහ පුද්ගලික ආයතනවල ආධාර සහ අනුබල දේ.

3. ශරීර යෝග්‍යතා පුහුණුව සඳහා අවශ්‍ය උපකරණ මත පනවා ඇති බදු ඉවත් කෙරේ.

4. සුහසාධක සංගම්, ක්‍රීඩා සමිති වැනි රට පුරා විහිදී ඇති ප්‍රජාමූල සංවිධානවලට ශරීර යෝග්‍යතා මධ්‍යස්ථාන ආරම්භ කිරීම සඳහා සංවිධාන 500කට රු. 100,000 බැගින් ලබා දේ.

# 05. විද්‍යා හා තාක්ෂණ

21වන සියවසේ මිනිස් වර්ගයාගේ ඉරණම සහ ආර්ථිකය මුළුමනින්ම රඳා පවතින්නේ විද්‍යාව සහ තාක්ෂණයේ දියුණුව මතය. විද්‍යාව සහ තාක්ෂණය සම්බන්ධයෙන් අප රට පෙළන පසුගාමීත්වයට ප්‍රධාන හේතුවක් වන්නේ රටේ නායකත්වයට පත්වූවන් සහ ඔවුන් වටා එකතුවන පිරිස් විද්‍යාව විශ්වාස නොකිරීම සහ විද්‍යාර්ථීන් තම පටු අරමුණු වෙනුවෙන් යොදා ගැනීමය. රාජ්‍ය ආයතන පද්ධතිය බිඳදැමීම සහ නව ලිබරල් ආර්ථික ක්‍රමය විසින් අද වන විට විද්‍යාව, තාක්ෂණය හා විද්‍යාර්ථීන් ලාභය ඉපැයීමේ ව්‍යාපාරික අරමුණු වෙනුවෙන් යොදා ගනිමින් තිබේ. ජන ජීවිතය ඉතා උසස් තත්වයකට පත් කළ හැකි විද්‍යා හා තාක්ෂණය ක්‍රමවේද ලොව පුරාත් අප රටේත් බිහි වුවද ඉන් ලාංකික ජන සමාජයටත් දේශීය ආර්ථිකයටත් ලැබෙන්නේ ඉතා අවම ප්‍රයෝජනයකි. ඖෂධවලින් සහ නවීන වෛද්‍ය විද්‍යාවෙන් ලැබිය යුතු ප්‍රයෝජන ජනතාවට නොලැබී යන්නේ රජයේ වැරදි සෞඛ්‍ය සහ ඖෂධ ප්‍රතිපත්ති හේතුවෙනි. රජරට වකුගඩු රෝගයට වසර 30කට පසුවද විසඳුමක් නොලැබෙන්නේ ආණ්ඩු කළ දේශපාලකයින් විද්‍යාවට නිසි තැන නොදීමය.

විද්‍යාව සහ තාක්ෂණය දියුණු වන්නේත් එයින් ජන ජීවිත උසස් වන්නේත් විද්‍යාවට සහ තාක්ෂණයට නිසි තැන ලැබෙන දේශපාලන සහ ආර්ථික ක්‍රමයක් තුළ පමණි. රටේ අධ්‍යාපන ක්‍රමය තුළ පවත්නා අවිද්‍යාත්මක බවත් විභාග ඉලක්ක කර සකසා ඇති අධ්‍යාපන රටාවත් විසින් ගවේෂණයට, පර්යේෂණයට හා නිර්මාණශීලී හැකියාවන්ට ඉඩ ප්‍රස්ථාව නොලැබී යාමද විද්‍යාව සහ තාක්ෂණය දියුණු නොවීමට හේතු වී ඇත. විවිධ වෘත්තීන්ට සම්බන්ධව රැකියා කරන්නන්ට එම වෘත්තීන්ට අත්‍යවශ්‍ය වූ පර්යේෂණ සහ තාක්ෂණික දැනුම ලබා ගැනීමේ වැඩපිළිවෙළක් නොමැති වීමෙන් උසස් තාක්ෂණික දැනුම සහිත වෘත්තිකයින් බිහිවීම අඩපණ වී ඇත.

විද්‍යා හා පර්යේෂණ කටයුතු සඳහා රජය මගින් වෙන් කරන මුදල් ප්‍රමාණය ඉතා අඩුවීම, විවිධ පර්යේෂණ ආයතන අතර සම්බන්ධයක් නොමැතිකම, පර්යේෂණයන්හි ප්‍රතිඵල සහ නව නිපැයුම් (භෞතික නිපැයුම් සහ නව ක්‍රමවේද) ජාතික ආර්ථිකයේ අභිවෘද්ධියට සහ ජනජීවිතය ඉහළ නැංවීමට රටේ පාලකයින් විසින් යොදා නොගැනීමත් පර්යේෂණ සහ සංවර්ධන කටයුතු අධෛර්යමත් කිරීමට බලපා ඇත.

# විසඳුම

විද්‍යාව සහ තාක්ෂණය සංවර්ධනය කිරීමත් ඊට සියලු අදාල සියලු පහසුකම් වැඩි දියුණු කිරීමත් මුළුමනින්ම රජයේ වගකීමක් ලෙස සැලකේ. ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තියක් සහ පස් අවුරුදු සැලැස්මක් ක්‍රියාත්මක කෙරේ.

ජනජීවිතයට බලපාන ප්‍රධාන ක්ෂේත්‍ර සියල්ලටම විද්‍යාව හා තාක්ෂණය යොදා ගන්නා අතර විදේශ විනිමය ඉපයීම ඇතුළු ආර්ථික ක්‍රියාවලියේ ප්‍රධාන තැනක් නවීන පර්යේෂණ සහ සංවර්ධනයට හිමි කර දේ.

# ක්‍රියාමාර්ග

- දැනට විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතන පිළිබඳවත් දැනට පිහිටුවා නැති ක්ෂේත්‍ර පිළිබඳවත් අවධානය යොමු කර විද්‍යා තාක්ෂණ අමාත්‍යාංශය ප්‍රති ව්‍යුහගත කෙරේ. අමාත්‍යාංශය යටතට නොගැනෙන විශ්වවිද්‍යාල, වෙනත් රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික පර්යේෂණ සහ සංවර්ධන ආයතන සමග සහ ඒවා අතර සම්බන්ධීකරණය සහ අධීක්ෂණය සඳහා නිශ්චිත ඒකකයක් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කෙරේ.
- විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ නව ආයතනික ව්‍යුහයක් පිහිටුවනු ලබන අතර එය පහත සඳහන් ආයතනවලින් සමන්විත වේ.

### (අ) ජාතික උරුමයන් පිළිබඳ කොමිෂන් සභාව

අපේ පෞරාණික හා පාරම්පරික විද්‍යාත්මක දැනුම හා තාක්ෂණික දැනුම සොයා ගැනීමත් ඒවා ලිඛිත හා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය තුළ සංරක්ෂණය කිරීමත් පැරණි දැනුම හා ක්‍රමවේදයන් ඉගැන්වීමත් ඒවා පිළිබඳ නව පර්යේෂණ කිරීම හා එකී දැනුම නූතන තාක්ෂණික දැනුම හා එක්කර සංවර්ධනය කිරීමත් මෙහි අරමුණ වේ.

### (ආ) විද්‍යා ව්‍යාප්ති කොමිෂන් සභාව

විධිමත් ආයතනික අධ්‍යාපන ධාරාව තුළ සිටින සිසුන්ට විද්‍යා හා තාක්ෂණ දැනුම ලබා දීමට අදාල මඟපෙන්වීම් කිරීමත් පොදුවේ සමාජයේ ඇති අවිද්‍යාත්මක ආකල්ප දුරුලීම සඳහා උත්සාහ කිරීමත් සමාජයේ සියලුම දෙනාට අත්‍යවශ්‍ය මූලික විද්‍යා හා තාක්ෂණ දැනුම ලබා දීමත් නිෂ්පාදන හා සේවා ක්ෂේත්‍රවල නිරත පුද්ගලයන්ට අමතර විද්‍යා දැනුම ලබා දීමත් මෙහි අරමුණ වේ.

### (ඇ) ජාතික විද්‍යා පරීක්ෂණ ඇකඩමිය

රටේ මහා පරිමාණ නිෂ්පාදන ක්‍රියාවලියට අත්‍යවශ්‍ය තාක්ෂණික මඟ පෙන්වීම ලබා දීමත් කෘෂිකර්මයට, සත්ව පාලනයට, ධීවර කර්මාන්තයට හා කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ නිර්මාණය කිරීම හා සංවර්ධනය කිරීමත් නව විද්‍යාත්මක දැනුම සංවර්ධනය කිරීමත් මෙහි අරමුණ වේ.

### (ඈ) මහජන උපයෝගිතා තාක්ෂණ සංවර්ධන මධ්‍යස්ථානය

ජනතාවගේ දෛනික හා ගෘහමය ජීවිතයට අවශ්‍ය උපකරණ හා සේවාවන් වැඩිදියුණු කිරීමත් ඒවා භාවිතය පිළිබඳ දැනුම ලබා දීමත් පිරිමැසුම්දායී, ලාභදායී, කාර්යක්ෂම, පහසු හා පරිසර හිතකාමී ගෘහ උපකරණ නිෂ්පාදනය කිරීමට මඟ පෙන්වීමත් එහි අරමුණ වේ.

### (ඊ) නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

මෙමගින් පාසැල් සහ උසස් අධ්‍යාපනයේ යෙදෙන සිසුන්ද ඇතුළු පොදු ජනතාව නව විද්‍යාත්මක අත්හදාබැලීම් හා සොයා ගැනීම් කෙරෙහි පෙළඹවීමත් නව නිපැයුම්කරුවන්ගේ නිර්මාණ සංවර්ධනය කර වාණිජමය වශයෙන් නිෂ්පාදනය කිරීමට දිරිදීමත් නව නිර්මාණකරුවන්ට වැඩිදුර අධ්‍යාපනය සඳහා අනුග්‍රහය ලබා දීමත් නව නිර්මාණකරුවන් ලියාපදිංචි කර ඔවුන්ට දෙස්-විදෙස් පුහුණුව, අධ්‍යාපනය, මූල්‍ය හා තාක්ෂණ අනුග්‍රහය ලබා දීමත් අරමුණු කර ගනී.

- විද්‍යා සාහිත්‍යය ප්‍රචලිත කිරීමට සියලු අනුග්‍රහයන් සපයන අතර ඒ යටතේ විද්‍යා සාහිත්‍ය සම්මානය නැවත හඳුන්වා දීම, විද්‍යා ලේඛකයන්ට අතහිත දීම, වෙනත් භාෂාවලින් පළවන විද්‍යාත්මක කෘති දේශීය භාෂාවන්ට පරිවර්ථනය කිරීම, නව විද්‍යා කෘති සම්පාදනය කිරීම වැනි පියවර ගැනේ.
- අනිවාර්ය ද්විතියික අධ්‍යාපනයෙන් පසුව පාසැල් හැර යන්නන් සඳහා සරල මට්ටමේ පාඨමාලාවල සිට තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි දක්වා විසිර ගිය පුළුල් කාර්මික විදුහල්, තාක්ෂණික පාසල් හා උසස් තාක්ෂණ විශ්වවිද්‍යාල සහිත අධ්‍යාපන ජාලයක් ස්ථාපිත කෙරේ.
- දැනට විදේශගතව සිටින විද්‍යාඥයින්, පර්යේෂකයින් හා බුද්ධිමතුන්ගේ සේවය රටට ලබාගත හැකිවන සේ විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.
- වෙනත් රටවල් සමඟ විද්‍යා හා තාක්ෂණ දැනුම හුවමාරු කර ගැනීමේ වැඩසටහන්ද, හවුල් පර්යේෂණ ව්‍යාපෘතිද අරම්භ කෙරේ.
- කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත, කෘෂිකර්මය, ධීවර කර්මාන්තය ආදී සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා නව විද්‍යා දැනුම හඳුන්වා දීමට කටයුතු කෙරේ.

- සෑම අමාත්‍යාංශයකටම විද්‍යා හා තාක්ෂණ උපදේශක සභාවක් පත්කෙරේ.
- රාජ්‍ය සේවාව හැකි උපරිමයෙන් පරිඝනක ගත කරන අතර අන්තර්ජාලයෙන් සේවාවන් ඉටු කර ගත හැකි තත්වයට පත් කෙරේ.
- අන්තර්ජාල පහසුකම් නොමිලේ ලබා දීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කෙරේ.
- අනාගතයේ වඩාත් අවධානයට යොමුවන ස්වභාවික සහ විශේෂයෙන්ම පරිසර හිතකාමී ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධයෙන් පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවලට පූර්ණ අනුග්‍රහය ලබා දෙන අතර ඒවා නිෂ්පාදනයේදී පොසිල ඉන්ධන අඩුවෙන් භාවිත වන කර්මාන්තවලට වැඩි ප්‍රමුඛතාවක් ලබා දේ. ශාඛ ඇතුළු ස්වාභාවික මූලාශ්‍රවලින් කෙරෙන නිෂ්පාදන ශ්‍රී ලංකාවට අධික විදේශ විනිමයක් උපයා දීමට සමත්වනු ඇත.

# නවීකරණය හා
# කාර්මීකරණය වූ රටක්

# 01. ආර්ථික ක්ෂේත්‍රය

අප ගන්නා හුස්ම පොද, කෑම, බීම, විවාහය, රැකියා, අධ්‍යාපනය, සෞඛ්‍ය ඇතුළු සියල්ල තීරණය වන්නේ රටේ ආර්ථිකය මතය. 1948 ට පෙර ජාතීන් කීපයක සෘජු යටත් විජිතයක් ලෙසත් එතැන් සිට 1977 දක්වා ඒකාධිකාරී රාජ්‍ය ධනවාදයටත් 1977න් පසු විවෘත වෙළඳපොල ආර්ථිකයක් ලෙසත් විවිධ ස්වරූපයෙන් ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකාවේ ආර්ථිකය මේ වන විට දැඩි අර්බුදයට ලක්ව තිබේ. මෙතෙක් ලංකාව පාලනය කළ සියලු පාලකයන්ගේ කොල්ලකාරී ආර්ථික ප්‍රතිපත්තිය හමුවේ අගාධයට වැටී ඇති ශ්‍රී ලංකාව ණය සහ බදු මත රැඳුණු අයාලේ යන ආර්ථිකයක් බවට පත්ව ඇත. තට්ටුමාරු ආණ්ඩු යටතේ අප රට සංවර්ධිත තත්වයට පත් නොවූවා පමණක් නොව අදවන විට රුපියල් කෝටි 800,000ක් (හෙවත් බිලියන 8000) වූ රාජ්‍ය ණය ප්‍රමාණයක්ද අප මත පටවා ඇත. ඒක පුද්ගල ණය බර රුපියල් ලක්ෂ හතරක් පමණ වේ. නිෂ්පාදන ආර්ථිකයක් ඇති නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස නිෂ්පාදනය කඩා වැටී අපනයන ආදායම ඉතා පහළ අගයකට වැටී ඇත. ඒ හේතුවෙන් අපනයන ආදායම මෙන් දෙගුණයක් වැය කර ආනයනයන් කිරීමට සිදුව ඇත. අවසානයේ දිගින් දිගටම රට විශාල වෙළඳ හිඟයකට සහ මූල්‍ය අර්බුදයකට මුහුණ දෙමින් සිටී.

මුළු රාජ්‍ය ආදායම තුළ වක්‍ර බදු ඉහළ අගයක් ගැනීම හේතුවෙන් ජනතාවට විශාල බදු බරක් දැරීමට සිදුව තිබේ. ආර්ථිකයේ මහා පරිමාණ රාජ්‍ය ආයතන වන විදුලිය බල මණ්ඩලය, ඛණිජ තෙල් සංස්ථාව, වරාය, ටෙලිකොම්, ගුවන්තොටුපොළ, ජල සම්පාදන, ඛනිජ සම්පත් වැනි ආයතනවලින් ලැබිය හැකි ලාභ නොලබා ඒවා විශාල ලෙස වංචා, දූෂණ, නාස්ති සිදුවන ආයතන ලෙස ජාතික ආර්ථිකයට බරක් සහ ජනතාව මත පැටවූ පීඩාවක් බවට පත්කර තිබේ.

දේශීය හා විදේශීය ආයෝජන කඩා වැටීමෙන්ද රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය නිසි කළමනාකරණයක් නොමැති වීමෙන්ද නිෂ්පාදන ක්ෂේත්‍රය කඩා වැටී ඇති අතර ඒ හේතුවෙන් භාණ්ඩ හා සේවා මිල ඉහළ යාම, විරැකියාව ඉහළ යෑම සහ ශ්‍රම සූරාකෑම ඉහළ යෑම විශාල ගැටලු ලෙස පවතින අතර ලංකාවේ ආර්ථිකය දිනෙන් දින යමින් ඇත්තේ අර්බුදයටය.

## විසඳුම

රට තුළ ක්‍රියාත්මක කෙරෙන අසාර්ථක කොල්ලකාරී විවෘත වෙළඳපොළ ආර්ථික ප්‍රතිපත්තිය වෙනුවට නවීන සමාජවාදී ප්‍රතිපත්තිමත පිහිටා භාණ්ඩ සහ සේවා නිෂ්පාදනයට ප්‍රමුඛතාවය දෙන නිෂ්පාදන ආර්ථිකයක් ගොඩ නැගේ. ඒ සඳහා ජනතා සහභාගිත්වය ලබා ගන්නා අතර ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාව අතර සාධාරණ ලෙස බෙදී යාම අපගේ සමස්ත සමාජ-ආර්ථික සැලැස්ම තුලින් සහතික කෙරේ.

මානව සම්පතේ උසස් සංවර්ධනය ආර්ථිකයේ ප්‍රධාන උපායමාර්ගය බවට පත් කෙරේ.

# 02. කර්මාන්ත

දිගුකාලීන ඉලක්ක සහගත කාර්මික වැඩපිළිවෙළක් නොමැති වීමෙන් ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රය තවමත් ඉතා නොදියුණු තත්වක පවතී. ඉඳිකටුවේ සිට සියල්ල පිටරටින් ගෙනෙන තත්වයට පත්ව ඇත්තේ, කර්මාන්ත අංශයේ පවතින නොදියුණු බව හේතුවෙනි. දශක ගණනාවකට පසුවත් ලංකාවට අනන්‍ය වූ වාසිසහගත කර්මාන්තයක් ගොඩනගා ගැනීමට හැකි වී නැත. ඊට අමතරව දේශීය වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් කළ හැකි නිෂ්පාදන නොකිරීම සහ විදේශ වෙළඳපොළ ඉලක්ක කරගත් වාසි සහගත කර්මාන්තවල රජය අයෝජනය නොකිරීම හේතුවෙන් කර්මාන්ත ක්ෂේත්‍රය එක තැන පල්වෙමින් පවතී.

## විසඳුම

කාර්මික ක්ෂේත්‍රය නගා සිටුවීමේදී ජනසහභාගිත්ව කර්මාන්ත ප්‍රතිපත්තියක් සහ කර්මාන්ත ගමට ගෙන යාමේ ප්‍රතිපත්තියක් සැකසේ.

සියලුම නිෂ්පාදන අංශවල ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නංවමින් දේශීය සහ විදේශීය ආයෝජනයද, විදේශීය තාක්ෂණය හා දැනුම ලබා ගනිමින්ද රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නව කර්මාන්ත ආරම්භ කරන අතර දැනට පවතින කර්මාන්ත ක්‍රමානුකූලව සහ විද්‍යාත්මකව සංවර්ධනය කිරීමට පියවර ගැනේ.

## ක්‍රියාමාර්ග

- නිෂ්පාදන ආර්ථිකය ගොඩනැගීමේදී රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය පොදු ආර්ථික උපායමාර්ගයකට හා සැලැස්මක අනුව මෙහෙයවේ.
- නිෂ්පාදන ආර්ථිකය ගොඩ නැගීමේ කාර්යයට සහභාගි වන පෞද්ගලික අංශයට පළමු වසර පහ තුළදී බදු නිදහසක් සහ අදාළ වෙනත් පහසුකම් සහතික කෙරේ.

- කාර්මීකරණයේ පළමු අදියර ලෙස දේශීය අවශ්‍යතා සපුරාලන භාණ්ඩ සහ සේවා නිෂ්පාදනය සඳහා කර්මාන්ත ආරම්භ කෙරේ.
- කාර්මික සංවර්ධනයේදී දැනට රට තුළ නිපදවිය හැකිව තිබෙන එහෙත් ආනයනය කරන කාර්මික නිෂ්පාදන රට තුළම නිපදවීම අරමුණු කරගත් ආනයන ආදේශන කර්මාන්ත ආරම්භ කරන අතර අපනයනය ඉලක්ක කරගත් නව කර්මාන්ත පද්ධතියක් ආරම්භ කෙරේ.
- තැන් තැන්වල අවිද්‍යාත්මකව කර්මාන්තශාලා පිහිටුවනවා වෙනුවට අමුද්‍රව්‍ය සපයා ගැනීම, යටිතල පහසුකම් සපයා ගැනීම, ශ්‍රමය ලබා ගැනීමේ පහසුව, අපද්‍රව්‍ය බැහැර කිරීම ආදිය පදනම් කරගෙන සුදුසු ප්‍රදේශවල කාර්මික කලාප, කාර්මික උද්‍යාන, සුළු හා මධ්‍ය පරිමාණ කාර්මික ජනපද ස්ථාපිත කෙරේ.
- රට තුළ හා ශ්‍රී ලංකා මුහුදු සීමාව තුළ ඇති ස්වාභාවික සම්පත් පිළිබඳව පූර්ණ සමීක්ෂණයක් සිදු කරන අතර අමුද්‍රව්‍ය අපනයනය වෙනුවට නිමි භාණ්ඩ අපනයනයට ප්‍රමුඛතාවය දේ.
- නව තාක්ෂණය, කළමනාකරණය හා ප්‍රාග්ධනය රටේ කාර්මීකරණ වැඩපිළිවෙළට යොදා ගැනීම වෙනුවෙන් විදේශ රාජ්‍ය ආයතන හා සමාගම් සමග ඒකාබද්ධ වීමට කටයුතු කෙරේ.
- රට කාර්මීකරණය සඳහා අත්‍යාවශ්‍ය වන රසායන ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා රසායන කර්මාන්ත ඇති කෙරේ. ඒ යටතේ,

  ● විදේශ විනිමය ඉතිරිකර ගැනීමටත් රැකියා උත්පාදනයටත් ගොවි ජනතාවට වත්මන් පොහොර මිලට වඩා අඩකට ආසන්න අඩු මිලට පොහොර ලබා දීමත් අරමුණු කර ගනිමින් එප්පාවල පොස්පේට් නිධිය පදනම් කර ගනිමින් සුපර් පොස්පේට් කර්මාන්තශාලාවක් ආරම්භ කෙරේ.

  ● ශ්‍රී ලංකාවේ බොහෝ කර්මාන්ත සඳහා අත්‍යාවශ්‍ය වන සල්පියුරික් අම්ලය නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවක් ආරම්භ කෙරේ.

  ● අප රට තුළ මීට පෙර පැවත දැනට අක්‍රියව ඇති කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්ත ශාලාවත් ඉලෙක්ට්‍රොනික කර්මාන්තයට අත්‍යාවශ්‍යවන මොනසයිට් නිෂ්පාදනය කිරීම සඳහා බේරුවල ප්‍රදේශයේ පැවැති මොනසයිට් නිස්සාරණ කර්මාන්තශාලාවත් ලංකාවේ කර්මාන්තවලට අවශ්‍යවන යකඩ නිෂ්පාදනය කිරීම සඳහා එඬේරමුල්ල ප්‍රදේශයේ පැවැති අබලි යකඩ (Scrap iron) කර්මාන්තශාලාව නව පදනමක් මත යළි ආරම්භ කෙරේ.

  ● ශ්‍රී ලංකාවේ දන්තාලේපන නිෂ්පාදනය සඳහා වාර්ෂිකව කැල්සියම් කාබනේට් ටොන් ලක්ෂයක් ආනයනය කෙරේ. ඒ වෙනුවට, ඒ සඳහා අවශ්‍ය කැල්සියම් කාබනේට් නිෂ්පාදනය සඳහා යොදාගත හැකි බලංගොඩ ප්‍රදේශයේ පිහිටා

ඇති කැල්සයිට් නිධිය උපයෝගී කර ගනිමින් කැල්සියම් කාබනේට් නිෂ්පාදන කර්මාන්තශාලාවක් ස්ථාපිත කෙරේ.

- ලංකාවේ ඇති ඉතාමත් පිරිසිදු මිනිරන් නිධි උපයෝගී කරගෙන බැටරි ඉලෙක්ට්‍රෝඩ, මෝටර් වාහන සහ කෘසිබල් (crusible) සඳහා අවශ්‍යවන කාබන් බ්‍රෂ් හා පැන්සල් නිෂ්පාදන කර්මාන්තශාලා ආරම්භ කරනු ලැබේ.

- කෘෂි කර්මාන්තය සහ ධීවර කර්මාන්තය කාර්මීකරණය ඉලක්ක කරගත් යෙදවුම් ආම්පන්න නිෂ්පාදනයෙහි ලා කර්මාන්ත පද්ධතියක් බිහි කෙරේ.
- ප්‍රතිචක්‍රීකරණය ඇතුළු අපද්‍රව්‍ය කළමනාකරණය විශේෂ සහ අත්‍යවශ්‍ය කටයුත්තක් ලෙස සලකනු ලබන අතර යොදා ගත හැකි සෑම ක්ෂේත්‍රයකදීම ප්‍රතිචක්‍රීකරණය හෝ ද්විතීයික නිෂ්පාදන සිදු කිරීමට තාක්ෂණික විධි ක්‍රම යොදා ගැනේ.
- දේශීය කාර්මික නිෂ්පාදන නගා සිටුවීමේ අරමුණට බාධාකාරී ලෙස සිදු කරන කාර්මික භාණ්ඩ ආනයනය වෙනුවට දේශීය නිෂ්පාදනයට උපරිම ආරක්ෂණය සැලසෙන ආනයන ප්‍රතිපත්ති ක්‍රියාවට නැගේ.
- දේශීය කර්මාන්තයන්ට අවාසි සහගත ලෙස දැනටමත් එකඟතාවයන්ට පැමිණ ඇති ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් පිළිබඳව යළි විමර්ෂණයට ලක් කරන අතර දේශීය කර්මාන්තයන්හි වර්ධනයට වාසිදායක නව ගිවිසුම්වලට එළඹීමට ක්‍රියා කරනු ඇත.
- විදේශයන්හි ඇති ශ්‍රී ලංකා තානාපති කාර්යාල තුළ අපනයන ප්‍රවර්ධන කාර්යංශයක් පිහිටුවා දේශීය අපනයන කර්මාන්ත ප්‍රවර්ධන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම
- තෝරා ගත් ක්ෂේත්‍ර කීපයක් සඳහා මහා පරිමාණ කර්මාන්ත ඇරඹීමට විදේශීය ආයෝජකයින්ට විශේෂ සහන ලබා දීමටත් එවැනි කර්මාන්ත ලෙස ඖෂධ, වෛද්‍ය උපකරණ, ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ, පරිඝනක දෘඩාංග, නැව්, වාහන එකලස් කිරීම හා නිෂ්පාදනය, යන්ත්‍රසූත්‍ර නිෂ්පාදනයට ප්‍රමුඛතාව ලබා දේ.
- කර්මාන්ත පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය වන විදුලිය, ජල පහසුකම, ගංවතුරෙන් ආරක්ෂාවීම, අපජලය පිරිපහදුව, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ආදී සියල්ල සැපයෙන සේද වාණිජ්‍ය බැංකු, රේගු කාර්යාල, වෙළඳ මධ්‍යස්ථාන පාසැල් හා රෝහල් ආදී සේවාවන්ගෙන් යුක්ත වූද වරාය හා ගුවන් තොටුපොළ හා අනෙකුත් ප්‍රවාහන පහසුකම් සපිරුණු කර්මාන්ත නගර ස්ථාපිත කෙරේ.
- විශේෂයෙන්ම පරිසර හිතකාමී හා ක්ෂයවීමේ අනතුරක් නොමැති අමුද්‍රව්‍ය (අපද්‍රව්‍ය, ශාඛමය ද්‍රව්‍ය, මැටි, ග්‍රැපයිට් ආදී) සහ නවීනතම තාක්ෂණය (පුනර්ජනන බලශක්ති, නැනෝ, අණුක, ජෛව විද්‍යාත්මක ආදී) යොදා ගනිමින් කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත 1000ක් මුල් වසර පහ තුළ දියුණු කිරීමටත්

ඒවායෙහි නිෂ්පාදන දේශීය සහ විදේශීය වෙළඳපොළේ ප්‍රචලිත කිරීමටත් ආධාර අනුබල ලබා දීම සිදු කෙරේ.

- අමුද්‍රව්‍ය පිළිබඳ නිෂ්පාදකයින් දැනුවත් කිරීමට තොරතුරු හුවමාරු කිරීම අරමුණු කරගත් දත්ත මධ්‍යස්ථානයක් පිහිටුවේ.
- ජාතික මෙන්ම ජාත්‍යන්තර වෙළඳපොළ අවස්ථා දේශීය කර්මාන්තකරුවන්ට ලබා දීමට රජය මැදිහත්වේ.
- කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් මුහුණ දෙන ප්‍රධාන ප්‍රශ්නයක් වන නිෂ්පාදනයන්හි ගුණාත්මක මට්ටම ඉහළ දැමීම සඳහා අවශ්‍ය නවීන තාක්ෂණික හා විද්‍යාත්මක දැනුම ලබා දීමට ක්‍රියා කෙරේ.
- සුළු හා මධ්‍ය පරිමාන නිෂ්පාදන කාර්යයන්හි නිරතවන්නන් මූල්‍ය ආයතන සමග ගනුදෙනු කිරීමේදී මුහුණ දෙන ගැටලු අවම කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශයේ වෙනම ඒකකයක් ස්ථාපිත කෙරේ.

# 03. කෘෂිකර්මාන්තය

උසස් තත්වයේ බීජ නොමැතිවීම, බීජ මිල අධිකවීම හා පොහොර, ආරක්ෂාකාරී හා ඵලදායී කෘෂි රසායන, උපකරණ ආදී කෘෂි යෙදවුම්වල ප්‍රමිතියේ දුර්වලතා සහ අධික මිලද කෘෂිකර්මාන්තයේ දියුණුවට බාධාවකි.

ගබඩා සහ වෙනත් පසු අස්වනු තාක්ෂණික පහසුකම්වල හිඟය, තරුණ ප්‍රජාව කෘෂිකර්මාන්තයට යොමු නොවීමෙන් ඵලදායී ශ්‍රමය හිඟ වීම සහ රජයේ මැදිහත්වීමෙන් දියුණු වෙළඳපළක් නිර්මාණය නොකිරීමද ප්‍රමුඛ ගැටලු අතර වේ.

දේශගුණික විපර්යාස, පාංශු ඛාදනය, නාය යෑම්, ජල දූෂණය, නියඟ, ගංවතුර සහ කෘෂි ඉඩම් වෙනත් ප්‍රමුඛ නොවන අවශ්‍යතා සඳහා යොදා ගැනීම ආදී ස්වාභාවික සහ මිනිස් ක්‍රියාවන්ගෙන් සිදුවන ව්‍යසනයන් වැළැක්වීමට විධිමත් ක්‍රියාමාර්ග නොමැත. වන අලින්, වඳුරන්, ඌරන්, ඉත්තෑවන්, මොනරුන් වැනි සතුන්ගේ ආක්‍රමණ හේතුවෙන් ගොවීන් විධිමත් වගා බිම් මෙන්ම ගෙවතු වගාවන්ද අත්හැර දැමීමට සිදුව තිබේ.

කෘෂි ක්ෂේත්‍රයේ මහා පරිමාණ රාජ්‍ය හෝ පෞද්ගලික ආයෝජකයින් නොමැති වීමත් කාර්යක්ෂම සහ සංවිධානාත්මක ව්‍යාප්ති සේවාවක් නොමැතිකමත් කෘෂි භෝග විවිධාංගීකරණය නොකිරීමත් බරපතළ ගැටලු අතර ඇත. කෘෂිකාර්මික නිෂ්පාදනවලට සහතික මිල නොමැතිවීමත් පාරිභෝගිකයා සඳහා පාලන මිලක් නොමැතිකමත් නිසා ගොවියා සහ පාරිභෝගිකයා යන දෙදෙනාම අසාධාරණයට ලක්ව ඇත. කෘෂි නිෂ්පාදනයේදී පාරිසරික සහ සෞඛ්‍යයට වන බලපෑම් නිසි පරිදි මැඩපැවැත්වීමට වැඩපිළිවෙළක් නොමැත.

## විසඳුම

කෘෂිකාර්මික, පශු සම්පත් සහ ධීවර නිෂ්පාදනය සහ බෙදා හැරීම රජයේ වගකීමක් බවට පත්කරන අතර දේශීය පරිභෝජනයේ සහ අපනයනයේ වුවමනාවන් මූලික ලෙස සැලකිල්ලට ගනිමින් ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තියක් සහ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලැබේ. රාජ්‍ය, පෞද්ගලික සහ සමුපකාර යන අංශ කෘෂි නිෂ්පාදනයට සහභාගි කර ගන්නා අතර දේශීය ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම, යැපුම් මට්ටමෙන් ඔබ්බට ගිය ව්‍යවසායික කෘෂිකර්මාන්තයක් ඇති කිරීම, ආනයනය කරනු ලබන ආහාර හා කෘෂි යෙදවුම් ද්‍රව්‍ය නියාමනය කර දේශීය කෘෂි නිෂ්පාදනවල ඉල්ලුම හා පාරිසරික සුරක්ෂිතතාව සහතික කිරීම, කෘෂි නිපැයුම් අපනයනයෙන් ලබන ජාතික අදායම කීප ගුණයකින් ඉහළ දැමීම, ඵලදායී පර්යේෂණ සහ ව්‍යාප්ති කටයුතු විධිමත් කිරීම සහ කෘෂි නිෂ්පාදනය සහ බෙදා හැරීම් ආදියට අදාල සියලු මානව සම්පත් දියුණු කිරීම මේ යටතේ සිදු කෙරේ.

## ක්‍රියාමාර්ග

- කෘෂිකර්මාන්තය ආර්ථිකයේ ප්‍රමුඛ ක්ෂේත්‍රයක් ලෙස සලකා රට තුළ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම හා අපනයන වෙළඳපොළ ඉලක්ක කරගත් කාර්මීකරණයක් කෘෂිකර්මාන්තය තුළ ඇති කෙරේ.
- බීජවල අයිතිය ගොවි ජනතාව සතුවන පරිදි බීජ පර්යේෂණ ආයතන හා බීජ ගොවිපොලවල් නගා සිටුවීම සහ බීජ නිෂ්පාදන ගොවි ජනතා ජාලයක් ගොඩ නැඟේ. නව වැඩිදියුණු කළ බීජ ප්‍රභේද සහ දේශීය දෙමුහුන් ප්‍රභේද (F1) නිෂ්පාදනය කර ගොවීන්ට ලබාදීමටත් දෙමුහුන් බීජ (F1) සැකසීමේ තාක්ෂණයන් ගොවීන්ට හඳුන්වා දීමටත් පියවර ගැනේ.
- කෘෂි යෙදවුම්වල ගුණාත්මකභාවය තහවුරු කිරීම හා මිල පාලනය සඳහා රාජ්‍ය යාන්ත්‍රණයක් සකස් කෙරේ.
- කෘෂි නිපැයුම් හා පරිභෝජන ප්‍රමාණයන්, ප්‍රවාහන සහ බෙදා හැරීමේ ජාලයන් මෙන්ම වගාබිම්වල ස්වභාවයන්, කාලගුණික සහ දේශගුනික තත්ත්වයන් පිළිබඳ අඛණ්ඩ අධ්‍යයනයන් සිදු කරමින් දිවයින පුරා විසිරී සිටින වී, පළතුරු, එළවළු, අල, ලොකු ළූනු ආදී වගාවන්හි නිරත ගොවි ජනතාවට ඉදිරියේදී වගා කළ යුතු භෝග වර්ග සහ ප්‍රමාණයන් සම්බන්ධයෙන් අවබෝධයක් ලබා දීමට නවීන තාක්ෂණයෙන් සමන්විත පර්යේෂණ අංශයක් ස්ථාපිත කෙරේ. එමගින් ගොවීන්ට සිදුවන පාඩු, නාස්තිය සහ පාරිභෝගිකයින් මුහුණ දෙන ගැටලු අවම කිරීමටත් අනතුරුදායක ලෙස කෘෂි රසායන ආදිය යොදා ගනිමින් අස්වැන්න ඉහළ දැමීමට ගොවීන් ගන්නා උත්සාහයත් අවම වනු ඇත.

- පුරන්වූ හෝ වගාවන් අතහැර දැමූ ගොවිබිම් පිළිබඳව විද්‍යාත්මක පර්යේෂණ සිදු කර ඵලදායී භෝග වගා කළ හැකි ආකාරයට සහ අයිතියට බලපෑමක් නොවන පරිදි සංවර්ධනය කිරීමට රජයේ හෝ පෞද්ගලික අංශයේ අදාළ සියලු ආයතන මෙහෙයවනු ඇත.
- වගාවන් සිදු කරන කුඩා ඉඩම් කට්ටි හිමි ගොවීන්ගේ ඉඩම් අයිතිය නිරවුල්ව පවත්වා ගනිමින් වගාව, ජල කළමණාකරණය, පලිබෝධනාශනය සහ අස්වනු නෙළීම ආදී කෘෂිකර්මයේ සියලු කටයුතු ඉහළ තාක්ෂණයෙන් සහ ඒකාබද්ධ සාමූහික ගොවිපොළ පදනමින් සිදු කිරීමට අවශ්‍ය සංවිධාන ව්‍යුහයන් ඇති කෙරේ. එමගින් සමස්ත ඵලදාව ඉහළ නංවා ගැනීමටත් වගා හානි අවමකර ආදායම් ස්ථාවර කර ගැනීමටත් හැකිවනු ඇත.
- කාබනික පොහොර සහ මිනිසාට හිතකර ජෛව තාක්ෂණයේ යොදා ගැනීම් ප්‍රවර්ධනය කෙරේ.
- කෘෂි නිශ්පාදනවල මිල උච්චාවචනය පාලනය කිරීම අරමුණු කරගත් ජාතික වගා සැලැස්මක් සකස් කොට ක්‍රියාත්මක කරනු ලැබේ.
- වී මිලදී ගැනීම සඳහා රාජ්‍ය දායකත්වය ඉහළ දමන අතර මිල තීරණය කිරීමේ සූත්‍රයක් හඳුන්වා දේ. වාර්ෂිකව ස්ථාවර මිල ප්‍රකාශ කිරීම හා මිල සඳහා නීතිමය ආවරණයක් ස්ථාපිත කෙරේ.
- පසු අස්වනු නාස්තිය අවම කර ගනිමින් අස්වනු නෙළීම, ඇසුරුම්කරණය, ප්‍රවාහනය සහ ගබඩාකරණය පිළිබඳ දැනට පවතින තත්වයන් සම්බන්ධයෙන් ජාතික මට්ටමේ සමීක්ෂණයක් සිදුකර ඒ සඳහා තිරසාර ක්‍රමවේදයන් සකස් කෙරේ.
- සාම්ප්‍රදායිකව අපනයනය කරනු ලබන බෝගවලට අමතරව වෙනත් බෝග අපනයනය ඉලක්ක කර වගා කෙරේ. (මේ සඳහා විදේශ වෙළඳපොළවල හිඟව පවතින වැඩි ඉල්ලුමක් ඇති අත්‍යවශ්‍ය බෝග ප්‍රවර්ධනය කෙරේ.)
- කෘෂි ක්ෂේත්‍රයට අදාළ විද්‍යාත්මක පර්යේෂණ සහ සංවර්ධන කටයුතු මෙන්ම නව තාක්ෂණය බිම් මට්ටමේ ව්‍යාප්ත කිරීම සම්බන්ධන්ධයෙන් දැනට ඇති සියලු ගැටලු සම්බන්ධයෙන් දැඩි අවධානය යොමු කෙරේ.
- කෘෂි නිෂ්පාදන මත ක්‍රියාත්මක ආහාරමය නොවන නිෂ්පාදන (උදා- මල්, ඖෂධ පැලෑටි) ආශ්‍රිත කර්මාන්ත පද්ධතියක් ඇති කෙරේ.
- කෘෂිකාර්මික ඉඩම් චිරස්ථායී භාවිතයට අවශ්‍ය මූලික උපමාන සැකසීම සිදුකරන අතර ඉඩම් අයිතිය, අඳගොවි අයිතිය, කෘෂි ඉඩම් ගොඩ කිරීම සහ නව ඉඩම් ලබාදීම වැනි වැදගත් මූලික අංග සඳහා ප්‍රජා සහභාගිත්වය තහවුරු කිරීම.

- කෘෂි තාක්ෂණය හා දියුණු කළමනාකරණය ගොවි ජනතාව වෙත ගෙන යාම සඳහාත් ඵලදායීතාව වැඩි කිරීම සඳහාත් ඉවහල්වන ආදර්ශ ගොවිපොල පද්ධතියක් ඇති කෙරේ.
- බිම් සැකසීම සහ අනෙකුත් යන්ත්‍ර සූත්‍ර සුලබ කිරීම සඳහා රජය මැදිහත් වීමෙන් පළාත්පාලන ආයතන මගින් ගොවීන්ට සහන කුලී පදනමක් මත යන්ත්‍රෝපකරණ ලබා දේ.
- රටට අවශ්‍ය යන්ත්‍ර උපකරණ රට තුළම නිෂ්පාදනයට අවශ්‍ය පර්යේෂණ සිදුකෙරෙන අතර ඒවා කර්මාන්තයක් ලෙස නිපදවීමට අවශ්‍ය රාජ්‍ය මැදිහත්වීම සහතික කෙරේ.
- පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ යටිතල පහසුකම් දියුණු කිරීමට (පුහුණු, අරමුදල්, පර්යේෂනාගාර ආදී) දේශීය අවශ්‍යතාවයන් හඳුනා ගනිමින් ඒවාට ප්‍රමුඛතාවය හිමිවන පරිදි පර්යේෂණ සිදුකිරීමට සහ ගොවි සහභාගිත්වයෙන් යුත් පර්යේෂණ ක්‍රමවේදයක් හඳුන්වාදී ක්‍රියාත්මක කිරීමට පියවර ගැනේ.
- ගොවීන් නිශ්චිත ප්‍රමාණයක් සමඟ ගනුදෙනු කළ හැකි වන පරිදි ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් පත් කිරීම හා ගොවීන් සාමූහිකකරණය කෙරේ. නිෂ්පාදන ඒකකයන් ඉලක්ක කර කෘෂි ව්‍යාප්තිකාරකයන් මඟින් අවසන් නිෂ්පාදනයේ ප්‍රමාණය ඉහළ දැමීම සිදු කෙරේ.
- කෘෂි සමුපකාර ක්‍රමය හඳුන්වා දීම, කෘෂි නිෂ්පාදන සමිති හඳුන්වා දේ. ගොවි පවුල් 400ක් හෝ නිෂ්පාදන ගම්මානයක්/ ඒකකයක් ලෙස සලකා නව තාක්ෂණයන් ආදර්ශනයක් මඟින් ගොවීන් වෙත ගෙන යෑමේ ක්‍රියාවලියක් ඇති කෙරේ.
- රටේ කෘෂිකාර්මික නිෂ්පාදනය පදනම් කරගෙන කෘෂිකාර්මික පුහුණුව හා කෘෂි අධ්‍යාපනය මෙහෙයවේ.
- දැනට පවතින ඉතා සංකීර්ණ හා ඉහළ පොලී අනුපාතික සහිත ණය ක්‍රම වෙනුවට සරල වූත් සාධාරණ වූත් කෘෂි ව්‍යවසායකත්ව ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දී ක්‍රියාත්මක කෙරේ.
- පවතින දේශගුණික විපර්යාස ආවරණය වන පරිදි රාජ්‍ය මැදිහත්වීම සහිතව ගොවි සහභාගිත්වයෙන් ගොවීන්ට වැඩි ප්‍රතිලාභ ලබාදෙන කෘෂි රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කෙරේ.
- ගොවි ජනතාවට උසස් සංස්කෘතික ජීවිතයක් උරුම කර දීම සහ විශ්‍රාමික ගොවිජන ජීවිතය සුරැකීම රජයේ ප්‍රමුඛතම කාර්යභාරයක් බවට පත්කෙරේ.
- කෘෂිකර්මාන්තය මත පදනම්වූ ද්විතීයික හා තෘතීයික කර්මාන්ත පද්ධතියක් ආරම්භ කෙරේ.

- කෘෂිකර්ම, පශු සම්පත් සහ ධීවර ක්ෂේත්‍රයන්හි නිරත පුද්ගලයින් දැනට පෙළෙන ණය බරින් නිදහස් කිරීමට රජය මැදිහත්වන අතර කර්මාන්තය සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය සහ මුදල් කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනයක්ද ඇතුළත් නව සහනදායී ණය ක්‍රමයක් ඇති කෙරේ.
- වී සහ අනෙකුත් බෝග සඳහාත් විවිධ දේශගුණික පදනමිනුත් දැනට පිහිටුවා ඇති පර්යේෂණ ආයතන පද්ධතියට අවශ්‍ය භෞතික හා මානව සම්පත් ලබා දීම සහ අවශ්‍ය ස්ථානවල නව ප්‍රදේශීය පර්යේෂණ ආයතන පිහිටුවේ.
- අධි අස්වනු බීජ නිෂ්පාදනය සඳහා දේශීය පර්යේෂණාගාර යොමු කිරීම හා විදේශ බීජ වෙළඳ අධිකාරිය බිඳ දැමිය හැකි දේශීය බීජ නිෂ්පාදනය දියුණු කෙරේ.
- ජාන මංකොල්ලය වැළැක්වීම සහ අප රටට ආවේණික බීජවල ජාන සඳහා පේටන්ට් අයිතිය ශ්‍රී ලකා රජය වෙත ලබා ගැනීමට කටයුතු කෙරේ.
- කෘෂි රසායනවල ප්‍රමිතිය, නිෂ්පාදනය, අලෙවිය, ප්‍රචාරණය හා වෙනත් ගැටලු පිළිබඳ වගකියන ජාතික පාලනාධිකාරියක් පිහිටුවේ.
- යූරියා ඇතුළු අත්‍යාවශ්‍ය පොහොර නිපදවීම සඳහා රාජ්‍ය පොහොර නිෂ්පාදන සමාගමක් ආරම්භ කෙරේ.
- ජංගම පාංශු පර්යේෂණාගාර ආරම්භ කරන අතර ඒමගින් ප්‍රදේශයේ පසේ ස්වභාවයට උචිත වගාවන් සහ කෘෂි යොදවුම්වල ප්‍රමාණයන් තීරණය කෙරේ.
- කාබනික හා අකාබනික පොහොර යෙදීම ක්‍රමානුකූලව කිරීම හා කාබනික පොහොර නිෂ්පාදනය කර්මාන්තයක් ලෙස ප්‍රචලිත කිරීමට ක්‍රියා කෙරේ.
- පසු අස්වනු හානිය අවම කිරීමට අවශ්‍ය ඇසුරුම්, ප්‍රවාහන මාධ්‍ය, ශීතාගාර, ගබඩා වැනි නවීන තාක්ෂණයන් හඳුන්වාදීමත් ඒ සඳහා ජන සහභාගිත්වය යොදා ගැනීමත් සිදුකෙරේ.
- අත්‍යවශ්‍ය පොහොර වර්ග සියලුම ගොවීන්ට සහනදායී මිලකට ලබා දේ.
- සතුන්ගෙන් ඇතිවන හානි අවම කිරීම සඳහා විද්‍යාත්මක පර්යේෂණ සිදු කර ඊට අදාල තාක්ෂණික ක්‍රමවේද ගොවීන් අතර ප්‍රචලිත කෙරේ.
- ප්‍රාදේශීය මට්ටමින් කෘෂි අලෙවිසැල් ජාලයක් රජයේ මැදිහත්වීමෙන් ආරම්භ කෙරේ.
- විසිතුරු මල් හා පැළ විශේෂයෙන් අපනයන වෙළඳපළ ඉලක්ක කර ගනිමින් වැඩි දියුණු කරන අතර මල් හා පැළ වර්ග අපනයනය ඉලක්ක කරගත් රාජ්‍ය ගොවිපළ පිහිටුවේ.

- කෘෂි රක්ෂණ ක්‍රමයක් සහ ගොවි පවුල්වල දරුවන් අධ්‍යාපනිකව නගා සිටුවන වැඩපිළිවෙළක් යාවත්කාලීන හා ශක්තිමත් කරන අතර ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය ගොවීන්ට උපරිම වාසි ලැබෙන ලෙස සකස් කෙරේ.
- සෞඛ්‍යයට සහ ජෛව පද්ධතියට හානිදායක නොවන සහ ඵලදායී තාක්ෂණික ක්‍රම ගොවීන් අතර ප්‍රචලිත කිරීම රජයේ ප්‍රමුඛ වගකීමක් බවට පත්වේ.
- කෘෂි කර්මාන්තයට අදාළ ජල කළමනාකාරණයට හා ජලයේ ආරක්ෂාවට පිහිටුවා ඇති විවිධාකාරයේ ආයතන ඒකාබද්ධ කර ගොවි ජනතාවගේ සහයෝගය සහිත නව ජල කළමනාකරණ ක්‍රමවේදයක් ඇති කෙරේ. වැසි ජලය ගබඩා කිරීම, ක්ෂුද්‍ර හා විසිරුම් පද්ධති වැනි නවීන ජල තාක්ෂණයන් ගොවීන්ට හඳුන්වා දේ.
- දියුණු තාක්ෂණයන් යොදා ගන්නා විදේශීය ගොවිපොළවල අත්දැකීම් ලබා ගැනීම සඳහා ගොවීන් දහස බැගින් වාර්ෂිකව යොමු කෙරේ.
- සෑම නිවසකම වීය පිහිටි ඉඩමේ ප්‍රමාණය අනුව ඉහළ වටිනාකමින් යුත් දැව ලබාදෙන ගස් වර්ග සිටුවීමට ගොවීන් දිරිමත් කෙරේ.
- ඉහළ වටිනාකමකින් යුත් අපනයන තත්වයේ කෘෂි නිෂ්පාදන රික්තක තාක්‍ෂණය ඔස්සේ ඇසුරුම් කොට සැකසීමේ පහසුකම් සැකසේ.

## 04. පශු සම්පත්

විශේෂයෙන්ම රජයේ මැදිහත්වීම අවම වී තිබීම හේතුවෙන් පශු සම්පත් ක්ෂේත්‍රයේ පුළුල් සංවර්ධනයක් කරා ගමන් කිරීමට නොහැකිවී ඇත. විරැකියා ගැටලුව විසඳීමේදී ආහාර වුවමනාවන් සම්පූර්ණ කර ගැනීමේදීද අපනයන ආදායම වැඩිකර ගැනීමේදීද මෙම ක්ෂේත්‍රය මහා පරිමාණයෙන් දායක කරගත හැකිව තිබුණද එම ඉලක්ක සපුරා ගැනීමට අපි අද වනතුරු අසමත්වී සිටිමු. පරිභෝජනය කරන කිරි ආශ්‍රිත නිෂ්පාදනවලින් 65%ක් ආනයනය කරන අතර ඒ සඳහා වාර්ෂිකව රු. මිලියන 40,000ක් පමණ වැය කරයි. පශු සම්පත් ක්ෂේත්‍රය සඳහා මධ්‍යම සැලැස්මක් සහ මෙහෙයවීමක් නොමැතිකමින් එම ක්ෂේත්‍රය අසංවිධිත වී ඇති අතර එම නිසාම වියදම් අධික වීමත් අඩු මිලට අලෙවි කිරීමට සිදුව තිබීමත් විශාල වශයෙන් කිරි, මස්, බිත්තර සහ ඒවායින් සකස් කළ ආහාර අපතේ යාමත් ප්‍රධාන ගැටලු වී ඇත.

තනි කාර්ය සහ ද්විත්ව කාර්යය උසස් තත්වයේ නිෂ්පාදන සතුන් නොමැතිවීම සහ එම සතුන් දේශීයව නිෂ්පාදනය කර ගැනීමට නොහැකි වීමත් ප්‍රධාන ගැටලුවකි. පශු පාලනය සඳහා විධිමත් ව්‍යාප්ති සේවයක් නොමැතිවීමත් ප්‍රමාණවත් පශු වෛද්‍ය සේවාවක් නොමැතිවීමත් නිසා දියුණු තාක්ෂණ ක්‍රම සහ දියුණු පශු පාලන ක්‍රම පිළිබඳව ගොවීන් වෙත අධ්‍යාපනය හා උපදෙස් ලබා දීමේ ක්‍රමවත් වැඩපිළිවෙළක්ද නොමැත.

තෘණ භූමි වගා කිරීමේ සහ සංවර්ධනය කිරීමේ ජාතික වැඩපිළිවෙළක් නොමැති වීමෙන් පෝෂණ ගුණයෙන් ඉහළ දේශීයව හඳුන්වා දී ඇති හැකි තෘණ වර්ග සහ ශාක වර්ග ප්‍රයෝජනයට නොගැනීමත් මහ කන්නයේදී අධික තෘණ අස්වැන්නක් අපතේ යන අතර යල කන්නයේදී තෘණ හිඟයක් පැවතීමත් ක්ෂේත්‍රයේ පවතින තවත් ගැටලුවකි.

## විසඳුම

පශු සම්පත් ක්ෂේත්‍රයේ සංවිධානය, කළමනාකරණය, නිෂ්පාදනය, දේශීය මිලදී ගැනීම් සහ අලෙවිය, අපනයනය සහ අත්‍යවශ්‍ය ආනයනය, අභිජනනය, පර්යේෂණ සහ දැනුම හා තාක්ෂණය ගොවීන් අතර ව්‍යාප්ත කිරිම යන අංශ මෙහෙයවීම සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මධ්‍යම අධිකාරියක් පිහිටුවා ජාතික පශු සම්පත් සංවර්ධන සැලැස්මක් ක්‍රියාත්මක කෙරේ.

## ක්‍රියාමාර්ග

- පශු සම්පත් නිෂ්පාදනයට දායකවන සියලුම පරිමාණයේ ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන පිරිවැය අවම වනු පිණිස මෙන්ම ඔවුන් දිරි ගැන්වීම උදෙසා කිරි, බිත්තර හා මස් නිෂ්පාදනයෙහි විවිධ අවධි හා බැඳුණු අභියෝග ඉලක්ක කරගත් ව්‍යාපෘති ජාලයක් එකී ව්‍යවසායකයින් උදෙසා සැලසුම් කර ක්‍රියාත්මක කරවීමට රජයේ ආයතන මෙහෙයවේ.
- කිරි, බිත්තර හා මස් නිෂ්පාදන වෙළඳපොළ මිලෙන් වැඩිම ප්‍රතිශතයක හිමිකම නිෂ්පාදකයන්ට ලබා ගැනීමට හැකිවන පරිදි මෙන්ම තම කර්මාන්ත හා නිෂ්පාදන පිළිබඳ ජාතික ප්‍රතිපත්තීන්ටද බලපෑ හැකි සත්ව නිෂ්පාදකයන් ඇතුළත් ගොවිජන අධිකාරියක් පිහිටුවේ.
- තෘණ වගා කළ හැකි සෑම භූමියකම ඒ ඒ දේශගුණික හා පාංශු තත්වයන්ට ඔරොත්තු දෙන සහ වැඩි අස්වනු ලබා දෙන දියුණු තෘණ වර්ග හා ශාක වර්ග වගා කිරීම සහ ප්‍රචලිත කිරීමට රජය මැදිහත්වේ.
- කිරි ගම්මාන 1000 නගා සිටුවීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන අතර යෝගට්, චීස්, මුදවපු කිරි ඇතුළු වෙනත් කිරි ආශ්‍රිත නිෂ්පාදන දේශීය සහ ජාත්‍යන්තර වෙළඳපොළෙහි ප්‍රචලිත කිරීමට රජය මැදිහත්වේ.
- කිරි නිෂ්පාදනය වේගවත්ව වර්ධනය කිරීමේ අරමුණින් මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් එම කෙෂ්ත්‍රයන් තුළ ආයෝජනය කිරීම දිරිමත් කිරීමට පියවර ගැනේ.

- රටට අවශ්‍ය සියලුම නැවුම් කිරි සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන මුළුමනින්ම රට තුළ නිපදවීමට අවශ්‍ය සැලැස්මක් ක්‍රියාත්මක කෙරේ.

# 05. ධීවර හා ජලජ කර්මාන්තය

ධීවර ක්ෂේත්‍රයේ පවතින ප්‍රධාන ගැටලුව වී ඇත්තේද ඒ පිළිබඳ ජාතික සැලැස්මක් නොමැති වීමය. ඉන්ධන, ධීවර ආම්පන්න, බෝට්ටු ඇතුළු අනෙකුත් නිෂ්පාදන යෙදවුම් මිල ඉහළයාම නිසා නිෂ්පාදන මිල අධික වී ඇත. විනාශකාරී අස්වනු නෙළීමේ ක්‍රම භාවිතයත් අයිස් නිෂ්පාදනාගාර සහ ශීතාගාර ප්‍රමාණවත් නොවීමත් හේතුවෙන් මත්ස්‍ය අස්වැන්න විශාල ප්‍රමාණයක් අපතේ යෑමත් බෙදා හැරීමේ ක්‍රම වේදයේ පවතින දුර්වලතාවයනුත් ක්ෂේත්‍රයෙහි දියුණුවට මහත් සේ බලපා තිබේ.

අභ්‍යන්තර ධීවර කටයුතු සඳහා රජයේ අඩු මැදිහත්වීමත් කරවල සහ උම්බලකඩ ඇතුළු මත්ස්‍ය නිෂ්පාදන සඳහා සංවිධිත වැඩපිළිවෙළක් නොමැතිකමත් ගැටලුවක් වී ඇත. සියලු ධීවර කාර්මිකයින් සඳහා පුළුල් අධ්‍යාපනික සහ පුහුණු වැඩපිළිවෙළක් නොමැතිකමත් ධීවරයින්ට බලපාන නිවාස, සෞඛ්‍යය, ජලය වැනි බරපතළ ගැටලුවලට මෙතෙක් මෙතෙක් කිසිදු පාලකයෙක් පිළිතුරු සෙවීමට අසමත් වීමත් ධීවර කර්මාන්තයේ ප්‍රගතිය අඩාල කර තිබේ.

## විසඳුම

ආර්ථික වශයෙන් සමෘධිමත් රටක් ගොඩ නැගීම සඳහා ජාතික ධීවර ප්‍රතිපත්තියක් යටතේ ධීවර කර්මාන්තය පුළුල් කාර්මීකරණයට ලක් කරනු ඇත. දේශීය මත්ස්‍ය නිෂ්පාදන ඉල්ලුම සැපිරීමත් මත්ස්‍ය නිෂ්පාදන අපනයනය ඉලක්කකර ගනිමින් ධීවර කර්මාන්තය මුළුමනින්ම ප්‍රතිසංවිධානය කෙරේ.

## ක්‍රියාමාර්ග

- ධීවර ක්ෂේත්‍රය සම්බන්ධ සියලු පිරිස් සම්බන්ධ කරගත් පුළුල් සාකච්ඡාවකින් සියලු ක්ෂේත්‍ර ආවරණය කරගනිමින් ජාතික ප්‍රතිපත්තියක් මාස හයක් තුළ සකස් කෙරේ.
- ධීවර කර්මාන්තය සඳහා දැනට පිහිටුවා ඇති ධීවර වරායන් 19 සහ ඉදිරි වසර දෙක තුළ අලුතින් ඉදිකරන ධීවර වරාය 10ක් (කලමැටිය, ගන්දර, සිලාවතුර, පේසාලේ, පේදුරු තුඩුව, මුලතිව් ආදී) කේන්ද්‍ර කරගත් මත්ස්‍ය නිෂ්පාදන සැකසුම් කර්මාන්තශාලා (Processing factories) පිහිටු.

- දැනට ඇති නැංගුරම්පොළවල් 58ට අමතරව නව නැංගුරම්පොළවල් පිහිටුවනු ඇති අතර පළමු වසර තුළ ඉන් 25ක් ස්ථාපිත කෙරේ. දැනට ඇති 880ක් පමණවන තොටුපොළ ප්‍රමාණය සංවර්ධනය කෙරේ.
- දැනට තිබෙන මිරිදිය මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන ප්‍රමාණවත් නොවන හෙයින් ඒවායේ පහසුකම් වැඩි කිරීමත් අභ්‍යන්තර ජල ජීවී වගාවට ප්‍රමාණවත් ලෙස අභිජනන මධ්‍යස්ථාන ඇති කිරීමටත් ලංකාවට වඩාත් උචිත නව මත්ස්‍යය විශේෂ හඳුන්වා දීමත් සිදු කෙරේ.
- ශ්‍රී ලංකාවට අයත් මුහුදු සීමාවේ ඇති ජලජ ජීවී සම්පත් පිළිබඳව විධිමත් සමීක්ෂණයක් සිදු කෙරේ.
- මත්ස්‍ය සහ ජලජ පැළෑටි ආශ්‍රිත ආහාර නිෂ්පාදනය සඳහා කර්මාන්තශාලා ආරම්භ කෙරේ.
- මුහුදේදී සිදුවන ස්වභාවික විපත් කල්ඇතිව දැනුවත් කිරීම සඳහා වරාය, නැංගුරම් තොටුපොළ හා තොටුපොළ මට්ටමේ ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කිරීමටත් ධීවර යාත්‍රාවලට දියුණු තාක්ෂණික මෙවලම් ලබා දීමටත් කටයුතු කෙරේ.
- ඉන්දියාව ඇතුළු විදෙස් රටවල ධීවර යාත්‍රා මගින් සිදුවන ධීවර ආක්‍රමණය සම්පූර්ණයෙන් වැළැක්වීමට කටයුතු කෙරෙන අතර මෙරට ධීවරයන්ට අවශ්‍ය ආරක්ෂාව සැලසීමට කටයුතු කෙරේ.
- ග්‍රාමීය කුඩා වැව් 10,000ක මත්ස්‍ය වගාව ව්‍යාප්ත කර මිරිදිය ධීවර කර්මාන්තය නගාසිටුවීමට අවශ්‍ය අනෙකුත් සියලු උපකාරක සේවාවන් නගාසිටුවීමට කටයුතු කෙරේ.
- ධීවර ජනතාව මුහුණපා සිටින බරපතළ ගැටලු වන නිවාස, පානීය ජලය, සෞඛ්‍ය වැනි ගැටලු වහාම විසඳීම සඳහා ඊට අදාල අංශ සමග එක්ව කඩිනම් ක්‍රියාමාර්ග ගැනේ.
- සියලු ධීවර වෘත්තිකයින් සඳහා රජයේ පොදු විශ්‍රාම වැටුප් වැඩපිළිවෙළ යටතේ විශ්‍රාම වැටුප් ලබා දේ.
- මුහුදේ දී සිදුවන ධීවරයෙකුගේ ජීවිත හානියක් වෙනුවෙන් රුපියල් ලක්ෂ 10ක රක්ෂණාවරණයක් පිරිනැමේ.
- ධීවර ප්‍රජාව සමාජයීය, සංස්කෘතික හා අධ්‍යාපනික ලෙස නගා සිටුවීමට කඩිනම් පියවර ගැනේ.
- පාරිභෝගික ජනතාවට සහන මිලට තත්වයෙන් උසස් මත්ස්‍ය නිෂ්පාදන මිලදී ගැනීම සඳහා ධීවර සංස්ථා අලෙවි සැල් ජාලයක් රට පුරා විවෘත කරන අතර පළමු වසර තුළ 100ක් අලුතින් ආරම්භ කෙරේ.

# 06. වැවිලි කර්මාන්තය

තේ, පොල් සහ රබර් වගාවන් සඳහා රටේ භූමි ප්‍රමාණයෙන් සැලකිය යුතු ඉඩම් ප්‍රමාණයක් වෙන්කර තිබුණද එම ඉඩම් ප්‍රමාණය සහ වැය කරන ශ්‍රමය සැලකීමේදී මහජනතාවට අවසානයේ ලැබෙන ප්‍රතිලාභය ඉතා අඩු මට්ටමක පවතී. එම වගාවන්ට දියුණු තාක්ෂණය එක්වන්නේ ඉතා අඩුවෙන් වන අතර විශාල භූමි ප්‍රමාණයක් වල් බිහිවී ඇත. පෞද්ගලීකරණය කරන ලද වතු සංවර්ධනය කිරීම නිසි පරිදි සිදු නොවන අතර අඩු වැටුප් සහ පහසුකම් හේතුවෙන් ශ්‍රමිකයෝ විශාල වශයෙන් වැවිලි කර්මාන්තයෙන් ඉවත් වෙමින් සිටිති. නිෂ්පාදන විවිධාංගීකරණයට සහ අලෙවියට රජයේ මැදිහත්වීම ප්‍රමාණවත් නොවීමද තවත් ගැටලුවකි.

## විසඳුම්

දැනට බිඳවැටී ඇති ලංකාවේ වැවිලි කර්මාන්තය නගාසිටුවීම හා නවීකරණය කිරීම සඳහා නව තාක්ෂණික දැනුම ලබාදෙමින්ද ඒ පිළිබඳව වන පැරණි ආකල්ප වෙනුවට නව ආකල්ප ඇති කරවමින්ද එය විදේශ වෙළඳපොළ ඉලක්ක කරගත් හා රටට විදේශ විනිමය ලබාගත හැකි ක්ෂේත්‍රයක් ලෙස සංවර්ධනය කිරීමට කටයුතු කෙරේ. මේ සඳහා රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ දෙකම ශක්තිමත් කිරීමට පියවර ගැනේ.

## ක්‍රියාමාර්ග

- තේ, රබර්, පොල් නිෂ්පාදනය හා ඒවා ආශ්‍රිතව කර්මාන්ත නව තාක්ෂණය හා දියුණු කළමනාකරණය යොදාගනිමින් නවීකරණයට හා කාර්මීකරණයට ලක් කෙරේ.
- තේ නිෂ්පාදනය, රබර් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන ඉහළ ගුණාත්මකභාවයකින් යුක්තව සිදු කෙරෙන අතර ඒවා සඳහා විදේශ වෙළඳපොළ පුළුල් කර ගැනීමට වෙළඳ තානාපති සේවාව ශක්තිමත් කෙරේ.
- පෞද්ගලීකරණයෙන් පසුව තවදුරටත් ඵලදායීතාවය හා නිෂ්පාදනය වර්ධනයවී නොමැති මහා පරිමාණයේ තේ, රබර්, පොල්, වතු පිළිබඳ විමර්ශනයක් සිදුකොට ශ්‍රමිකයින්ද ඇතුළත් නව කළමනාකරණයක් යටතට පත් කෙරේ.
- වතු ක්ෂේත්‍රයේ රැකියාවල නියුතු ජනතාවගේ රැකියා සුරක්ෂිත කිරීම, එම ජනතාවට උසස් ජීවන තත්වයක් හා ඉහළ සංස්කෘතික ජීවිතයක් උරුමකර දීම සහ විශ්‍රාමික ශ්‍රමිකයින් සුරැකීම රජයේ ප්‍රමුඛතම කාර්යයක් බවට පත් කෙරේ.
- දෛනික වැටුප රු. 1000 දක්වා වැඩි කළ හැකි ආකාරයට රජයේ සහ පෞද්ගලික වතුවල මූල්‍ය කළමනාකරණය කඩිනමින් විධිමත් කෙරේ.

- වතුකරයේ ජීවත්වන ජනතාවගේ ඉඩම් ප්‍රශ්නයට විසඳුමක් ලෙස ඔවුන් සේවා කරන ප්‍රදේශ ආශ්‍රිතව පදිංචියට සුදුසු භූමි තෝරාගෙන ඔවුනට නිවසක් ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් බැගින් ලබා දීමට කටයුතු කෙරේ.
- කුඩා තේ වතු හිමියන් ඇතුළු සුළු පරිමාණ සහ මධ්‍ය පරිමාණ නිෂ්පාදකයන් සඳහා අවශ්‍ය මූල්‍ය සහ කළමනාකරණ සහායන් ලබා දේ.
- රබර් සහ අමු තේ දළු සඳහා පවතින නිෂ්පාදන තත්වයට ගැලපෙන සහතික මිලක් නියමකර එය නීතිගත කෙරේ.
- කසළ තේ ජාවාරම මුළුමනින් නැවැත්වීමට පියවර ගනු ලබන අතර වැඩි ආදායමක් ඇති තේ නිෂ්පාදනය සඳහා වතු හිමියන් සහ කර්මාන්තකරුවන් දිරි ගැන්වේ.
- ස්වභාවික රබර් ආශ්‍රිත නිමි නිෂ්පාදනය සඳහා පවතින කර්මාන්තශාලා පුළුල් කිරීමටත් නව කර්මාන්තශාලා බිහි කිරීමටත් පියවර ගැනේ.
- කුරුඳු වගාව නව පදනමක් මත වර්ධනය කිරීමත්, කුරුඳු වගාවට සම්බන්ධ සියලු දෙනා මුහුණ දෙන ගැටලු සඳහා කඩිනම් විසඳුම් ලබා දීමටත් අවශ්‍ය පියවර ගැනේ.
- ගම්මිරිස්, කරාබුනැටි, සාදික්කා ආදී සුලු අපනයන බෝග ලෙස සලකන බෝග වගාවන් විදේශීය වෙළඳපොළ ඉලක්කර කරගෙන දියුණු කිරීම හා පුළුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනේ.
- වතු වගාවන් ආශ්‍රිතව අමතර ආර්ථික වටිනාකමක් ඇති මල්, පළතුරු, දැවමය ශාඛ වැවීමටත් සංචාරක කර්මාන්තය දියුණු කිරීමටත් පියවර ගැනේ.
- කඳුකරයේ නැවත වගා කරන ඉඩම් සම්බන්ධයෙන් විද්‍යාත්මක විශ්ලේෂණයක් සිදු කර පරිසර හානි අවම වනසේ වන, දැව, තෘණ සහ ආර්ථික වැවිලි වගාවන් විධිමත් කෙරේ. පාංශු සංරක්ෂණයට ප්‍රමුඛතාවක් දීම සඳහා නීති සකස් කර ආදාළ තාක්ෂණයන් දිරිමත් කෙරේ.
- සුළු අපනයන භෝග සහ කුළු බඩු සඳහා වූ වගාවන් සඳහා හැකි උපරිම රාජ්‍ය මැදිහත්වීම් සිදු කර දේශීය වශයෙන් ස්වංපෝෂිත වීමටත් ඉහළම විදේශ විනිමය උපයා ගැනීමටත් කටයුතු කෙරේ.
- දැව අවශ්‍යතාව ඉදිරි දශක කීපයේදී මෙරට තුළින්ම සපයා ගත හැකිවන පරිදි මුඩුබිම් ආශ්‍රිතව දේශීය ශාඛ වගා ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරේ.
- විදෙස් වෙළඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති ශාඛ සහ ඖෂධ වගාවන් ව්‍යාප්ත කර දේශීය අවශ්‍යතාව සම්පූර්ණ කිරීමටත් රැකියා සහ ජාතික ආදායම තර කිරීමටත් පියවර ගැනේ.

# 07. සංචාරක කර්මාන්තය

වත්මන් සංචාරක කර්මාන්තය ක්‍රමවත් සහ මධ්‍යගත මෙහෙයවීමකින් තොරව ක්‍රියාත්මක වේ. සංචාරක අමාත්‍යාංශයක් පැවතියද එමගින් සංචාරක ව්‍යාපාරය පහළ සිට ඉහළ දක්වා සැලසුම් කර නවීකරණය කර අප රටට හිතකර පරිදි ගොඩනැගීමට අවශ්‍ය මඟ පෙන්වීමක් සිදු නොවේ.

සංචාරක හෝටල්, නිවාඩු නිකේතන ඉදිකිරීමේදී සංචාරක ව්‍යාපාරය පිළිබඳ මනා අවබෝධයක් සහිත පිරිස් වෙත එම අවසරය ලබා දෙන ක්‍රමයක් නොකිරීමත් ප්‍රායෝගිකව ඒවායේ ප්‍රමිතියක් නොමැතිවීමත් නිසා සංචාරක හෝටල්, නිවාඩු නිකේතන ගුණාත්මක වශයෙන් අඩු තත්ත්වයේ පවතී. තවද සංචාරකයින් මුහුණ දෙන විවිධාකාරයේ හිංසාවන්, අනතුරු සහ වෙනත් බලපෑම් තුරන් කිරීම සඳහා ප්‍රමාණවත් වැඩපිළිවෙළක් නොමැතිවීමත් සංචාරකයින්ට මඟපෙන්වන්නන් විධිමත් ආයතනයක් මගින් නියමිත අධ්‍යාපනය සහ සදාචාරාත්මක ගොඩනැගීමක් යටතේ බිහි නොවීමත් නිසා ශ්‍රී ලංකාවේ ගෞරවයට හානි වන අතර සංචාරකයින්ගේ ආකර්ෂණය අඩු වීමට මේවා හේතුවී ඇත.

මනා ලෙස ගොඩනගන ලද ක්‍රමවත් හා මනා ආකර්ෂණයකින් යුතුව පවත්වා ගෙන යනු ලබන සංචාරක කලාපයන් නොමැත. කලා, සංස්කෘතික, ක්‍රීඩා ආදී ක්‍රියාකාරකම් සංචාරකයන් ඉලක්ක කර ගනිමින් සිදු නොකෙරෙන අතර සංචාරකයින් ඉලක්ක කර ගත්තාවූ නවීන කලා සංස්කෘතික රඟහල් සහ ප්‍රදර්ශනාගාර නොමැතිවීමත් සංචාරක ක්ෂේත්‍රයේ ආකර්ෂණය අඩුවීමට හේතුවී ඇත.

## විසඳුම

මෙම කර්මාන්තය පිළිබඳව විෂය දැනුම ඇති බුද්ධිමතුන්ගෙන්ද පුරාවිද්‍යාඥයින්ගෙන්ද පරිසරවේදීන්ගෙන්ද අත්දැකීම් ඇති වෘත්තීයවේදීන්ගෙන්ද කලා සංස්කෘතික ක්ෂේත්‍රයන් නියෝජනය කරන්නන්ගෙන්ද පොදු මහජනතාවගෙන්ද අදහස් සහ යෝජනා ලබා ගනිමින් මධ්‍යගත ජාතික ප්‍රතිපත්තියකට අනුකූලව සංචාරක කර්මාන්තය සංවර්ධනය කෙරේ.

## ක්‍රියාමාර්ග

- සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම පිණිස පහත සඳහන් කාණ්ඩ යටතේ වන සංචාරක කර්මාන්තයන්ට උපරිම අවධානයක් යොමු කෙරේ. එවානම්,

  1. පරිසර හිතකාමී සංචාරක කර්මාන්තය
  2. කෘෂි කර්මාන්තය බැඳුණු සංචාරක කර්මාන්තය
  3. විනෝදය සහ විවේකය සමග බැඳුණු සංචාරක කර්මාන්තය

4. අධ්‍යාපනය පදනම් කරගත් සංචාරක කර්මාන්තය

5. පවුල් ඒකක පදනම් කරගත් සංචාරක කර්මාන්තය

6. ශාරීරික සුවතාවය, ස්පා සහ ආයුර්වේද ප්‍රතිකාර පදනම් කරගත් සංචාරක කර්මාන්තය

- රටේ සංස්කෘතික වටිනාකම්, ආචාරධර්ම හා ස්වභාවික දායාදයන් ආරක්ෂාවන පරිදි හා දේශීය විදේශීය සංචාරක ප්‍රජාව ආකර්ෂණය කරන පරිදි වෙරළ ආශ්‍රිතව, කඳුකරයේ වනෝද්‍යාන ආදී වශයෙන් වන පාරිසරික කලාප සහ පුරාවිද්‍යාත්මක සංචාරක කලාප වෙන්කෙරේ.
- තෝරාගත් විශේෂ සංචාරක කලාප ආශ්‍රිතව ප්‍රාදේශීය කර්මාන්ත හා හස්ත කර්මාන්ත වැඩිදියුණු කිරීමටත් වෙළඳපොළවල් ඇති කිරීමටත් පියවර ගැනේ. ඒ යටතේ ආරම්භයක් ලෙස උසස් තත්වයෙන් යුත් ශ්‍රී ලංකාවට ආවේණික භාණ්ඩ නිෂ්පාදනය කරන ගම්මාන 30ක් බිහි කෙරේ.
- ශ්‍රී ලංකාවේ ආවේණික කලාවන් පදනම් කරගත් සංචාරක ව්‍යාපාරයක් වර්ධනය කිරීම පිණිස යොවුන් කලාකරුවන්ගේ වැඩි දායකත්වයක් ලැබෙන පරිදි ඔවුන් උනන්දුකර ඔවුන්ගේ නිර්මාණ උසස් මට්ටමේ කලාගාර හරහා විදේශීය මෙන්ම දේශීය සංචාරකයින් වෙත අලෙවි කිරීමේ වැඩපිළිවෙළක් සකස් කෙරේ.
- සංචාරකයින්ට "සාප්පු සවාරියක" අත්දැකීම වඩාත් පුළුල් ලෙස විඳ ගැනීමට අවස්ථාව සලසා දෙමින් රට පුරා සංචාරකයින් ඉලක්ක කරගත් සාප්පු සංකීර්ණ සහ ප්‍රදර්ශන ශාලා ගොඩ නැගේ.
- සංචාරක කර්මාන්තයට අදාළ රැකියා උසස් වෘත්තීය නිපුණත්වයක් සහිත ඒවා බවට ඉහළ දැමීම සඳහා පාඨමාලාවන් සහිත මධ්‍යස්ථානයක් පළමු වසර තුළ ආරම්භ කෙරේ.
- ගුවන්තොටුපළවල් සංවර්ධනය කිරීමටත් දැනට ලංකාවට දෛනිකව පැමිණෙන 70ක් පමණවන ගුවන් ගමන් සංඛ්‍යාව 150 දක්වා වැඩිකර වසරකට පැමිණෙන සංචාරකයින් සංඛ්‍යාව මිලියන 03 දක්වා වැඩි කිරීමට උපරිම උත්සාහ දැරේ.
- සංචාරකයින් මුහුණ දෙන පෞද්ගලික ගැටලුවලදී පැය 24 පුරා දින 365ම ක්ෂණිකව මැදිහත්වන සංචාරක පොලිසියද ඇතුළත් ආයතන ව්‍යුහයක් ස්ථාපිත කරන අතර රටට ඇතුල් වන සියලු සංචාරකයින්ට ගුවන්යානයේදී හෝ නැවේදීම ඊට සම්බන්ධවිය හැකි දුරකථන සහ ඊමේල් තොරතුරු සැපයේ.

- සංචාරකයින්ගේ සුළු පැමිණිලි වෙනුවෙන් සංචාරකයන් සඳහා වූ උසාවියක් ඇති කිරීම හා එමගින් පොලිසිය සහ අනෙකුත් නීති කටයුතු ක්‍රියාත්මක කිරීමේදී වැයවන කාලය අවම කිරීමට පියවර ගැනේ.
- විවිධ පුද්ගලයින්ගෙන් සංචාරකයින්ට විඳීමට සිදුවන හිරිහැරවලට එරෙහිව ඉක්මන් සහ දැඩි පියවර ගැනීම මගින් රටේ ප්‍රතිරූපය සහ සංචාරකයින්ගේ විශ්වාසනීයත්වය ආරක්ෂා කෙරේ.
- ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් ඔවුන්ගේ අදහස්, යෝජනා සහ විවේචන රජය වෙත ලබා ගැනීමේ අරමුණින් විශේෂ ඒකකයක් පිහිටුවන අතර තොරතුරු ලබා ගැනීම සඳහා දුරකතන, ඊමේල් ආදියට අමතරව ක්ෂේත්‍ර සමීක්ෂණ සිදු කෙරේ.
- සංචාරක ව්‍යාපාරය ප්‍රචලිත කිරීම සඳහා පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් ස්ථාන හා ආගමික සිද්ධස්ථානද ඇතුළු සියලු තොරතුරු ඇතුළත් ආකර්ෂණීය වෙබ් අඩවියක් සහ ජංගම දුරකථන වැඩසටහනක් (Mobile app) ලොව පුරා ක්‍රියාත්මක කරන අතර ඒ සඳහා රජයේ විදේශ සේවාව සහ විදේශ ගත ලාංකිකයින්ගේ සහායද උපරිමයෙන් ලබා ගැනේ.
- සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් Beutiful SL නමින් ජංගම දුරකථන වැඩසටහනක් (Mobile app) සකසා සංචාරකයින්ට ශ්‍රී ලංකාව තුළදී ලබාගත් ඡායාරූප මෙම වැඩසටහනට යාවත්කාලීන කිරීමට අවස්ථාව සලසා දී සෑම සතියකටම වරක් ඉන් හොඳම ඡායාරූපය තෝරා ත්‍යාග පිරිනැමීමේ වැඩසටහනක් ආරම්භ කෙරේ.
- සංචාරක කලාපයන්හි සම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම, දේශීය කලා නිර්මාණ හා දේශීය ආහාර සංචාරකයින් අතර ජනප්‍රිය කරවීමට කටයුතු කෙරේ.
- චීන, ජර්මන්, ඉන්දියානු භාෂා ඇතුළු විදේශ භාෂාවන් ඉගැන්වීම සඳහා අධ්‍යාපන ආයතන රජයෙන් ආරම්භ කෙරේ.
- පාරිසරික සංචාරය වැඩි දියුණු කිරීම පිණිස වන ජීවී උද්‍යාන සහ උද්භිද උද්‍යාන ඒවායේ සුරක්ෂිත බව රැකෙන පරිදි ආකර්ෂණීය කිරීමට පියවර ගනු ලබන අතර වනගත සංචාරක කඳවුරු බිහි කිරීම සඳහාද සැලසුම් සකස් කෙරේ.
- හෝටල් ඇතුළු නවාතැන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සහ ප්‍රමිතීන් හඳුන්වා දේ. එහිදී ළමා පරපුරේ ආරක්ෂාව ඇතුළු සමාජයීය, පාරිසරික සහ සංස්කෘතික තත්වයන් පිළිබඳව දැඩි සැලකිල්ලක් යොමු කෙරේ.
- සංචාරක හෝටල් හිමියන් මුහුණ දෙන ගැටලු සොයා බලා ඊට විසඳුම් ලබා දීමට අවශ්‍ය පියවර ගැනේ.

- පෞද්ගලික සංචාරක මගපෙන්වනන් හට විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දේ.
- සංචාරක කර්මාන්තයට සම්බන්ධ හෝටල් හිමියන්, කළමනාකරුවන්, සූපවේදීන් සහ අනෙකුත් සේවා සපයන්නන් සඳහා ලෝකයේ දියුණු සංචාරක කලාපවල අත්දැකීම් හා දැනුම ලබා ගැනීම සඳහා රජය මගින් ශිෂ්‍යත්ව ක්‍රමයක් හා දැනුම හුවමාරුකර ගැනීමේ වැඩසටහනක් ඇති කෙරේ.
- කොළඹ නගරය දකුණු ආසියාවේ සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශන කේන්ද්‍රය ලෙස දියුණු කිරීම අරමුණු කරගනිමින් දේශීය හා විදේශීය ප්‍රධාන පෙළේ සමාගම්වලට එම යටිතල පහසුකම් ඉදිකිරීමට අවශ්‍ය දිරිගැන්වීම් ලබාදේ.

# 08. ඉඩම්

අද සිටින මිලියන 20.5 ක් වූ ලාංකේය ජනගහනයට වාර්ෂිකව 220,000 බැගින් එකතුවීමට නියමිත වුවද අපට ඇති ඉඩම් සම්පත අතිශයින් සීමාසහිතය. 2035 වනවිට මිලියන 25ක මිනිස් ප්‍රජාවකට අවශ්‍ය මූලික පහසුකම් සපයා ගැනීමේ අභියෝගය ජයගැනීම සඳහා කිසිදු ජාතික සැලැස්මක් නොමැති අතර හිතුමතේ ඉඩම් පරිහරණය කිරීම හේතුවෙන් ලංකාවේ ඉඩම් පිළිබඳ ගැටලුව දිනෙන් දින උග්‍ර වෙමින් තිබේ. මුහුදු ඛාදනය සහ නාය යෑම් ඇතුළු ස්වභාවික හේතූන් මත දැනට තිබෙන ඉඩම් ප්‍රමාණය අහිමි වීමත් ඉඩම් භාවිතා කළ නොහැකි පරිදි අක්‍රමවත් ඉදිකිරීම්ද කුණු සහ වෙනත් අපද්‍රව්‍ය එක්වන්නට ඉඩහැර දූෂිත තත්වයට පත් කිරීමද තත්වය තවත් බරපතළ කර ඇත.

ඊට අමතරව ඉඩම් අයිතිය නිරවුල් නොකිරීමත් ඉඩම් අහිමි විශාල පිරිසක් සිටීමත් විසින් ලංකාවේ ඉඩම් ගැටලුව උග්‍ර සමාජ අර්බුදයන්ද නිර්මාණය කර තිබේ.

## විසඳුම

ඉඩම් හා ඉඩම් පරිහරණය පිළිබඳ ජාතික ඉඩම් ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ නීතිගත කෙරේ. ඒ යටතේ පාරිසරික සංරක්ෂණය, ජනාවාස, කර්මාන්ත, කෘෂිකාර්මික, වාරිමාර්ග සහ වෙනත් ඉදිකිරීම් ආදී සියලු භෞතික සංවර්ධන කටයුතුවලදීත් පරිපාලන කටයුතුවලදීත් භාවිතා කළ යුතු ආකාරය ජාතික ප්‍රතිපත්තියට ඇතුළත් කෙරේ.

## ක්‍රියාමාර්ග

- ඉඩම් පරිභෝජනය, නෛතික හා පරිපාලන තත්වයන් පිළිබඳ කඩිනම් විද්‍යාත්මක ගවේෂණයක් සිදු කෙරේ.

- ජනාවාස, කෘෂිකාර්මික පොදු ඉදිකිරීම්, කර්මාන්ත, පාරිසරික පද්ධති, වෙනත් පොදු පාරිසරික වුවමනාවන් වාරිමාර්ග හා ජලාශ යනාදිය පිළිබඳව දිගුකාලීන සැලැස්මක් සහිත පුළුල් ඉඩම් ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කෙරේ.
- ඉඩම් විකිණීමේ අසංවිධානාත්මක සහ වංචනික ස්වරූපය වෙනස් කර ඉඩම් පැවරීම සහ විකිණීම වඩාත් විශ්වසනීය තත්වයට පත්කෙරේ.
- ඉඩම් අයිතිය නිරවුල්කර සියලුම ඉඩම් පිළිබඳ නිරන්තරව යාවත්කාලීනවූ තොරතුරු ඇතුළත් තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවේ.
- දැනට ඉඩම් නොමැති සියලුම දෙනාට අවශ්‍යතාවය මත ඉඩම් ලබාදීමට පියවර ගන්නා අතර තාවකාලික ඉඩම් බලපත්‍ර හිමි අය සඳහා ස්ථිර ඔප්පු ලබාදීමට පියවර ගැනේ.
- පාංශු ඛාදනය, පසට විෂ රසායන හා අහිතකර විකිරණ ද්‍රව්‍ය එක්වීම, නාය යෑම්, කැණීම් කටයුතු ආදිය නිසා සිදුවන හානි හැකි උපරිමයෙන් අවම කිරීමට පාංශු සහ ඉඩම් සංරක්ෂණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කෙරේ.
- කඩොලාන ශාක ප්‍රජාව ඇතුළු වෙනත් විශේෂ පාරිසරික පද්ධතිද සියලු තෙත් බිම්ද සංරක්ෂණයට වහා පියවර ගැනේ.
- ජලාධාර ප්‍රදේශවල ඇති බිම්, ප්‍රපාතාකාර බෑවුම් සහ උස් කඳු මුදුන් වැනි භූමි ප්‍රදේශවල කඩිනමින් නැවත වනාන්තර වගා කෙරේ.
- විද්‍යාත්මක නගර සැලසුම්කරණය මගින් නාගරික ප්‍රදේශවල ඉඩම් පරිහරණය ඵලදායී කෙරේ.
- නාය යෑම් සහ ගිලා බැසීමේ තර්ජනයට මුහුණ පා ඇති සියලු භූමි ප්‍රදේශයන් ආරක්ෂා කිරීමත් දේපොළ සහ ජීවිත පිළිබඳ ආරක්ෂාව තහවුරු කිරීමටත් ප්‍රමුඛතාව ලබා දේ.
- ඉඩම් සම්පත විදෙස් සමාගම්වලට හා විදේශිකයන්ට විකිනීම නතර කෙරේ.

# 09. ජල කළමණාකරණය සහ වාරිමාර්ග

රට මධ්‍යයේ සදාහරිත වනාන්තරවලින් යුත් වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 3000 ඉක්මවන මධ්‍යම කඳුකරයක් සහ රටේ මුළු භූමි ප්‍රමාණයෙන් 90% පමණ ආවරණය කරන මධ්‍යයේ සිට අරීයව ගලා බසින ප්‍රධාන ගංගා ද්‍රෝණි 103ක් පමණ තිබෙන්නාවූද රටේ භූමි ප්‍රමාණයෙන් 80% කට වඩා වැඩි තැනිතලා බිමක් සහිතවූද සුන්දර රටක් වන ශ්‍රී ලංකාව මේ වන විට ජලය සම්බන්ධයෙන් අර්බුදයකට ලක් කර ඇත. ගම්පහ රතුපස්වල, උතුරුමැද මෙන්ම උතුරේ චුන්නාකම් ප්‍රදේශයේ පවතින ජල ගැටලු මෙම අර්බුදය මතුපිටට පැමිණි

අවස්ථාවන් වේ. ස්වාභාවික දායාදයක් වූ ජලයට දිනෙන් දින ඉහළ යන මිලක් නියම කර තවත් වෙළඳ භාණ්ඩයක් බවට පත්කර තිබේ. ඝන අපද්‍රව්‍ය, රසායනික ද්‍රව්‍ය සහ විකිරණ කාරක එක්වීම දිනෙන් දින ඉහළ යමින් තිබෙන අතර ජල සම්පත් සාධාරණ සහ ඵලදායී ලෙස බෙදා හැරීමද අර්බුදයට ලක්ව ඇත.

සමස්ත ලෝකයටම ආදර්ශයක් වූ අපගේ වාරිමාර්ග පද්ධතිය ආරක්ෂා කිරීමත් වැඩි දියුණු කිරීමත් නිසි පරිදි සිදු නොවීමෙන් ගොවි ජනතාව සමාජ-ආර්ථික වශයෙන් අස්ථාවර තත්වයට ඇදදමා ඇත.

## විසඳුම

ජනගහනයේ මූලික වුවමනාවන් සපුරා ගැනීමත් දිගු කලීනව මිනිසාගේ සහ පරිසරයේ සහජීවී පැවැත්ම රැක ගැනීමත් අරමුණු කර ගනිමින් විද්‍යාත්මක ජල කළමනාකරණයකට අවශ්‍ය ජාතික ජල සහ වාරි කර්මාන්ත ජාතික ප්‍රතිපත්තියක් සහ වැඩපිළිවෙළක් රටට හඳුන්වා දේ. ඒ යටතේ පානීය, කර්මාන්ත, කෘෂි, ජල විදුලි, ප්‍රවාහන, සංස්කෘතික සහ පාරිසරික වුවමනාවන් මූලික වශයෙන් සැලකිල්ලට ගනිමින් මතුපිට සහ භූගත ජලය විද්‍යාත්මක ලෙස කළමනාකරණය කෙරෙන අතර ජලය පොදු සම්පතක් ලෙස සැලකීමට කටයුතු කෙරේ.

## ක්‍රියාමාර්ග

- ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරීමත් විනාශ කොට ඇති ජල පෝෂක ප්‍රදේශ යථාවත් කිරීමත් සිදු කෙරේ.
- මහා පරිමාණ නව වාරිමාර්ග ව්‍යාපෘති 10ක් අරම්භ කෙරේ.
- මහා වාරි මාර්ග ව්‍යාපාර, සුළු හා මධ්‍ය පරිමාණ වැව් පද්ධති ප්‍රතිසංස්කරණය සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනේ.
- උතුරු, නැගෙනහිර මෙන්ම උතුරු මැද කලාපයේ සහ හම්බන්තොට ප්‍රදේශයේ පවතින පානීය ජල ගැටලුව සම්පූර්ණයෙන් විසඳීමට කටයුතු කෙරේ.
- ජල සම්පත පෞද්ගලීකරණය කිරීම නතර කරන අතර ඒ අරමුණින් රට තුළ ක්‍රියාත්මක රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන විසුරුවා හැරීමට පියවර ගැනේ.
- කෘෂි ආර්ථිකයට හා පරිසරයේ පැවැත්මට සෘජු ලෙස බලපාන වැව් සහ ජලාශ සංචාරක ව්‍යාපාර වෙනුවෙන් බදු දීම නවතා දැමේ.
- ලංකාවේ භූගත ජල මූලාශ්‍ර ප්‍රශස්ථ ලෙස භාවිතා කිරීම සඳහා විද්‍යාත්මක අධ්‍යයනයක් කර භූගත ජලය භාවිතා කිරීමට විධිමත් යාන්ත්‍රණයක් සැකසේ.

- ජල සංරක්ෂණය සහ ජල පරිභෝජනය පිළිබඳව රටේ ජනතාව දැනුවත් කිරීම සහ දැවැන්ත ආකල්පමය පරිවර්තනයක් කිරීම සඳහා අධ්‍යාපනය ලබා දීමට පියවර ගන්නා අතර එමගින් ජලය වටිනා සම්පතක් ලෙස අරපිරිමැස්මෙන් පරිභෝජනය කිරීමටත් ජල මූලාශ්‍ර සහ ජල පෝෂක ප්‍රදේශ රැක ගැනීමට ප්‍රජාවගේ සහාය ලබා ගැනීමටත් කටයුතු කෙරේ.
- ලංකාවේ පැවති ආණ්ඩු විසින් දේශපාලන වාසි තකා කිසිදු භූ විද්‍යාත්මක සහ පාරිසරික ශක්‍යතා අධ්‍යනයන් නොමැතිව නිර්මාණය කළ අසාර්ථක සියලු බහු කාර්ය යෝජනා ක්‍රම (උදා- උමා ඔය) නවතා දැමීම හෝ අධ්‍යයනයන් කර රටට යහපත්වන ආකාරයට සකස් කෙරේ.

# 10. දේශීය සහ විදේශීය වෙළඳුම

ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමේ සහ ගොඩනැගීමේ ක්‍රියාවලියේදී වෙළඳපොළ ක්‍රියාකාරිත්වය අතිශයින් වැදගත් වේ. වර්තමානයේ මූලික අර්බුදය වන්නේ නිෂ්පාදනය, ආනයනය, අපනයනය, බෙදාහැරීම රටේත් ජනතාවගේ පොදු අවශ්‍යතාවයන් තෘප්ත කරනවා වෙනුවට දෙස්-විදෙස් අතළොස්සකගේ අවශ්‍යතා, ලාභ අරමුණු තෘප්තිමත් වන ආකාරයට ක්‍රියාත්මක වීමය. එනිසාම ආනයන සහ අපනයන රටට විශාල අවාසිදායක අයුරින් සිදුවීම හේතුවෙන් දේශීය හා විදේශීය වෙළඳාම දැඩි අර්බුදයකට පත්ව ඇත.දැනට ලංකාවේ අපනයන ආදායම මෙන් දෙගුණයක් ආනයනය වියදම ලෙස දැරීමට සිදුවී ඇත. 1978 වන විට ලෝක වෙළඳපොළේ ශ්‍රී ලංකාවේ අපනයන පංගුව 1/200 ක් වූ අතර එය 2014වන විට 1/2000 ක් දක්වා දරුණු ලෙස පහත වැටී තිබේ.

පාරිභෝගික ආරක්ෂක පනත සහ අධිකාරිය, සාධාරණ වෙළඳ කොමිෂන් සභා පනත සහ කොමිසම, පාරිභෝගික ආරක්ෂක අරමුදල වැනි නීතිමය සහ ව්‍යවස්ථාමය විධි විධාන හුදු පනත් සහ ආයතන බවට පත්ව අක්‍රීයව තිබේ. පොදු ජනතාව වෙළඳපොළ තුළ අතරමංවී යම් අසාධාරණයක් සිදුවූ විට තමන්ට භාණ්ඩ හෝ සේවා සපයන පුද්ගලයාට පමණක් චෝදනා කිරීම හැර වෙනත් සාධනීය පියවරක් ගැනීමට අපහසු තත්ත්වයට පත්ව ඇත.

## විසඳුම

මේ සඳහා දේශීය සහ විදේශීය වෙළඳාමේදී පෞද්ගලික අංශයේ පුළුල් දායකත්වයද සැලකිල්ලට ගෙන රජයේ පූර්ණ අධීක්ෂණය සහ අත්‍යවශ්‍ය මැදිහත්වීම් සිදුවන පරිදි ජාතික ආර්ථිකය නගා සිටුවීමට අදාළ දේශීය හා විදේශීය වෙළඳ ප්‍රතිපත්තියක් සකසේ.

# ක්‍රියාමාර්ග

- ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් සභාව යටතේ ජාතික වාණිජ මෙහෙයුම් මණ්ඩලයක් පත් කෙරේ.
- කඩිනම් ආර්ථික සංවර්ධනයේ ඉලක්ක සපුරා ගැනීම අරමුණු කරගත් අපනයන බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කෙරේ.
- විදේශ වෙළඳපොළෙන් නිෂ්පාදන ආනයනය කිරීමේදී සමාන්තර දේශීය නිෂ්පාදන සඳහා වූ වෙළඳපොළ ආරක්ෂා කෙරේ.
- ඖෂධ, අත්‍යවශ්‍ය ආහාර ආදිය හිඟයකින් තොරවද ගුණාත්මකභාවය රැකෙන පරිදි බෙදා හැරීමටද, සාධාරණ ලෙස වෙළඳාමටද රජය මැදිහත්වේ.
- අත්‍යවශ්‍ය භාන්ඩ සඳහා ජාතික මිල ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කෙරේ.
- භාණ්ඩ හා සේවා පිළිබඳ තොරතුරු, මිළ, ගුණාත්මකභාවය සහ පාරිභෝගික අයිතීන් යනාදී කරුණු පිළිබඳ පූර්ණ දැනුමක් සහ අවබෝධයක් ලබා දෙන වැඩපිළිවෙලක් රජයේ මැදිහත්වීමෙන් ක්‍රියාත්මක කෙරේ.
- ග්‍රාමීය මට්ටමේ නිෂ්පාදන දීප ව්‍යාප්තව බෙදාහැරීම සඳහා ක්‍රමවත් වෙළඳපොළ යාන්ත්‍රණයක් ගොඩනැගීම, ඒ සඳහා ගබඩා, බෙදා හැරීමේ මධ්‍යස්ථාන ග්‍රාමීය මට්ටමින් පිහිටුවේ.
- ස්වයං රැකියා ලෙස සිල්ලර වෙළඳසල් පවත්වාගෙන යන්නන්ගේ ගැටලු සම්බන්ධයෙන් මැදිහත්වීම, තාක්ෂණික මඟපෙන්වීම සහ මූල්‍ය උපදෙස් සඳහා රාජ්‍ය ආයතන ජාලයක් ප්‍රාදේශීය මට්ටමින් පිහිටුවේ.
- විවිධාකාරයේ භාණ්ඩ සහ සේවා සම්බන්ධයෙන් ප්‍රමිති නිර්ණයට සහ අධීක්ෂණයට අදාළ ආයතන සියල්ල අවශ්‍ය පරිදි පුළුල් කෙරෙන අතර දැනට ඇති ආයතනවල විෂය පථයට හසු නොවන භාණ්ඩ සහ සේවා සම්බන්ධයෙන් ආයතන සහ නෛතික තත්වයන් ඇති කෙරේ.
- වෙළඳාමට සම්බන්ධ සියලුම රාජ්‍ය, සමුපකාර සහ පෞද්ගලික අංශවල ජීවිත හා දේපොළ සඳහා රක්ෂණ ක්‍රම ඇතුළු ආරක්ෂණ ක්‍රියාමාර්ග ගැනේ.
- මෙතෙක් සියලු රජයන් වෙළඳාමට අදාලව එළඹී ඇති සියලුම ජාත්‍යන්තර සහ කලාපීය මට්ටමේ ද්වීපාර්ශවීය සහ බහු පාර්ශවීව වෙළඳ ගිවිසුම් යළි සමාලෝචනය ලක් කෙරේ.
- අන්තර්ජාලය ඇතුළු නවීන ප්‍රචාරණ ක්‍රම භාවිතා කරමින් දේශීය නිෂ්පාදන අනන්‍යතාවන් ජාත්‍යන්තර වෙළඳපොළට හඳුන්වා දීමත් ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා ලාංකේය වෙළඳ ප්‍රජාව රජයේ අනුග්‍රහයෙන් සම්බන්ධ කෙරේ.

- විදේශ වෙළඳාමෙන් උපයන විනිමය කෙටි කාලයක් තුළ ලංකාවට රැගෙන එන ව්‍යාපාරිකයින්ට, කර්මාන්තකරුවන්ට බදු සහන ලබා දේ.
- නව සරල ආනයන සහ අපනයන බදු ක්‍රමයක් හඳුන්වා දේ.
- භාණ්ඩ ආනයනයේදී සහ අපනයනයේදී ආනයන අපනයනකරුවන් මුහුණ දෙන විවිධාකාරයේ ගැටලු (අල්ලස් දීමට සිදුවීම, ප්‍රමාදවීම් ආදී) අවම කිරීම සඳහා කඩිනම් මැදිහත්වීම් සිදු කෙරේ.
- දැනට ලෝකයේත් අප රට තුළත් ව්‍යාප්ත වෙමින් පවතින (Online trading) අන්තර්ජාලය මගින් භාණ්ඩ මිලදී ගැනීමේ ප්‍රවණතාවය පුළුල් වශයෙන් ව්‍යාප්ත කෙරේ. දැනට අන්තර්ජාලය මාර්ගයෙන් භාණ්ඩ මිලදී ගන්නා පාරිභෝගිකයන් මුහුණ දෙන ගැටලු වන්නේ එක් එක් භාණ්ඩය ලෙස නැව්ගත කිරීමට සිදුවන නිසා විශාල ප්‍රවාහන පිරිවැයක් භාණ්ඩයට එක්වීමත් සැලකිය යුතු කාලයක් ගතවීම හා භාණ්ඩයක් මිලදී ගත් පසු එය ප්‍රතික්ෂේප කිරීමට නොහැකි වීමය.

  - මෙයට විසඳුම් ලෙස online trading සඳහා පාරිභෝගික ආරක්ෂක රෙගුලාසි සකස් කෙරේ.

  - තනි තනි භාණ්ඩ නැව්ගත කිරීම හා කාලය ගතවීම අවම කිරීමට online trading සඳහා පමණක් යොදාගන්නා ගබඩා සංකීර්ණ (online trading ware houses) ඉදිකරන පුද්ගලික ව්‍යසායකයින් සඳහා පළමු වසර දෙක සියලු බදු නිදහස් වරප්‍රසාදයක් ලබාදේ.

## 11. මූල්‍ය ක්ෂේත්‍රය

රටේ මූල්‍ය පදනම නිෂ්පාදන ක්‍රියාවලියේ හැකියාව මගින් පෙන්නුම් කරන අතර මූල්‍ය පදනමේ ඇති ශක්තිමත්භාවය මත ආර්ථික ශක්තිමත්භාවයද තීරණය වේ. වර්තමානයේ ලංකාව තුළ අඛණ්ඩව සිදුවන මිල ඉහළ යාම, ණය මත රඳා පැවතීමේ දිගු කාලීන වැරදි උපාය මාර්ගික මූල්‍ය ප්‍රතිපත්තීන් අනුගමනය කිරීම, විදේශ වෙළඳාම අවාසි සහගත තත්වයේ පැවතීම, නොකඩවා දිගින් දිගටම පවතින රාජ්‍ය අයවැය හිඟය සහ නිෂ්පාදන ආර්ථිකයක් නොමැතිවීම තුළ ශ්‍රී ලංකාව දැඩි මූල්‍ය අර්බුදයකට මුහුණ දෙමින් සිටී. විශේෂයෙන්ම මෙතෙක් කල් පවත්වා ගෙන යනු ලැබූ විවෘත ආර්ථික ප්‍රතිපත්තිවලට අනුකූලව මූල්‍ය ප්‍රතිපත්ති හැසිරවීම හේතුවෙන් මෙම මූල්‍ය අර්බුද පැන නැගී ඇත.

නිසියාකාරයෙන් රාජ්‍ය අංශය ජාතික ආර්ථිකයට මැදිහත් නොවීමත් සැලැස්මකින් තොරව සිදු වන විදේශ ආයෝජනයත් එමගින් සිදුවන විනිමය අස්ථාවරත්වයත් රුපියලේ අගය දිගින් දිගටම අවප්‍රමාණය වීමත් මූල්‍ය ක්ෂේත්‍රයේ කඩා වැටීමට හේතු වී ඇත. වංචා,

දූෂණ, නාස්තිය, දේශපාලන මැදිහත්වීම සහ අකාර්යක්ෂම කළමනාකරණය හේතුවෙන් විශාල පාඩු ලබන රාජ්‍ය ආයතන පද්ධතියක් පවත්වාගෙන යාමත් රටෙහි මූල්‍ය තත්වය පිරිහීමට බලපා ඇත.

රාජ්‍ය අයවැය සකස් කිරීමේදී රාජ්‍ය ආදායම සම්පූර්ණයෙන්ම බදු මත යැපීමත් අකාර්යක්ෂම බදු ප්‍රතිපත්තිත් හේතුවෙන් ජනතාවට විශාල බදු බරක් දැරීමට සිදුවීමත් අයවැය හිඟය පියවා ගැනීමට අනුගමනය කරන දුර්වල මූල්‍ය ප්‍රතිපත්තිත් මූල්‍ය ක්ෂේත්‍රයේ පිරිහීමට හේතුවී ඇත.

මූල්‍ය ආයතන සම්බන්ධයෙන් නිවැරදි මූල්‍ය ප්‍රතිපත්ති අනුගමනය නොකිරීම සහ පවතින මූල්‍ය නීතිරීති හා අණපනත් නූතනත්වයට ගැලපෙන ආකාරයට යාවත්කාලීන නොකිරීම හේතුවෙනුත් මූල්‍ය ක්ෂේත්‍රය අර්බුද ගණනාවකට මුහුණ දෙමින් සිටී.

වර්තමාන ශ්‍රී ලංකා ආර්ථිකය තුළ ක්‍රියාත්මකවන්නේ දේශීය නිෂ්පාදන හෝ ජාතික ආර්ථිකය පිළිබඳව වන කිසිදු ආරක්ෂණයකින් හෝ වගකීමකින් තොරව මුළුමනින්ම පෞද්ගලික ප්‍රාග්ධන වුවමනාවන් සහ දූෂණය පෙරදැරි කරගත් විදේශ ආයෝජන ක්‍රියාවලියකි. මෙය විදේශ ඒකාධිකාරී බලවතුන්ගේ සහ ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඇතුළු අධිරාජ්‍යවාදීන්ගේ උපදෙස් හා නියෝග මත ක්‍රියාත්මක වෙමින් පවතී.

## විසඳුම

දිගු කාලීන සහ කෙටි කාලීන සංවර්ධන ඉලක්කයන් සපුරා ගත හැකි ආකාරයට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ යටතේ රාජ්‍ය ආදායම, රාජ්‍ය වියදම සහ ආයෝජනය කාර්යක්ෂමව සහ ඵලදායී ආකාරයට හැසිරවීමටත් එහි ප්‍රතිලාභ සමස්ත ජනතාවට බෙදී යන ආකාරයටත් මූල්‍ය ප්‍රතිපත්ති පිළියෙළ කෙරෙන අතර අකාර්යක්ෂමතාව, වංචාව, දූෂණය, අයථා පරිහරණය, නාස්තිය පිටුදැකීම රජයේ අනුලංඝනීය වගකීමක් බවට පත් කෙරේ.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේදී ජාත්‍යන්තර ආර්ථිකයන්හි හැසිරීමත් නූතන මූල්‍ය වෙළඳපොළවල්හි ක්‍රියාකාරිත්වයත් රටට වාසි සහගතවන ආකාරයට හසුරුවා ගැනීමට කටයුතු කෙරේ.

මහා පරිමාණ නිෂ්පාදන සහ ව්‍යාපෘතීන් වෙනුවෙන් විදේශ ආයෝජනය ලබා ගැනීම පිළිබඳව සලකා බැලේ.

## ක්‍රියාමාර්ග

- විනිමය පාලන කටයුතු, කොටස් වෙළඳපොළ හා රජයේ ප්‍රධාන මූල්‍ය ක්‍රියාවලි රටේ ආර්ථික සුරක්ෂිතතාවය හා මූල්‍ය ස්ථාවරභාවය ආරක්ෂාවන පරිදි නියාමනය කිරීමට අවශ්‍ය නෛතික හා පරිපාලන පියවර ගැනේ.

- රාජ්‍ය බැංකු ඇතුළු මහජන උපයෝගිතා ආයතන පෞද්ගලීකරණයට ලක් නොකෙරේ. විශාල රාජ්‍ය හිමිකමක් ඇතිවන පරිදි විශාල බැංකු පද්ධතියක් නිර්මාණය කෙරේ.
- සරල හා සාධාරණ නව බදු ක්‍රමයක් ක්‍රියාත්මක කෙරේ. රේගු බදු විධිමත් කිරීම සහ ඉහළ නැංවීම සඳහා ස්කෑන් පහසුකම් ඇතුළු නවීන තාක්ෂණික ක්‍රම හඳුන්වා දීමටත් සියලු ආකාරයේ වංචා දූෂණ මුළුමනින් නතර කිරීමටත් කටයුතු කෙරේ.
- ශ්‍රී ලංකාවේ ආර්ථික සැලසුම්වල සැබෑ අවශ්‍යතා අනුව පමණක් ණය ලබා ගැනීමට කටයුතු කෙරේ. දැනට ලබාගෙන ඇති දැවැන්ත ණය කපාහැරීම් සහ වෙනත් සහන ලබා ගැනීම සඳහා සාකච්ඡා ආරම්භ කෙරේ.
- මහා පරිමාණ රාජ්‍ය වෙළඳ ව්‍යවසායන් වන විදුලිය, වරාය, ඛණිජ තෙල්, ජල සම්පාදන, ටෙලිකොම්, ගුවන් වැනි ආයතනයන්හි පවතින වංචා, දූෂණ සහ අකාර්යක්ෂමතා සම්පූර්ණයෙන් නවතා ඒවා උපරිම ආදායම් සහ ලාභ ලබන තත්වයට කාර්යක්ෂමව මෙහෙයවේ.
- රාජ්‍ය මූල්‍ය රෙගුලාසි (Financial Regulations) සහ රාජ්‍ය පරිපාලන රෙගුලාසි ((Administrative Regulations) වර්තමාන තත්වයට ගැලපෙන පරිදි යාවත්කාලීන කෙරේ.
- රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය (ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම) විධිමත් කරන අතර ඒ යටතේ ටෙන්ඩර් ක්‍රියාවලිය විනිවිදභාවයකින් යුක්තව රාජ්‍ය යාන්ත්‍රණයක් යටතේ ක්‍රියාත්මක කෙරේ.
- දැනට ක්‍රියාත්මක කරනු ලබන තරගකාරී මිල ගණන් කැඳවීමකින් තොරව රජය මගින් ටෙන්ඩර් ප්‍රදානය කිරීමේ ක්‍රමය (Unsolicited tenders) අහෝසිකර තරගකාරී මිල ගණන් කැඳවීමේ (Competitive bidding) පදනම මත ටෙන්ඩර් නිකුත් කිරීම සිදු කෙරේ.
- රාජ්‍ය විගණන ක්‍රියාවලිය වඩාත් ශක්තිමත් කරනු ලබන අතර එය මුළුමනින්ම ස්වාධීන පාර්ලිමේන්තුවට වගකියන ආයතනයක් ලෙස පවත්වා ගෙන යන අතර විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් විශේෂඥ දැනුම ඇති වෘත්තිකයින් එයට බඳවා ගැනීමත් විගණන ආයතනවලට අවශ්‍ය සම්පත් සහ ආරක්ෂාව රජය විසින් සහතික කෙරේ.
- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහ රෙගුලාසි පිළිබඳව සියලුම ආයතනවල සේවකයනුත් මහජනතාවත් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.
- නිෂ්පාදනය සහ නවීන තාක්ෂණය පදනම් කරගත් විදේශ ආයෝජන දිරිමත් කිරීම සඳහා තීරු බදු, බදු, බැංකු පහසුකම්, ආගමන විගමන පහසුකම් ඇතුළු සහනයන් පිළිබඳව සලකා බැලේ.

# 12. බලශක්තිය

ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රයේ පවතින ප්‍රධාන ගැටලු වන්නේ බෙදා හැරීමේදී සහ පරිභෝජනයේදී සිදුවන අධික නාස්තියයි. විශේෂයෙන් විදුලි බලාගාර අවශ්‍ය ප්‍රමිතීන්ට අනුව ගොඩනගා නොමැති වීමත් කළමනාකරණ දුබලතා නිසාත් ඒවා අපේක්ෂිත ඉලක්ක සැපිරීමට අසමත්වී ඇත. තෙල් පිරවුම්හල්, විදුලිය බෙදා හැරීම ආදී බලශක්ති ක්ෂේත්‍රයන් ගණනාවක් පෞද්ගලීකරණය කර තිබීමත් විකල්ප බලශක්ති ප්‍රභවයන් පිළිබඳව පර්යේෂණ සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු නොකිරීමත් විසින් බලශක්ති ක්ෂේත්‍රය ගැටලු රාශියකට මුහුණ දී තිබේ.

ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ඛණිජ තෙල් සංස්ථාව වැනි ආයතන තුළ සිදුවන දේශපාලන මැදිහත් වීම, අධික වංචා සහ දූෂණයන් සහ විදුලිය, ඛණිජ තෙල්, ගෑස් ආදියේ මිල බෙහෙවින් ඉහළ යාමත් බලශක්තිය උපරිම ඵලදායීතාවෙන් යුතුව භාවිතා කිරීම සඳහා ජනතාව තුළ විද්‍යාත්මක දැනුම සහ තාක්ෂණය සංවර්ධනය නොවී තිබීමත් විසින්ද ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රය අර්බුදයට ලක්කර තිබේ.

විදුලිය බිල අධික වීම හේතුවෙන් නව කර්මාන්ත බිහිවීම අඩපණ වී ඇති අතර විදුලි පරිභෝජනයෙන් 60%ක් ගෘහස්ථ පරිභෝජනය වීම මගින් පෙන්නුම් කරන්නේ මෙම අර්බුදයයි. (සැලසුම්ගතව දියුණුවන රටවල කර්මාන්ත අංශය 60%කට වඩා විදුලිය පරිභෝජනය කරයි). විදුලි බල ජනනය දේශපාලන හිතවත්කම මත තෝරාගත් ව්‍යාපාරිකයින් කීපදෙනෙකු අතට ක්‍රමයෙන් පත් කරමින් තිබේ. ලෝකය පුරා ඛණිජ ඉන්ධන භාවිතය අඩු කරමින් විකල්ප බලශක්ති ප්‍රභවයන් කරා ඉක්මනින් ගමන් කරමින් සිටියද අප රටේ කිසිදු විධිමත් සැලැස්මක් ඒ සඳහා නොමැත.

## විසඳුම

බලශක්ති උත්පාදන, කළමනාකරණය සහ විකල්ප බලශක්ති පිළිබඳ පර්යේෂණ හා සැලසුම් පිළිබඳව වගකියන බලශක්ති පිළිබඳ මධ්‍ය සැලසුම් මණ්ඩලයක් ස්ථාපිත කෙරේ.

ජාතික විදුලි බල ඉල්ලුම 100%ක් දේශීය සම්පත්වලින් සපුරා ගැනීමට අවශ්‍ය සියලු උත්සාහයන් දැරේ.

## ක්‍රියාමාර්ග

- බලශක්තිය පිළිබඳව මේ වනවිටත් ශ්‍රී ලංකාව විදේශයන් සමඟ එළඹ ඇති ගිවිසුම් රටේ ස්වෛරීභාවය ආරක්ෂා කිරීම හා ජාතික අවශ්‍යතා සපුරාලීම අරමුණු කරගනිමින් සමාලෝචනයට භාජනය කෙරෙන අතර ඒවා සංශෝධනය කිරීමට හෝ අහෝසි කිරීමට කටයුතු කෙරේ.

- බලශක්තිය, ආර්ථික ක්ෂේත්‍රයට මෙන්ම ජන ජීවිතයට අතිශයින්ම වැදගත් ලෙස සලකා බලශක්ති අර්බුදය විසඳීමට පියවර ගැනේ.
- සුළං බලය, සූර්ය තාපය, භූ තාපය, මුහුදු රළ, සාගර ජලය, මුඩුබිම්වල වගා කළ ශාඛ විශේෂ, වැව් සොරොව්, උණුදිය උල්පත් ඇතුළු පුනර්ජනනීය බලශක්ති පද්ධතියක් ගොඩනැගීමට පියවර ගැනේ. සුළං බලයෙන් රට තුළ නිපදවිය හැකි මෙගා වොට් 20,000න් 10-15%ක් පමණ මුල් වසර පහ තුළ නිපදවේ.
- ප්‍රවාහනය, ගොඩනැගිලි ඉදිකිරීම් හා සෙසු ක්ෂේත්‍ර තුලදී බලශක්ති සංරක්ෂණය අත්‍යවශ්‍ය අරමුණක් සේ සලකා නීති සම්පාදනය සහ උපදෙස් ඇතුළු තාක්ෂණික සහාය ලබා දීමට කටයුතු කෙරේ.
- තෙල් හා ගෑස් සම්පත් ගවේෂණය හා කැණීම් කටයුතු සඳහා දැනට පවතින ක්‍රියාවලි සමාලෝචනය කර ඒවා රටට හිතකර පරිදි සංශෝධනය කෙරේ. තෙල් හා ගෑස් නිෂ්පාදන කටයුතු කඩිනම් කෙරේ.
- විදුලි බල මණ්ඩලය, ඛණිජ තෙල් සංස්ථාව වැනි රාජ්‍ය ආයතනවල නාස්තිය සහ දූෂණය තුරන් කර එහි පරිපාලනය විධිමත් කෙරේ.
- ප්‍රවාහන ක්ෂේත්‍රයේ සිදුකරන ප්‍රතිසංස්කරණ මගින් ඊට වැයවන බලශක්තිය ඉතිරිකර ගැනීමටත් නිෂ්පාදන කර්මාන්ත සඳහා එම ඉතිරිය යොදා ගැනීමටත් කටයුතු කෙරේ.
- නවීන බලශක්ති ජනන, බෙදා හැරීමේ සහ භාවිතා ක්‍රම හඳුන්වා දීම මගින් බලශක්ති නාස්තිය මෙන්ම ජීවිත හා පාරිසරික හානි අවම කෙරේ.

# 13. ප්‍රවාහනය

ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තියක් නොමැතිවීම හේතුවෙන් පොදුවේ මුළුමහත් ජනතාවම ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ ගැටලු රාශියකට මුහුණ දෙමින් සිටී. පොදු ප්‍රවාහන සේවාවල පවතින අධික තදබදය, රාජ්‍ය ප්‍රවාහන සේවාවන් දුර්වල වීම, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ප්‍රවාහන සේවා පොදු සැලැස්මක් සහිතව ක්‍රියාත්මක නොකිරීම, මාර්ගවල පවතින අධික වාහන තදබදය නිසා මාර්ගවල රස්තියාදු වීමට සිදුවීම සහ ඵලදායී මිනිස් පැය ලක්ෂ ගණනක් අපතේ යාම, පරිසර දූෂණය, ජාතික ධනය නාස්ති වීම, විශාල ලෙස සිදුවන මාර්ග අනතුරු, විධිමත් කාලසටහන් අනුව බස් සහ දුම්රිය ධාවනය නොවීම, රාත්‍රියේ සහ ගම්බද ප්‍රදේශවල ගමනාගමන පහසුකම් දුර්වල වීම, මාර්ග නඩත්තුව විධිමත් නොවීම, සැලැස්මකින් තොරව වාහන ආනයනය, මාර්ග නීති ක්‍රියාත්මක වීම අක්‍රමවත් වීම, වාහන ගාල්කරන පොදු ස්ථාන සීමාසහිත වීම සහ නඩත්තු නොවීම, වාහන අමතර කොටස් මෙන්ම වෙනත් නඩත්තු වියදම් ඉහළ යාම වැනි ගැටලු රාශියක් මෙම ක්ෂේත්‍රයේ හඳුනාගත හැක.

එමෙන්ම වාහන ආනයනය, නිෂ්පාදනය, මාර්ග තැනීම, මාර්ග නඩත්තුව, අනතුරු අඩු කිරීම, ඉන්ධන වැනි ප්‍රවාහනයට අදාල ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන රාශියක් පැවතියද ඒවා අතර නිසි සම්බන්ධීකරණයක් නොමැතිවීමද ප්‍රවාහන ක්ෂේත්‍රය අර්බුදයට ලක්වීමට හේතු වී ඇත.

## විසඳුම

ප්‍රවාහනය පහසුකම් සැලසීම රජය සතු වගකීමක් හා මහජන සේවාවක් ලෙස සලකන අතර මගී ජනතාවට විනයානුකූල, සුවදායී, කාර්යක්ෂම හා ආචාරශීලී ප්‍රවාහන සේවයක් ලබා දීමට අවශ්‍ය ජාතික ප්‍රතිපත්තියක් සහ වැඩපිළිවෙළක් සකස් කෙරේ.

## ක්‍රියාමාර්ග

- මගී සහ භාණ්ඩ ප්‍රවාහනය ආර්ථික ක්‍රියාවලියේ ඉතා වැදගත් තැනක් හිමිවන බව පිළිගන්නා බැවින් එය ජනතාව හෙම්බත් නොවන අයුරින් මෙහෙයවීමේ වගකීම රජයේ වගකීමක් ලෙස සලකා කටයුතු කෙරේ.
- රාජ්‍ය සහ පෞද්ගලික ප්‍රවාහන සේවා නගා සිටුවීමට පියවර ගන්නා අතර රාජ්‍ය සහ පෞද්ගලික ප්‍රවාහන අංශ පොදු මධ්‍යගත සැලැස්මකට අනුව ක්‍රියාත්මක කෙරේ.
- දුම්රිය සේවාව කඩිනම් පූර්ණ නවීකරණයට ලක්කර එය මගී සහ භාණ්ඩ (විශේෂයෙන්ම කෘෂි, පශු, ධීවර නිෂ්පාදන මෙන්ම ගොඩනැගිලි ද්‍රව්‍ය සහ කාර්මික නිෂ්පාදන) ප්‍රවාහනය සඳහා පුළුල් කෙරේ. ප්‍රධාන නගර තුළ හා ජනාකීර්ණ නගර අතර උමං දුම්රිය සේවා අරඹනු ලැබේ. ඒ සඳහා හැකි උපරිමයෙන් දේශීය මානව සහ භෞතික සම්පත් යොදා ගැනේ.
- විශ්‍රාමිකයින් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා සහනදායී මිලකට ගමනාගමනයේ යෙදීමට වැඩපිළිවෙළක් සකස් කෙරේ.
- ප්‍රධාන මාර්ගයට පිවිසීම සඳහා කිලෝමීටර් 2කට වඩා වැඩි දුරක් ගෙවා යා යුතු ග්‍රාමීය ප්‍රදේශ 1400ක් හඳුනාගෙන තිබේ. ඒ සියලු ග්‍රාමීය ප්‍රදේශ සඳහා පෞද්ගලික අංශයේද සහයෝගය ඇතිව 'මිනි බස් රථ' සැපයේ.
- රාත්‍රී කාලයේ සහ සමහර ප්‍රාදේශීය මාවත්වල බස් ධාවනය සිදුනොවීමෙන් මගීන් පීඩාවට පත්වීම වැළැක්වීම සඳහා රාත්‍රී කාලයේ සහ මගීන් අඩු ප්‍රාදේශීය මාවත්වල බස් ධාවනය සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කෙරේ.
- සංචාරක කලාප ඒකාබද්ධ කරමින් බස්, දුම්රිය, නාවික හා ගුවන් ප්‍රවාහන සේවා පුළුල් කෙරේ.

- රටේ සංවර්ධනය සමග ඇතිවන අනාගත අවශ්‍යතා පදනම් කර ගනිමින් නව මාර්ග පද්ධති ඉදි කිරීමත් දැනට පවතින මාර්ග අලුත්වැඩියා කිරීමත් පළල් කිරීමත් අවශ්‍යතාවය මත රථගාල් ඉදිකිරීමත් සඳහා පොදු සැලසුමක් තුළ කඩිනම් ක්‍රියාමාර්ග ගැනේ.
- අලුතින් මාර්ග ඉදිකළ පසු හා මාර්ග පුළුල් කළ පසු වෙනත් සේවා අවශ්‍යතා වෙනුවෙන් (උදහරණ ලෙස විදුලි රැහැන්, ජල නල, දුරකථන රැහැන්) මාර්ග කඩා දැමීම සහ කඩතොළු කිරීම නිසා සිදුවන හානිය, නාස්තිය සහ අවහිරතා මගහැරවීම සඳහා මාර්ග සකස් කිරීමේදී එම සේවා සපයන ආයතන සමග ඒකාබද්ධ සැලසුමක් සහිතව කටයුතු කෙරේ.
- මගී ප්‍රවාහනය සහ භාණ්ඩ ප්‍රවාහනය සඳහා මුහුද, අභ්‍යන්තර ගුවන් ගමන් සහ අභ්‍යන්තර ජල මාර්ග උපරිමයෙන් යොදා ගැනේ.
- සියලු මහා මාර්ග සහ අභ්‍යන්තර මාර්ගයන් දෙපස පයින් ගමන්කරන මගීන්ට ආරක්ෂිතව සහ පහසුවෙන් ගමන් කළ හැකි ආකාරයට පදික වේදිකා සහ පදික මාරු සංවර්ධනය කිරීමට ප්‍රමුඛතාව ලබා දේ.
- රැකියා සහ වෙනත් සේවා අවශ්‍යතා වෙනුවෙන් මහජනතාවට නිරන්තරයෙන් ගමනාගමනයේ යෙදීමට හේතුවන කරුනු සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයන් සිදුකර මගී සහ මාර්ග තදබදය අඩු කළ හැකි ඵලදායී විකල්ප සැලසුම් හඳුන්වා දේ. (උදා- පත්වීම් සහ මාරුවීම් පටිපාටි වෙනස් කර පදිංචියට ආසන්න ස්ථානවල සේවය කිරීමට හෝ සේවා ස්ථාන ආසන්නයේ පදිංචිවීමට පහසුකම් ලබාදීම, රාජ්‍ය සේවා හැකි උපරිමයෙන් විමධ්‍යගත කිරීම, පාසැල් දියුණු කර ළමුන්ට තමන්ගේ පදිංචියට ආසන්න පාසැල් ලබා දීම)
- ප්‍රවාහන ගාස්තු පහළ දැමීම ඉලක්ක කරගෙන පොදු ප්‍රවාහන සේවාවන්හි යෙදෙන්නන්ට වාහන ආනයනය කිරීමේදී සහ අමතර කොටස් අනයනයේදී බදු සහන ලබා දෙන අතර සහන මිලකට ඉන්ධන ලබා දීමේ ක්‍රමයක්ද ඇති කෙරේ.
- පා පැදි, යතුරුපැදි සහ ත්‍රී රෝද රථ භාවිතය විධිමත් කර ඒවා ආරක්ෂාකාරී ප්‍රවාහන මාධ්‍ය බවට පත් කෙරේ.
- ත්‍රී රෝද රථ හිමියන් හා රියදුරන් මුහුණපාන ගැටලු හා දුෂ්කරතා අවම කිරීමට සහ ඔවුන්ට වෘත්තීය ගරුත්වය සහිතව කටයුතු කිරීමට අවශ්‍ය පියවර කඩිනමින් ගැනේ. ඒ සඳහා ප්‍රවාහන අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයක් පිහිටුවේ.
- අලුත්වැඩියාවට සහ නවීකරණයට ලක්කළ හැකි එහෙත් භාවිත නොකරන බස්, වෑන් සහ දුම්රිය මැදිරි හා එන්ජින් රාජ්‍ය හා පෞද්ගලික අංශවල ඒකාබද්ධ වැඩපිළිවෙළකින් අලුත්වැඩියා කොට නැවත ප්‍රවාහන පද්ධතියට එක් කිරීමට කටයුතු කෙරේ.

- නගරාසන්න දුම්රිය ස්ථාන සම්පූර්ණයෙන්ම නවීකරණය කර දැනට පවතින මැදිරි 06කින් යුත් දුම්රිය වෙනුවට මැදිරි 15කින් යුත් වැඩි ආසන සංඛ්‍යාවක් සැපයෙන දුම්රිය යෙදවේ.
- කොළඹ නගරය සඳහා වන ප්‍රධාන ප්‍රවේශ මාර්ග හයෙහි උදේ සහ හවස් කාලයේ ඇතිවන රථවාහන තදබදය මගහැරීම සඳහා වායු සමීකරණය කරන ලද ආසන සංඛ්‍යාවෙන් වැඩි තට්ටු දෙකේ බස්රථ යෙදවේ.
- බස්රථවල  හා දුම්රියේ ගමන් කරන අය ලක්වන අනතුරු නිසා සිදුවන මරණ සඳහා ලක්ෂ 10ක වන්දියක් ලබාදේ.
- විදුලියෙන් ක්‍රියාත්මක කරන වාහන සඳහා ආරෝපණ මධ්‍යස්ථාන නොමැතිකමින් එම වාහන ව්‍යාපෘතිය සීමා වී තිබේ. මෙම තත්වයට විසඳුමක් වශයෙන් එවැනි වාහන සඳහා වූ විදුලිය ආරෝපණ මධ්‍යස්ථාන 6000ක් වසර 05 තුළ දී රට පුරා ස්ථාපිත කෙරේ.

  මෙම අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය පළමු මාස 06 තුළ සිදු කෙරේ.
- දැනට ඉහළ නංවා ඇති හයිබ්‍රිඩ් වාහන සඳහා වූ බද්ද අඩු කෙරේ.

# 14. නිවාස

නිවසක් යනු බිත්ති හතරක් සහ වහලක් සහිත ඕනෑම ගොඩනැගිල්ලක් නොව ජලය, විදුලිය, වැසිකිළි, සෞඛ්‍ය පහසුකම් ආදිය සහිත ප්‍රමාණවත් ඉඩකඩක් සහිත වූවක් විය යුතු වුවත් ලංකාවේ බහුතර නිවාස ප්‍රමාණයක් මෙලෙස ජීවත්වීමට සුදුසු තත්වයේ නොපවතී. ජනතාවගෙන් විශාල කොටසක් මුඩුක්කු, පැල්පත්, ලයින් කාමර වැනි ඉතාම පහළ මට්ටමේ ජීවන තත්වයක් භුක්ති විඳින අතර වැඩිවන ජනගහනයත් සමග අවිධිමත්ව ඉදි කෙරෙන නිවෙස් නිසා විශේෂයෙන්ම නාගරික ප්‍රදේශවල මතුවී තිබෙන තදබදය හා ඒ ආශ්‍රිත සමාජ හා පාරිසරික ගැටලුද ලංකාවේ නිවාස ගැටලුව තීව්‍ර කිරීමට හේතුවී ඇත.

හුදු ගොඩනැගිලි ඒකකය පමණක් නොව නිවස පිහිටන ප්‍රදේශයෙන් නිවැසියන්ට ලැබෙන ආරක්ෂාව, අධ්‍යාපනය, ජලය හා සෞඛ්‍ය පහසුකම් ආදී වෙනත් පහසුකම්, ප්‍රවාහන පහසුකම්, රැකියා අවස්ථා සහ ස්වාභාවික රැකවරණය ආදියද අතිශයින් වැදගත්වන අතර දිවයිනේ ඇතැම් භූමි භාගයන් පදිංචියට තෝරා නොගැනීමටත් නාගරීකරණය උග්‍ර ගැටලුවක් වීමටත් විෂම සංවර්ධනය හේතු වී තිබේ.

## විසඳුම

සියලුම පුරවැසියන්ට නිශ්චිත පහසුකම් සහිත සෞඛ්‍යාරක්ෂිත සහ සදාචාරවත් ලෙස ජීවත්විය හැකි නිවසක් ලබා ගැනීමට ඇති අයිතිය මූලික මිනිස් අයිතිවාසිකමක් ලෙස පිළිගනු ලබන අතර ඒ සඳහා මැදිහත්වීම රජයේ වගකීමක් ලෙස සැලකේ.

## ක්‍රියාමාර්ග

- පදිංචියට නිවසක් නොමැති සෑම පුරවැසියකුටම නිවසක් ලැබෙන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කෙරේ.
- රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ මැදිහත්වීමෙන් මූලික පහසුකම් සියල්ල ඇතුළත් මහල් නිවාස ව්‍යාපෘති ඇති කෙරේ.
- පවුල් ඒකකයේ ස්වභාවය මත විවිධත්වයෙන් යුත් නිවාස ව්‍යාපෘති සියලු නගරවල ඇරඹේ. ඒ යටතේ

  ● එක් යුවලකට ප්‍රමාණවත් වන නිවසක් (එක් නිදන කාමරයක්, ආලින්දය, නානකාමරය සහ මුළුතැන්ගෙයකින් සමන්විත)

  ● දරුවෙකු සමඟ එක් පවුලකට ප්‍රමාණවත් නිවසක් (නිදන කාමර 2, ආලින්දය, නාන කාමරය හා මුළුතැන්ගෙයකින් සමන්විත)

  ● දරුවන් තිදෙනෙකු සමඟ ජීවත්වන පවුලක් සඳහා ප්‍රමාණවත් වන නිවසක් (නිදන කාමර 3ක්, ආලින්දයක්, නානකාමර 1ක් සහ මුළුතැන්ගෙයකින් සමන්විත) ලෙස නිවාස ඉදිකෙරේ.

- රාජ්‍ය හා පුද්ගලික සමාගම් මඟින් සාමාන්‍ය ජනතාව ඉලක්ක කරගත් නව නිවාස සංකීර්ණ ඉදිකිරීම මඟින් වාර්ෂිකව නිවාස ඒකක 20,000ක් ඉදිකරනු ලබන අතර එම නිවාස ලබාගැනීමට ජනතාවට මූල්‍ය සේවා ලබාදේ.
- අලුතින් ඉදිවන සහ පවතින සෑම මහල් නිවාස ව්‍යාපෘතියක් සමඟම විවාහ සහ අවමඟුල් කටයුතු සඳහා ශාලා පහසුකම් ස්ථාපිත කෙරේ. ඒ සමඟම ළමා ක්‍රීඩාංගණයක් සැකසීම, උද්‍යාන, කඩසාප්පු, වෛද්‍ය මධ්‍යස්ථාන, ආපනශාලා ආදී වූ පොදු පහසුකම් සැපයෙන "සේවා පියසක්" ගොඩනැගීම අනිවාර්ය කෙරේ.
- අවදානම් ප්‍රදේශවල ජීවත්වන්නන්, මුඩුක්කු සහ පැල්පත්වාසී සියලු දෙනාට රජය මගින් පහසුකම් සහිත නිවාස සංකීර්ණවලින් නිවාස ලබා දෙන අතර දැනට ලයින් කාමරවල ජීවත්වන වතු කම්කරුවන්ට පහසුකම් සහිත නිවාස ලබා දීම සඳහා කඩිනම් පියවර ගැනේ.
- නිවාස ඉදිකිරීම සඳහා රාජ්‍ය බැංකුවලින් ඉතා අඩු පොලී නිවාස ණය යෝජනා ක්‍රියාත්මක කෙරේ.

- නිවාස ඉදිකිරීම සඳහා ණය සැපයීමේදී පරම්පරාවකින් පරම්පරාවකට එය දරා ගත හැකි වන සේ ණය ආධාර ක්‍රමයක් හඳුන්වා දේ. (Inter-generation housing loans)
- ප්‍රමිතියට නැති නිවාස ප්‍රමිති මට්ටමට ගෙන ඒම සඳහා වාර්ෂිකව නිවාස හිමියන් 25,000කට රුපියල් ලක්‍ෂ 01ත් ලක්‍ෂ 05ත් අතර ණය මුදලක් 01% පොලියට ලබාදේ.
- අඩු වියදම් නිවාස ඉදිකිරීමට අදාල පර්යේෂණ සහ ව්‍යාප්ති සේවා දිරිමත් කෙරේ.
- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ මේසන්, අත්වැඩ, වඩු, විදුලි කාර්මික, ජලනල කාර්මික, සැලසුම් ශිල්පී ආදී සියලු වෘත්තියකයින්ගේ දැනුම, කුසලතා ප්‍රවර්ධනයට ඔවුන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවට මෙන්ම ඔවුන්ගේ සේවාවන් වඩාත් විශ්වසනීය තත්වයට පත් කිරීමට වැඩපිළිවෙළක් ස්ථාපිත කෙරේ.
- නිවාස ඉදිකිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය සහ උපකරණ සහනදායී මිලට ලබා දීම සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව ප්‍රතිව්‍යුහගතකර විධිමත් කරන අතර එහි ශාඛා සෑම ප්‍රදේශයක්ම ආවරණය වනසේ පුළුල් කෙරේ.
- නිවාස කුලියට දීමට සහ කුලියට ගැනීමට අදාළ ප්‍රමිතියක් නොමැතිවීම හේතුවෙන් සිදුවන අක්‍රමිකතාවයන් සහ අපහසුතාවයන් මගහැරවීම සඳහා කුලී නිවාස සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමේ ක්‍රමවේදයක්, නීති සහ ව්‍යවස්ථාපිත නව ආයතන ව්‍යුහයක් ස්ථාපිත කෙරේ.
- රාජ්‍ය අංශයේ සේවයේ නියුතු පුරවැසියන් සඳහා නිවසට ආසන්න සේවා ස්ථාන ලබා දීම, රජයේ මැදිහත්වීමෙන් කුලී නිවාස ලබා දීම සහ නව නිල නිවාස සංකීර්ණ ඉදි කිරීමට ප්‍රමුඛතාව ලබා දේ.

## 15. පරිසරය

වැඩිවන ජනගහනය සහ අවිධිමත් කාර්මීකරණය හේතුවෙන් ගෝලීය වශයෙන් දැවැන්ත දේශගුණික සහ පාරිසරික විපර්යාසයන් රාශියක් සිදුවෙමින් තිබෙන අතර අප රටේද උණුසුම ඉහළ යාම, වර්ෂාපතනයේ වෙනස්කම් ඇතිවීම, සත්ව සහ ශාක විශේෂයන් වඳවී යාම වැනි වෙනස්වීම්වල වේගය උත්සන්න වී ඇත. සිදුවන පාරිසරික සහ දේශගුණික විපර්යාසයන් බරපතළ සෞඛ්‍ය ගැටලු මෙන්ම ආහාර නිෂ්පාදනය සහ ආර්ථික වර්ධනය අඩාල කිරීමටද හේතු වී ඇත.

පටු ලාභ අරමුණු කරගෙන පරිසරය විනාශවන ආකාරයෙන් සිදු කරනු ලබන ආර්ථික ක්‍රියාකාරකම් හේතුවෙන් සහ ඒවා කළමනාකරණයට පිහිටුවා ඇති රාජ්‍ය ආයතන අකර්මණ්‍ය

කිරීම හේතුවෙන්ද පරිසරය ශීඝ්‍ර ලෙස දූෂණය වෙමින් තිබේ. දේශපාලකයින් තම බලය අයුතු ලෙස යොදා ගනිමින් සිදු කරන පරිසර විනාශයන්ද (කැලෑ හෙළි කිරීම, වන සතුන් දඩයම, වගුරු බිම් ගොඩ කිරීම ආදී) ආවේණික සත්ව සහ ශාක ප්‍රජාවන් ජාත්‍යන්තර ජාන මංකොල්ලයේ ගොදුරු බවට පත්වන්නට ඉඩ හැරීමද පසුගිය කාලය පුරා දක්නට ලැබිණි.

## විසඳුම

වර්තමාන සහ අනාගත පරම්පරාවන් වෙනුවෙන් පරිසරය ආරක්ෂා කිරීම සම්පූර්ණයෙන්ම රජයේ වගකීමක් ලෙස සලකනු ලැබේ. සොබාදහමේ ප්‍රතිඋත්පාදන ශක්තිය වැඩි කළ හැකි සමාජ ආර්ථික දේශපාලනික සංවර්ධනික ක්‍රියාකාරීත්වය සඳහා ශක්තිමත් පාරිසරික ප්‍රතිපත්තියක් සහ නෛතික ව්‍යුහයක් ගොඩනැගීමට පියවර ගැනේ.

වත්මන් හා අනාගත පරපුරෙහි පැවැත්ම තහවුරු කිරීම උදෙසා ජලය, වාතය, පස ඇතුළු සියලු ස්වභාවික සම්පත්වල ආරක්ෂාව තහවුරු කිරීම හා තිරසාර භාවිතය විධිමත් කිරීමට පියවර ගන්නා අතර රට තුළ ගොඩබිම් පරිසරය පමණක් නොව අනන්‍ය සාගරික කලාපයේ සියලු ස්වභාවික සම්පත්වල අයිතිය හා සුරක්ෂිතතාව තහවුරු කෙරේ.

සංවර්ධනය යනු හුදෙක් භෞතික ක්‍රියාවලියක් පමණක් නොව ජනතාව ආරක්ෂා වන්නාවූද සොබාදහමේ ප්‍රතිඋත්පාදනය නැවත ගොඩනගන්නාවූද ක්‍රියාවලියක් විය යුතුය. පාරිසරික ප්‍රතිපත්ති සකස් කිරීමේදී පහත සඳහන් කරුණු 04 මත පදනම්ව ක්‍රියාකෙරේ.

### 1. සියලු ප්‍රජාවගේ පාරිසරික අයිතිය තහවුරු කිරීම

රටේ සියලු ප්‍රජාවගේ නිදහස් සුරක්ෂිත ජීවන පැවැත්ම උදෙසා සියලු ස්වභාවික සම්පත් සියලු ජනතාවගේ සුභ සිද්ධිය සඳහා පමණක් භාවිතයට ගත යුතු අතර ආර්ථිකමය වුවමනාවන් සඳහා අවභාවිතය වැළැක්වීමට කටයුතු කෙරේ.

### 2. තිරසාර සංවර්ධනය ඇති කිරීම

රටේ සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක කරන සෑම ක්‍රියාමාර්ගයක් තුළම පරිසරයේ සුරක්ෂිතභාවය ඇති කිරීම තුළින් සියලු ප්‍රජාවගේ යහපැවැත්ම තහවුරු කෙරේ.

### 3. ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීම

පරිසරය හා එහි සියළු ස්වභාවික සම්පත් සංරක්ෂණය මෙන්ම වැඩිදියුණු කර පවත්වාගෙන යාම සහ අවභාවිතය වැලැක්වීමට කටයුතු කිරීම.

### 4. හරිත ආර්ථිකය ගොඩනැංවීම

රටේ ස්වභාවික සම්පත් මත ක්‍රියාත්මක වන හරිත ආර්ථිකයක් ගොඩ නැංවීම සඳහා රටේ සියලු ප්‍රතිපත්ති සකස් කෙරේ.

# ක්‍රියාමාර්ග

- ස්වභාවික සම්පත් සහ පරිසරය ජාතික අවශ්‍යතාවන්ට අනුව සංරක්ෂණය සහ කළමනාකරණය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කෙරෙන අතර දැනට පවතින පරිසරයට අදාළ පනත් සහ රෙගුලාසි සමාලෝචනය කර ශක්තිමත් කෙරේ.
- ස්වභාවික පරිසරය, ජලය, වෙරළ, භූමිය, වාතය, ස්වභාව ධර්මයේ හඬ දූෂණය වීම හැකි උපරිමයෙන් වැළැක්වීම සඳහා වූ තාක්ෂණික මඟපෙන්වීම් මෙන්ම නීතිය දැඩිව ක්‍රියාත්මක කිරීමද සිදු කෙරේ.
- පරිසරයේ ආරක්ෂාවට තර්ජනයක් වන තාක්ෂණික නිපැයුම් සහ යෙදවුම් වෙනුවට විකල්ප සොයා ගැනීමට අදාළ වූ පර්යේෂණ සඳහා ආධාර අනුබල ලබා දේ.
- පාරිසරික නීති ක්‍රියාත්මක කිරීම සඳහා මනා අන්තර් සබඳතාවක් සහිත ආයතනික පද්ධතියක් ස්ථාපිත කෙරේ.
- පරිසරය සුරැකීම සඳහා ප්‍රජා සහභාගිත්වය ඉලක්ක කර ගත් මාධ්‍ය භාවිතාවක් ඇති කරන අතර පරිසරය රැකීමේ වැදගත්කම පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ අධ්‍යාපන වැඩසටහන් සකස් කෙරේ. පරිසරය ආරක්ෂා කිරීමේ වැදගත්කම පිළිබඳව සිසුන් දැනුවත් කිරීම සඳහා පාසැල් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළට පරිසර විෂය ඇතුළත් කෙරේ.
- පවතින සියලු ස්වභාවික පරිසර පද්ධතිවල රැකවරණය තහවුරු කරන අතර ඒවා ඛණ්ඩනය වීම වැළැක්වීම හා එම රක්ෂිත ප්‍රදේශ නිසි පරිදි ජාල ගත කිරීමට හා වැඩි දියුණු කිරීමටත් අනාරක්ෂිත පරිසර පද්ධති රක්ෂිත ප්‍රදේශ තත්වයට පත් කිරීමටත් පියවර ගැනේ.
- ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීම සඳහා දැනට ක්‍රියාත්මක නොවන තෙත් බිම් සංරක්ෂණය, පුරා ජෛව සංරක්ෂණය, ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය, ජෛව සම්පත් හා බැඳුණු සම්ප්‍රදායික දැනුම සංරක්ෂණය සහ ආක්‍රමණික ජිවීන් පාලනය සඳහා වන ප්‍රතිපත්ති හා අණපනත් සකසා ක්‍රියාවේ යොදවනු ලැබේ.
- විවිධාකාරයේ පාරිසරික හානි දැනුම් දීම සඳහා පැය 24 පුරා දින 365 ක්‍රියාත්මක මධ්‍යස්ථානයක් ස්ථාපිත කෙරේ.
- විවිධ විකෘති ජාන සහිත පරිසර විනාශකාරී ශාකවර්ග සහ සත්ව විශේෂ ආදී දේ ලංකාවට ගෙන ඒමට එරෙහි වැඩපිළිවෙළ ශක්තිමත් කරන අතර දැනට ව්‍යාප්තවූ එවැනි විශේෂ තුරන් කිරීමට හෝ නිසි පරිදි කළමනාකරණය කිරීමට පියවර ගැනේ.

- රටේ පවතින පාරිසරික අණපනත් හා ප්‍රතිපත්ති මෙන්ම ජාත්‍යන්තර වශයෙන් වූ පරිසර හිතකාමී අන්තර්ජාතික ප්‍රතිපත්ති හා සම්මුතීන්ට එළඹීමට සහ ඒවා විධිමත්ව ක්‍රියාවේ යෙදවීමට කටයුතු කෙරේ.
- සෑම ප්‍රදේශයක්ම ආවරණය වන පරිදි රජයේ නිලධාරීන්, පරිසර සංවිධාන සහ පරිසරවේදීන් ඇතුළත්වන පරිසර කමිටු පිහිටුවීම සහ ඒ තුළින් ප්‍රදේශයේ පාරිසරික ගැටලු හඳුනා ගැනෙන අතර ඒවා සඳහා පිළියම් යෙදේ.
- අලි මිනිස් ගැටුම ඇතුළු පරිසරය සහ මිනිසා ගැටෙන සියලු ප්‍රශ්න සඳහා විද්‍යාත්මක කඩිනම් විසඳුම් ලබා දීමට පියවර ගැනේ.
- වැසි, සුනාමි, නියං, උෂ්ණත්ව වෙනස්වීම් වැනි විවිධාකාරයේ පාරිසරික වෙනස්වීම් කල් ඇතිව හඳුනාගත හැකි සහ අදාළ ආයතන සහ ජනකොටස්වලට කල් ඇතිව දැනුම් දිය හැකි ආකාරයට තාක්ෂණික පහසුකම් වැඩි දියුණු කෙරේ.
- ජෛවීය නොවන ස්වභාවික සම්පත් හෝ ඛනිජ සම්පත් හෝ පාෂාණ සම්පත් භාවිතය සඳහා ලබා ගැනීමේදී කැණීම් කිරීම හෝ උකහා ගැනීම විධිමත් සංරක්ෂණයන්ට යටත්ව හා අනෙකුත් ස්වභාවික සම්පත් හෝ ජනතාවට අහිතකර බලපෑම් ඇති නොවන ලෙස සිදු කිරීම සඳහා විධිමත් ප්‍රතිපත්ති හා ක්‍රමවේදයන් සකස්කර ක්‍රියාත්මක කෙරේ.
- අපද්‍රව්‍ය විද්‍යාත්මකව කළමනාකරණය පළාත්පාලන ආයතනවල අත්හැරිය නොහැකි වගකීමක් බවට පත්කර අවශ්‍ය තාක්ෂණික මගපෙන්වීම් සිදු කරන අතර ඊට එරෙහිව කටයුතු කරන ආයතන සම්බන්ධයෙන් නීතිය දැඩිව ක්‍රියාත්මක කෙරේ.
- විවිධ ද්‍රව්‍ය ආනයනයේදී සහ නිෂ්පාදනයේදී ඒවා මගින් පරිසරයට සිදුවිය හැකි හානි සැලකිල්ලට ගෙන ආනයන සහ නිෂ්පාදන ප්‍රතිපත්ති නිරන්තරයෙන් යාවත්කාලීන කෙරේ.
- රටේ අවශ්‍යතාව මත පදනම්ව සිදු කරන කර්මාන්තශාලා, වාණිජ කෘෂිකර්මාන්තය, සංචාරක ව්‍යාපෘති, බලශක්ති උත්පාදන බලාගාර වැනි සියලු සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර නිසියාකාර ශක්‍යතා ඇගයීම් ක්‍රියාවලියකට යටත්ව සිදු කරනු ලබන අතර එහිදී ස්වභාවික සම්පත්වලට හෝ ජනතාවගේ යහ පැවැත්මට එල්ලවන අහිතකර බලපෑම් අවම කිරීමට සහ විකල්ප සංරක්ෂණ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීමට පියවර ගැනේ.
- වල් බිහිවී ඇති ඉඩම් මෙන්ම ජෛව විවිධත්වයට හානිවන සේ වගා කර ඇති ෆයිනස්, ටර්පන්ටයින් වැනි වගාවන් වෙනුවට දේශීය කොස්, දෙල්, මී, කුඹුක්, කළුවර වැනි ශාක වගාව මහා පරිමාණයෙන් ව්‍යාප්ත කෙරේ.

# 16. රැකියා

රැකිය වියුක්තිය සහ රැකියා නියුක්තිය පිළිබඳ නිවැරදි තොරතුරු සංචිතයක් නොමැත. ශ්‍රම බලකායේ බොහෝ දෙනා නිරතවන්නේ අස්ථාවර හෝ නිෂ්පාදනයට දායක නොවන කාර්යයන්හිය. බහුතරයක් දෙනා රැකියාවෙන් ලබන ආදායම ආහාරපාන වැනි මූලික අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට හෝ ප්‍රමාණවත් නොවේ. දේශපාලන වාසි ලබා ගැනීමේ අරමුණින් රාජ්‍ය අංශයේ රැකියා නිර්මාණය කළද රැකියාවන්හි නියුක්ත කර ඇත්තේ රැකියාලාභියාට හෝ මහජනතාවට වැඩදායක නොවන ආකාරයටය. පෞද්ගලික අංශයේ සේවා සපයන බොහෝ රැකියාවන් නිර්මාණය වී ඇත්තේ රජයේ විධිමත් ආර්ථික සැලැස්මකින් තොරව වන අතර වෘත්තීය අයිතිවාසිකම් අහිමි කරමින් කොන්ත්‍රාත් පදනමින් සේවයට බඳවා ගැනීම තුළ ශ්‍රමිකයින් දරුනු ශ්‍රම සූරාකෑමකට ලක්වීමද ප්‍රධාන ගැටලුවකි.

උග්‍ර විරැකියාව සහ ඌණ රැකියා නියුක්තියෙන් අසහනයට පත් තරුණ කොටස් මෙන්ම වෘත්තිකයින් ඉතා විශාල වශයෙන් ශ්‍රී ලංකාව අතහැර යමින් සිටින අතර කාන්තාවන් එසේ නුසුදුසු රැකියාවන් සඳහා පිටරට යැවීම විසින් දරුණු සමාජ ගැටලු රාශියක් නිර්මාණය කර ඇත.

වෘත්තීය අධ්‍යාපනය ගොඩනගා නොතිබීමත් පවතින අධ්‍යාපන රටාව වෘත්තීය නිපුනතාවන් වර්ධනය වන ආකාරයට සැලසුම් කර නොතිබීමත් නව රැකියා නිර්මාණය කිරීමට අවශ්‍ය කාර්මික, කෘෂිකාර්මික සහ විශේෂයෙන්ම පර්යේෂණ අංශයේ ව්‍යාපෘති ආරම්භ නොකිරීමත් නව පරපුර බලාපොරොත්තු වන රැකියා බිහි නොවීමට බලපා ඇත.

## විසඳුම

රැකියාවක නිරතවීම මූලික මිනිස් අයිතිවාසිකමක් ලෙස පිළිගනු ලබන අතර එය ව්‍යවස්ථාවෙන් තහවුරු කෙරේ.

කොල්ලකාරී වෙළඳපළ ආර්ථිකය වෙනුවට පුරවැසියාගේ ජීවන තත්වය වඩාත් උසස් තත්වයකට පත් කරන දැවැන්ත සහ ඉතාමත් දියුණු නිෂ්පාදන ආර්ථික සැලැස්මක් තුළ රැකියා බලාපොරොත්තු සියලු පුරවැසියන්ට තම අධ්‍යාපන සහ වෘත්තිය සුදුසුකම් අනුව රැකියාවක් ලබා ගැනීමට ඇති අවස්ථාව තහවුරු කෙරේ.

## ක්‍රියාමාර්ග

- ශ්‍රම බලකාය පිළිබඳව, රැකියා නියුක්තිය සහ වියුක්තිය පිළිබඳ පැහැදිලි සහ විශ්වසනීය අගැයීමක් සිදු කරනු ලබන අතර රැකියා ලබා දීමේ ජාතික සැලැස්මක් ක්‍රියාත්මක කෙරේ.

- සංවර්ධනයට අවශ්‍ය පුහුණු සහ විශේෂඥ ශ්‍රමය වැඩිවන ආකාරයට තාක්ෂණික සහ අධ්‍යාපනික දැනුම ලබා දීමට ප්‍රමුඛතාවක් ලබා දේ.
- රැකියා ලබා දීමේදී කිසිදු ආකාරයකින් දේශපාලකයිනගේ මැදිහත්වීම සම්පූර්ණයෙන්ම නතර කරනු ලබන අතර පිළිගත් බඳවා ගැනීමේ පටිපාටියකට අනුව රාජ්‍ය සේවයට බඳවා ගැනීම් සිදු කෙරේ.
- රාජ්‍ය සේවයේ උසස්වීම්, ස්ථාන මාරු සඳහා පිළිගත් විද්‍යාත්මක විනිවිදභාවයකින් යුත් ක්‍රමවේදයන් සකස් කෙරේ. අනවශ්‍ය බලපෑම්වලින් තොරව ස්වාධීනව තම සේවය ඉටු කිරීමට හැකිවන සේ නව ආචාරධර්ම පද්ධතියක් හඳුන්වා දේ.
- රාජ්‍ය සේවක සියලුම දීමනා මූලික වැටුපට එකතු කෙරේ.
- බාහිර බලපෑම්වලින් තොරව ස්වාධීනව තම සේවය ඉටුකිරීමට හැකිවන පරිදි රාජ්‍ය සේවය සුරක්ෂිත කෙරේ.
- පෞද්ගලික අංශයේ කාර්යක්ෂමතාවය සහ සේවා සැපයීම සමඟ සමව තරඟ වැදිය හැකි රාජ්‍ය සේවයක් බිහිකිරීම උදෙසා රාජ්‍ය සේවකයාගේ ආකල්ප වර්ධනය පිණිස පුහුණු අධීක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.
- රාජ්‍ය අංශයේ සේවය බලාපොරොත්තුවෙන් පැමිණෙන්නන් හට වඩාත් ආචාරශීලී සේවයක් ලබාදීම වෙනුවෙන් මහජන සම්බන්ධතා පැවැත්වීම පිළිබඳව රාජ්‍ය සේවකයා පුහුණු කෙරේ.
- රැකියා වියුක්තිය අවම කර ගැනීමේ ඉලක්ක සහගත වැඩපිළිවෙළක් මත ගොඩනැගුණු වෘත්තීයමය හැකියා සහිත පුද්ගලයින් විදේශ රැකියා සඳහා යොමු කිරීම රාජ්‍ය මැදිහත්වීමෙන් සිදු කෙරේ.
- අධ්‍යාපනයේ සියලු මට්ටම්වලින් ඉවත්ව යන්නන් සඳහා වෘත්තීය අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කිරීමට අවශ්‍ය වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ස්ථාපිත කෙරේ.
- සියලු වැඩකරන ජනතාවන්ට සිය ජීවිතය යහපත් මට්ටමින් පවත්වා ගෙන යා හැකි ආකාරයේ අවම වැටුප් තීරණය කරනු ලබන අතර සියලුම ආකාරයේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කෙරේ.
- දැනට රාජ්‍ය සේවයේ පවතින වැටුප් විෂමතා ඉවත් කරලමින් සියලු රාජ්‍ය සේවකයින්ගේ මූලික වැටුප පවතින ජීවන අවශ්‍යතාවන්ට අනුව ඉහළ දැමීමට ජාතික වැටුප් ප්‍රතිපත්තියක් හඳුන්වාදීම අරමුණු කරගනිමින් ජාතික වැටුප් කොමිෂන් සභාවක් අලුතින් ස්ථාපිත කෙරේ. ඒ සඳහා වෘත්තීය සමිතිවල අදහස්ද ලබාගැනීමට කටයුතු කෙරේ.
- රැකියාවක් ලැබෙන තෙක් රැකියා කළ යුතු වයසේ සෑම කෙනෙකුටම ජීවත්වීමට ප්‍රමාණවත් දීමනාවක් රජය මගින් ලබා දේ.

- පෞද්ගලික අංශයේ සියලු රැකියා සඳහා අවම වැටුපක් තීරණය කෙරේ.
- තත්කාලීන ජීවන තත්වයන් පදනම්කර ගනිමින් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම සඳහා වන නිශ්චිත ක්‍රමවේදයක් රජයේ මැදිහත්වීමෙන් නීතිගත කර ක්‍රියාවට නැගේ. මේ යටතේ දැනට රු. 2500ක වැටුප් වැඩිවීමක් ලබා දීමට අවශ්‍ය නීතිමය පියවර ගැනේ.
- රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සියලු සේවකයින්ගේ සෞඛ්‍ය ආරක්ෂාව (Occupational Health) තහවුරු කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයන් සහ නෛතික විධිවිධානයන් සකස් කර ක්‍රියාත්මක කෙරේ.
- අනියම් පදනමින් හෝ මිනිස්බල සමාගම් (Man Power Agency) මගින් සේවයේ යොදවා ඇති සියලු සේවකයින් සේවයේ ස්ථිර කිරීමට වහාම කටයුතු කෙරේ.
- සෑම දිස්ත්‍රික්කයකම විදේශ රටවල ආයතනවලට සේවා සපයන (Back Office Services) ආයතනවලින් සමන්විත කාර්යාල සංකීර්ණයක් ඉදිකරනු ලැබේ. ඒවායෙහි ඇමතුම් මධ්‍යස්ථාන, නීතිඥ කාර්යාල, ගණකාධිකාරි කාර්යාල, මානව සම්පත් කළමනාකරණ කාර්යාල ආදිය සඳහා ඉඩ පහසුකම් සපයා දීමත් මගින් රටේ අවම වශයෙන් රැකියා ලක්ෂ 03ක් නිර්මාණය කෙරේ.
- රජයේ දීර්ඝ කාලීන ආර්ථික සංවර්ධන සැලැස්මට අනුකූලවන සේ සුළු ව්‍යාපාර සහ ස්වයං රැකියාවන් සඳහා මඟපෙන්වීම්, තාක්ෂණික සහායයන්, අඩු පොලී ණය පහසුකම්, මූල්‍ය කළමනාකරණය පිළිබඳ මූලික අධ්‍යාපනයක් සහ දෙස් විදෙස් අලෙවි පහසුකම් සොයා දීමට රජය මැදිහත්වේ.
- විදේශ රැකියා ඉලක්ක කරගනිමින් ජාත්‍යන්තර පිළිගැනීමක් සහිත පුහුණු සහ අධ්‍යාපන ආයතන බිහිකළ යුතුවේ. දැනට මෙරට ඇති තාක්ෂණික පුහුණු මධ්‍යස්ථාන අතුරින් රත්මලාන "ජර්මන් ටෙක් ආයතනයට" සුවිශේෂී වටිනාකමක් හිමිය. එවැනි තාක්ෂණික පුහුණු ආයතන දිස්ත්‍රික්කයකට එක බැගින් 24ක් සෙසු දිස්ත්‍රික්ක තුළද වසර 03ක් තුළදී ස්ථාපිත කෙරේ. මෙමගින් වසරකදී අවම වශයෙන් පුහුණු ශ්‍රමිකයන් 40,000ක් විදෙස් රැකියා සඳහා යොමුකළ හැක.
- ආයෝජන මණ්ඩලය මගින් රට තුළට කැඳවන ආයෝජකයන් අඩුවෙමින් පවතින අතර වියට්නාමය, තායිලන්තය, මැලේසියාව සහ බංගලිදේශය වෙත යොමුවන ආයෝජකයන්ගේ සංඛ්‍යාව ඉහළ යමින් පවතී. ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීමේදී එම රටවල් සමඟ තරඟ කළ හැකි මට්ටමට ආයෝජකක මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කොට අවුරුද්දකට රැකියා 60,000ක් පමණ අලුතින් බිහිකිරීමට කටයුතු කෙරේ.

■ විදේශ රටවල රථවාහන පැදවීමට ගැලපෙන සේ රථයේ වම්පසින් සුක්කානම හසුරුවන රියදුරු පුහුණුව ලබාදීමට පියවර ගැනේ.

# 17. විදේශගත ශ්‍රී ලාංකිකයින්

- විදේශයන්හි රැකියා සඳහා පිටත්වන පුද්ගලයින්ගේ සේවා කාලය නිශ්චිත කර ගැනීමත් ඔවුන්ට ගෙවිය යුතු අවම වැටුප තීරණය කර ගැනීමත් ඔවුන්ට හිමි සමාජ රක්ෂණ ප්‍රතිලාභ අරමුදල සේවය අවසන් කර ලංකාවට එනවිට ලබා ගැනීමේ පහසුකම සහතික කිරීමත් සඳහා ශ්‍රී ලංකාව සහ ලාංකිකයින් සේවයට යන රටවල් අතර ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කෙරේ.
- විදේශගත ශ්‍රමිකයින් උපයන ආදායම ලංකාවට එවීමේදී මුහුණ දෙන සියලු බාධා ඉවත් කිරීමට හා එම මුදල් සියලු බදුවලින් නිදහස් කිරීමට පියවර ගැනේ.
- විදේශගත ශ්‍රමිකයින් මුහුණපාන ගැටලු හා දුක් ගැනවිලි සොයා බලා ඊට මැදිහත්වීම සඳහා සෑම තානාපති කාර්යාලකම ඒ සඳහා වූ අංශයක් පිහිටුවේ.
- විදේශ රැකියා නියුක්තිකයන්ට සිදුවන හිරිහැර, ශ්‍රම සූරාකෑම ආදී අකටයුතුකම්, සෞඛ්‍ය ගැටලු ආදිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා පැය 24ම ක්‍රියාත්මක විශේෂ ඒකකයක් සහ ගාස්තුවෙන් නිදහස් ඇමතුම් අංකයක් ලබා දේ. ආදාළ දැනුවත් කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට අමතරව නීති සහ මානසික උපදේශන සේවා සැපයේ.
- විදෙස්ගතව රැකියාවල නිරත වන්නන්ට ඔවුන්ගේ වැටුප් කාණ්ඩය සහ ශ්‍රී ලංකාවට එවන ලද මුදල් ප්‍රමාණය සලකා තීරු බදු රහිත වාහන මිලදී ගැනීම සඳහා අවස්ථාව ලබා දේ.
- රැකියා සහ අධ්‍යාපනය සඳහා විදේශ ගතවූ පුරවැසියන්ට විදේශයන්හි සිට ඡන්දය භාවිතා කිරීම සඳහා පහසුකම් සැලසේ.
- විදෙස් රටවල පදිංචි වී රැකියාවේ නිරත ශ්‍රී ලාංකේය පවුල්වල සිටින විදෙස් අධ්‍යාපන ක්‍රමවේදයන් තුළ අධ්‍යාපනය ලැබූ දරුවන්ට, ශ්‍රී ලංකාවේදී අධ්‍යාපනය ලැබීමට සිදුවුවහොත් ඒ සඳහා රජයේ පාසල් හා විභාග පද්ධතිය තුළ අවශ්‍ය ඉඩකඩ සලසා දේ.
- විදේශ රැකියාවන්හි නිරතවන්නන් හදිසි ආපදාවන්ට හෝ අනතුරුවලට ලක්වූ විට සහ මියගිය විට ඔවුන් ලංකාවට ගෙන්වා ගැනීමේදී ඒ සඳහා රජය මැදිහත් වන අතර ඒ සඳහා වන වියදම් රජය මගින් භාර ගැනේ.

- රැකියා සඳහා විදේශගත වූවන්ගේ දරුවන් සහ දෙමව්පියන් මුහුණ දෙන අනාරක්ෂිතභාවයට හා වෙනත් සමාජ ගැටලුවලට විසඳුමක් ලෙස ඔවුන් සඳහා විධිමත් සමාජ ආරක්ෂණ ක්‍රමයක් සකස් කෙරේ.

# 18. ග්‍රාමීය සංවර්ධනය

අප රටේ ජනගහනයෙන් 55%ක් පමණ ග්‍රාමීය ප්‍රදේශවල වාසය කරන අතර ශ්‍රම බලකායෙන් 50%ක් ගම පදනම් කරගත් කෘෂි කර්මාන්තයේ යෙදී සිටී. ග්‍රාමීය ආර්ථිකයේ තාක්ෂණික නොදියුණු බව, ප්‍රාග්ධන හිඟය, අලෙවිකරණ ගැටලු, ප්‍රවාහන, සෞඛ්‍ය, අධ්‍යාපන, බලශක්ති ආදී සම්පත්වල නොදියුණු බව, මත්පැන්/මත්ද්‍රව්‍ය/දුම්වැටි භාවිතය, නීති විරෝධී ව්‍යාපාර, ළමා හා කාන්තා අපචාර, පුද්ගල ඝාතන, ආගමික හෝ වෙනත් ගැටුම්, මිත්‍යා විශ්වාස, වැඩිහිටියන් මුහුණ දෙන ගැටලු, ග්‍රාමීය හෝ නාගරික කාර්මීකරණයෙන් ඇතිවන පාරිසරික ගැටලු, දේශපාලන සහ මැරබලය විසින් ඇතිකළ බියගුළු ස්වභාවයන් ආදී පසුගාමී ලක්ෂණ රැසකින් අද ග්‍රාමීය ජනතාව හෙම්බත් වී සිටිති. ඒ නිසාම ඔවුහු ජාතික ආර්ථිකයට ඵලදායීව සම්බන්ධවීමට නොහැකිවීමේත් එහි ප්‍රතිලාභ සාධාරණ ලෙස නොලැබීමේත් අර්බුදයට මුහුණ දී සිටිති.

## විසඳුම

නවීන ශ්‍රී ලාංකික සමාජයක් ගොඩනැගීමේදී 30,000ක් වන ගම් ප්‍රමාණය නවීනත්වයට ගෙන ඒම අත්‍යවශ්‍යය. අගනගරයේ ශීත කාමරවල සැලසුම් කර බලෙන් ග්‍රාමීය ජනතාව මත පටවන සංවර්ධන මිත්‍යාවන් වෙනුවට සැබෑ සංවර්ධනයක් බිම් මට්ටමේ ඇති කිරීමේ අරමුණින් ජනාවාස ඒකක හෙවත් ගම්, අර්ධ නාගරික සහ නාගරික ජනාවාස ඒකක පදනම් කරගත් විද්‍යාත්මක සංවර්ධන ක්‍රමවේදයක් හඳුන්වා දේ. විශේෂයෙන්ම ග්‍රාමීය සංවර්ධනය වෙනුවෙන් දශක කීපයක් පුරා ක්‍රියාත්මක වූ සංකල්පීය ලෙස උසස් එහෙත් ක්‍රියාත්මක තලයේදී ජනතාව මුළාකරවන බංකොලොත් ව්‍යාපෘතිවන ග්‍රාමෝදය, ජනසවිය, සමෘද්ධිය සහ දිවි නැගුම වැනි වැඩසටහන් අසාර්ථක වීමට බලපෑ හේතු සියල්ල ගැඹුරින් සොයා බලා එවැනි දුර්වලතා කිසිසේත් ඇති නොවන පරිදි මෙම සංවර්ධන ක්‍රමවේදයන් සැලසුම් කෙරේ. (උදාහරණ ලෙස ග්‍රාමීය නිෂ්පාදන යටපත් වී යන ආකාරයට බහු ජාතික සමාගම්වල නිෂ්පාදන වෙළඳපොළට එක් කිරීමට ඉඩ ලබා නොදීම)

මෙහිදී ප්‍රාදේශීය ජනතා නියෝජිතයින් සහ විවිධ ක්ෂේත්‍රවල විශේෂඥ දැනුමැති පුද්ගලයින් මෙන්ම අදාළ වන රාජ්‍ය සහ පෞද්ගලික අංශවල නිලධාරීන් ගම් හෝ ජනාවාස පදනමට ගොස් ගම්වැසියන් සමග එක්ව ගමට හෝ ජනාවාස ඒකකයට අදාළ සෑම ක්ෂේත්‍රයකම දියුණු තාක්ෂණය ගමට ලැබෙන ආකාරයේ සැලසුම් සහගත සංවර්ධන සැලැස්මක් නිර්මාණය කර ක්‍රියාත්මක කෙරේ.

ප්‍රාදේශීය වශයෙන් තිබෙන මානව සහ භෞතික සම්පත්, සංවර්ධනය සඳහා ඇති අභියෝග ආදිය හඳුනාගෙන ඒ ඒ තත්වයන්ට සුදුසු වඩාත් ඉහළ තාක්ෂණික සහ කළමනාකරණ ක්‍රමවේද ජන සහභාගිත්වය ඇතිව ග්‍රාමීය මට්ටමට එක් කිරීම මෙහිදී සිදු කෙරේ. උදාහරණ ලෙස ග්‍රාමීය මට්ටමින් ආහාරවලින් හෝ බලශක්තියෙන් ස්වයංපෝෂණය වීමේ හැකියාව, සාමූහිකව ආදායම් ඉපැයීමේ ක්‍රමවේද (උදා- පශු සම්පත් කර්මාන්තය, සංචාරක කර්මාන්තය, අපද්‍රව්‍ය කළමනාකරණය, සුළු හෝ මධ්‍ය පරිමාණ බලශක්ති ජනනය, දැනුම් ආර්ථිකයට සම්බන්ධවීම, තොරතුරු තාක්ෂණය, පරිසර සංරක්ෂණය, ධීවර කර්මාන්තය) ප්‍රාදේශීයව ඇති මානව හා භෞතික සම්පත් යොදා ගනිමින් නිවාස, ජල සැපයුම්, මාර්ග ආදී යටිතල පහසුකම් සංවර්ධනය ආදිය පිළිබඳව ඇති සියලු ශක්‍යතාවන් සොයා බලා අදාළ ජන කොටස දැනුමින්, කුසලතාවෙන්, තාක්ෂණයෙන් සහ මූලික ආර්ථික හැකියාවෙන් ශක්තිමත් කෙරේ.

ජාතික මට්ටමේ ආර්ථික සහ සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී මෙම ප්‍රාදේශීය හෝ ග්‍රාමීය සංවර්ධන සැලසුම් පිළිබඳව දැඩි අවධානය යොමු කරන අතර එම සැලසුම්වලට පටහැණි නොවන ආකාරයට සහ ඒ හා සමගාමී වන ආකාරයට සකස් කෙරේ. ග්‍රාමීය නිෂ්පාදන ජාතික ආර්ථිකයට මනාව බද්ධ වන බව ඒ අනුව සහතික කෙරේ.

## ක්‍රියාමාර්ග

ගැටලු විසඳීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවනු ඇති අතර පංච විධ ප්‍රතිපත්ති මත පදනම්ව පහත ක්‍රියාමාර්ග ගැනේ.

(1) ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා නිෂ්පාදන බලවේග සංවර්ධනය කිරීම මගින් "පොහොසත් ගමක්",

(2) ග්‍රාමීය ජනජීවිතය දියුණු කිරීමට අදාල සේවාවන් විධිමත් කිරීම මගින් "දියුණු ගමක්",

(3) සමාජ අපචාර සහ පසුගාමී සංස්කෘතික ලක්ෂණ ඉවත්කිරීමේ ක්‍රියාමාර්ග මගින් "නවීන ගමක්",

(4) ග්‍රාමීය පරිසරය ආරක්ෂා කිරීමෙන් සහ විධිමත්ව සංවර්ධනය කිරීමෙන් "සුන්දර ගමක්",

(5) ග්‍රාමීය ජීවිතය හා පරිපාලනය සාධාරණත්වය, සාමූහිකත්වය හා සමානාත්මතාවය මත ගොඩනැගීමෙන් "ප්‍රජාතන්ත්‍රවාදී ගමක්".

**ගම පොහොසත් කිරීම උදෙසා,**

1. කෘෂි කර්මාන්තය සහ ග්‍රාමීය කර්මාන්ත දියුණු කිරීමට සෑම ග්‍රාම නිලධාරී වසමකටම රුපියල් මිලියන 50 බැගින් වසර පහක් තුළ වෙන් කෙරේ.

2. සෑම ග්‍රාම නිලධාරි වසමකටම විදුලිය බලය ලබා දේ.

3. සෑම ග්‍රාම නිලධාරි වසමකම නව ව්‍යවසායකයින් 10ක් සඳහා රුපියල් මිලියනය බැගින් 3% පොලියට ණය ලබා දේ.

**ගම දියුණු කිරීම උදෙසා,**

1. සියලු ග්‍රාමීය මාර්ග වසර පහක් තුළ කාපට් අතුරා ආරක්ෂිත පදික මාවත් සහිතව සංවර්ධනය කෙරේ.

2. වසරකට පාසල් 1000 බැගින් වසර පහ තුළ ග්‍රාමීය පාසැල් 5000ක් ගුරුවරුන්, පරිඝනක සහ වෙනත් භෞතික සම්පත් සහිතව දියුණු කෙරේ.

3. සෑම ග්‍රාම නිලධාරි වසමකම දැනට ඇති "කඩපිල" හෝ "හංදිය" වෙළඳ සංකීර්ණ ලෙස ගොඩනගා ග්‍රාමීය ව්‍යවසායකයින්ට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දේ.

**නවීන ගමක් නිර්මාණය කිරීම උදෙසා,**

1. සෑම ග්‍රාම නිලධාරි වසමකම සුභසාධන සංගම් පිහිටුවා වසරකට රුපියල් ලක්ෂය බැගින් පළමු වසර පහ තුළ ලබා දේ.

2. විවිධ ඇබ්බැහිවීම් සහ ප්‍රචණ්ඩකාරී ක්‍රියා වැළැක්වීම සඳහා ග්‍රාමීය නායක නායිකාවන් පුහුණු කෙරේ.

3. මිත්‍යා විශ්වාස ඇතුළු පසුගාමී අදහස් වෙනස් කිරීම සඳහා විද්‍යා ව්‍යාප්ති කොමිසමේ කටයුතු පුළුල් කෙරේ. රූපවාහිනී, ගුවන් විදුලි සහ මුද්‍රිත මාධ්‍ය මේ සඳහා යොදා ගැනේ.

4. කලා, සාහිත්‍ය සහ සංස්කෘති කටයුතු ඉහළ නැංවීම සඳහා පහසුකම් සපයනු ලැබේ. ගම් කිහිපයක් ආවරණය වන පරිදි අත්‍යාවශ්‍ය පහසුකම් සහිත (පුස්තකාල, කුඩා රංගශාලාවක් ඇතුළත්) සුබසාධන ගොඩනැගිල්ලක් ලබා දෙනු ඇත.

**සුන්දර ගමක් උදෙසා,**

1. ගම තුළ හෝ ගමට බලපාන සියලු සංවර්ධන සහ කර්මාන්තවලදී ගමේ බහුතරයේ කැමැත්ත ලබා ගැනේ.

2. සෑම ගමකටම සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය ලබා දේ.

3. ශබ්ද (උදා - පොදු කැමැත්තට පටහැණිව භාවිතා කරන ශබ්ද විකාශනයන්) සහ දර්ශන (වෙළඳ හා දේශපාලන ප්‍රචාරණ පුවරු හෝ දැන්වීම් ආදී) දූෂණය වීම හැකිතාක් අවම කිරීම සඳහා පියවර ගැනේ.

**ප්‍රජාතන්ත්‍රවාදී ගමක් උදෙසා,**

1. සෑම ගමකම පාර්ලිමේන්තු පනතකින් බලය පැවරෙන වගකීම් සහිත ග්‍රාමීය සභාවක් (ඉන්දියාවේ පංචායත් ක්‍රමය මෙන්) පිහිටුවා එයට ස්වේච්ඡා මහජන නියෝජිතයින් පත්කර ගැනීමේ ක්‍රියාවලියක් ඇති කෙරේ. එහි නියෝජනයෙන් 50% ක් කාන්තාවන් විය යුතුය.
2. අයුතු දේශපාලන, මුදල්, සමාජමය හෝ මැර බලය මුළුමනින් පිටු දැකීමට අවශ්‍ය නෛතික සහ වෙනත් ක්‍රියාමාර්ග ගැනේ.
3. කාන්තාවන්ට සිදුවන අසමානතාවන් දුරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනේ.

පළමු වසර 05 තුළ ඉහත පංචවිධ අරමුණු සියල්ලෙන් පිරිපුන් ගම් 10,000ක් ඇති කිරීමට සියලු උත්සාහයන් දැරේ.

# සාධාරණ සමාජයක්

සමාජයක යහපැවැත්ම සඳහා ආර්ථික සමෘද්ධිය සහ සමාජ සාධාරණත්වය යන අංග දෙකම අත්‍යවශ්‍ය වේ. නවීන සමාජවාදී රාජ්‍යයක ප්‍රධාන අරමුණ වන්නේ සමාජ සාධාරණත්වය, සමානාත්මතාවය, යුක්තිය ඉටු කිරීම හා ජන ජීවිතයේ යහපැවැත්මට අවශ්‍ය ආර්ථික සමෘද්ධිය අත්පත් කර ගැනීමය. ආණ්ඩුව, පෞද්ගලික සමාගම්, ආයතන හා සංවිධාන, පවුල හා පුද්ගලයා යන සමාජ සංවිධාන හතරම සාධාරණ සමාජයක් ගොඩනැංවීම වෙනුවෙන් අන්තර් සම්බන්ධීකරණයෙන් යුතුව මෙහෙයවිය යුතුය.

මෙම අරමුණ ඉටු කර ගත හැකි පරිදි මානව හිමිකම් හා මූලික අයිතීන්, නෛතික හා අධිකරණ ක්ෂේත්‍ර, පාරිභෝගික ආරක්ෂණ ආයතන, මූල්‍ය හා මහජන උපයෝගීතා පිළිබඳ ක්ෂේත්‍ර ආදිය සමාජ සාධාරණත්වය උපරිම වශයෙන් රකිමින් පහත සඳහන් පරිදි පෙරළිකාර වෙනස්කම්වලට ලක්කළ යුතුය.

# 01. ආණ්ඩුවේ කාර්යභාරය

## මූලික මිනිස් අයිතීන්

- ජාත්‍යන්තර මානව හිමිකම් පිළිබඳ ගිවිසුම් හා මානව හිමිකම් පිළිබඳ ප්‍රඥප්ති පිළිගන්නා අතර පුරවැසි අයිතීන් ආරක්ෂා කර තහවුරු කිරීම සඳහා නීති සම්පාදනය කෙරේ.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් කම්කරු, ගොවි, තරුණ, ශිෂ්‍ය, කාන්තා, ළමා, වැඩිහිටි හා හැකියාවන් සීමිත බවට පත් පුරවැසියන්ගේ අයිතීන් ආරක්ෂා කෙරේ.
- සියලු පුරවැසියන්ට තොරතුරු දැනගැනීමේ අයිතිය සහතික කෙරේ.
- සියලු පුරවැසියන්ට පුද්ගලික ආරක්ෂාව ලැබීම සහතික කෙරේ.

## අධිකරණය සහ නීති පසිඳලීමේ ක්‍රියාවලිය

- යල් පැනගිය පැරණි නීති වෙනුවට නූතන තත්වයන්ට ගැලපෙන පරිදි නීති පද්ධතිය සකස් කෙරේ.
- අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කෙරේ.
- නීති ආධාර දෙපාර්තුමේන්තුවක් ස්ථාපිත කර එහි ප්‍රතිලාභ මහජනතාවට ඉතා පහසුවෙන් ලබා ගත හැකි ආකාරයට විමධ්‍යගත කෙරේ. තාක්ෂණික පහසුකම් මෙන්ම මානව සම්පත්වලින් එම සේවාව පුළුල් කෙරේ.
- මූලික අයිතීන් උල්ලංඝනය පිළිබඳව රජයට එරෙහිව පමණක් නොව පෞද්ගලික අංශයට හා වෙනත් ආයතනවලට එරෙහිවද අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමේ අයිතිය පුරවැසියන්ට හිමි කෙරේ.
- දැනට ගොඩගැසී ඇති අති විශාල නඩු සංඛ්‍යාව ඉක්මනින් විසඳීමේ පිළියමක් ලෙස විනිශ්චයකාරවරුන්ගේ ප්‍රමාණය වැඩිකර නඩු විභාග කරන කාල සීමාව දීර්ඝ කෙරේ. එමගින් අධිකරණවල වසරකදී නිමා කරන 875,000 වූ නඩු සංඛ්‍යාව ලක්ෂ 12 දක්වා වැඩි කෙරේ.
- වසරකදී ගොනුවන 290,000ක් රථවාහන නඩු සංඛ්‍යාව ලක්ෂය දක්වා අඩු කිරීමේ පියවරක් ලෙස රථවාහන වැරදි සම්බන්ධයෙන් පොලීසිය මගින් නියුත් කරන දඩ මගින් විසඳීමට කටයුතු කෙරේ.
- උසාවි ක්‍රියාවලිය පරිඝනක සහ අන්තර්ජාලගත කිරීම මගින් වඩාත් කාර්යක්ෂම කෙරේ. (e-Court)
- ගැටුම්කාරී තත්ත්වයන්හිදී අවනීතියට යොමුවීම වෙනුවට නීතිමය අර්ථ විග්‍රහයන් සහ නීතියේ පිහිට ජනතාවට ලබා දීම වඩාත් පහසු කිරීම උදෙසා අධිකරණ සේවා කොමිසමේත් නීතීඥ ප්‍රජාවගේත් සහභාගිත්වයෙන් නීතිමය ක්‍රියාමාර්ගවලින් ජනතාව ඈත්වීමට බලපාන කරුණු පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක් සිදු කරන අතර ඒ මත පොදු වැඩපිළිවෙළක් සකස් කෙරේ.

## අපරාධ හා බන්ධනාගාර

- අපරාධ වැළැක්වීම සඳහා යොමුවූ කඩිනම් අධ්‍යාපන හා දැනුවත් කිරීමේ ජාතික ව්‍යාපාරයක් ආරම්භ කෙරේ.
- සමාජ ආරක්ෂණය අහිමිවීම පුද්ගලයින් අපරාධවලට පෙළඹවීමක් වන බැවින් අපරාධ වැළැක්වීම සඳහා සියලු පුරවැසියන්ගේ සමාජ ආරක්ෂණය සහතික කෙරේ.

- අපරාධවලට වැරදිකරුවන්වන සියලු දෙනා යහපත් පුරවැසියන් බවට පත් කිරීම සඳහා වූ පුනරුත්ථාපන හා අධ්‍යාපන මධ්‍යස්ථාන, බන්ධනාගාරවලට අනුබද්ධව පිහිටුවේ.
- රැඳවියන්ට වෘත්තීය පුහුණුව හා උසස් අධ්‍යාපනයට ඇතුළුව වැඩිදුර අධ්‍යාපනය ලබා දීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසේ.
- මත්ද්‍රව්‍ය භාවිතය මුළුමනින් තුරන් කිරීම සඳහා තරතිරම නොබලා නීතිය තදින්ම ක්‍රියාත්මක කෙරේ.

## ළමා හා කාන්තා අයිතිවාසිකම්

- ළමුන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා දැනට ඇති නීතිමය විධිවිධාන සහ ආයතනමය ව්‍යුහයන් විශ්ලේෂණය කර පරිපූර්ණ ළමා ආරක්ෂණ ප්‍රතිපත්තියක් සහ නෛතික විධිවිධාන සකස්කර ක්‍රියාවට නැගේ.
- ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරින් සඳහා පොලිස් හෝ නීතිමය ක්‍රියාමාර්ග, විමර්ශනය, පුනරුත්ථාපනය වැනි ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වෘත්තීය පුහුණුවීම් සහ කුසලතා වර්ධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනේ.
- පාසල් අධ්‍යාපනය ලැබීමේ අනිවාර්ය වයස් සීමාව අවුරුදු 16 දක්වා වැඩි කෙරෙන අතර වයස 16ට අඩු දරුවන් රැකියාවල නිරත කිරීම සපුරා තහනම් කෙරේ.
- ළමා හිංසනය හා අපයෝජන වැළැක්වීමට අවශ්‍ය පරිපාලන හා සමාජයීය ප්‍රතිසංස්කරණ සිදු කරන අතර ඒවා උල්ලංඝනය කරන්නන්ට එරෙහිව නීති මගින් කටයුතු කෙරේ.
- දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳව දීප ව්‍යාප්ත සමීක්ෂණයක් සිදු කර දිවයින පුරා ඒවා විධිමත්ව පිහිටුවීමේ වැඩපිළිවෙළක් ආරම්භ කෙරේ. රැකියාවන්හි නිරත මව්වරුන්ගේ දරුවන් වෙනුවෙන් නිවස හෝ රැකියාව කරන ස්ථානය ආසන්නයේ එවැනි මධ්‍යස්ථාන ස්ථාපිත කෙරේ.
- නිල් චිත්‍රපට සහ අසභ්‍ය වෙබ් අඩවිවලට දරුවන් ගොදුරුවීම වැළැක්වීම සඳහා ඉන් සිදුවන මානසික සහ ශාරීරික ගැටලු පිළිබඳව දෙමව්පියන් පාසැල් මට්ටමින් දැනුවත් කරන අතර නිවෙස්වලදී එවැනි දර්ශන හා අසභ්‍ය වෙබ් අඩවි බැලීමට ඇති ඉඩ ඇහිරීමට දෙමව්පියන්ගේ සහාය ලබා ගැනීමත් ඒ සඳහා නවීන තාක්ෂණ විධික්‍රම හඳුන්වා දීමත් සිදු කෙරේ.
- ළමා අපචාර හා නිල් චිත්‍රපට නැරඹීම පිළිබඳව දරුවන්ගේ අනන්‍යතාවය හෙළි නොවන සේ පාසැල් මට්ටමින් සමීක්ෂණයක් සිදු කෙරෙන අතර එම ක්‍රියාවලින් දරුවන් මුදා ගැනීම සඳහා ඔවුන් වෙනුවෙන් අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

- කාන්තාවන් පීඩාවට ලක්කරන සමාජ අසමානතාවයන්, පීඩාවන්, වෙනස්කම් කිරීම් හා බාධාවන් අහෝසි කරන අතර සෑම ක්ෂේත්‍රයකම කාන්තාවන්ට පිරිමි හා සම අයිතිවාසිකම් සහතික කෙරේ.
- හිංසාකාරී ඇමතුම් හරහා සිදුකරන පීඩනය සහ වාචික අතවරයන් පිළිබඳ නීති රීති සකස් කෙරෙන අතර වරදකරුවන්ට දඬුවම් පැමිණවීමට කටයුතු කෙරේ.
- නීතිය ඉදිරියේදී මෙන්ම සම්ප්‍රදායන් හා සමාජ ආකල්ප ඉදිරියේදී කාන්තාවන්ගේ ගරුත්වය හා සමාන අයිතීන් තහවුරු කෙරේ.
- විවාහ ජීවිතය තුළදී කාන්තාවන් මුහුණ දෙන ගැටලු සහ අසමානතාවය අහෝසි කිරීම සඳහා දෑවැදි ක්‍රමය තහනම් කෙරෙන අතර දරුවන් ලැබීම පිළිබඳ තීරණ ගැනීමේ පූර්ණ අයිතිය කාන්තාවන් සතු කෙරේ.
- සාර්ථක විවාහ ජීවිතයක් සහතික කිරීමටත් දික්කසාද, කාන්තා හිංසන, ළමා හිංසනය, මානසික පීඩනය, අන්තර් පුද්ගල ගැටුම්, සියදිවි නසා ගැනීම් අවම කිරීමත් උදෙසා විවාහ අපේක්ෂිත සියලු තරුණ තරුණියන්ට ඉඩම් මිලදී ගැනීම, නිවාස ඉදි කිරීම, මුදල් කළමනාකරණය, කායික මානසික සෞඛ්‍යය ආරක්ෂා කිරීම, ලිංගික අධ්‍යාපනය හා ප්‍රජනන සෞඛ්‍යය, ගැටුම් වැළැක්වීම, දරුවන් රැක බලා ගැනීම ආදී අදාල සියලු කරුණු ඇතුළත් දින දෙකක පාඨමාලාවක් දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ආරම්භ කෙරේ.

## විශ්‍රාමිකයින්, වැඩිහිටි පුරවැසියන්, ආබාධිත සහ වෙනස්වූ හැකියාවන් සහිත පුරවැසියන්

- මෙම සියලු පුරවැසියන් ඔවුනගේ කැමැත්ත අනුව නිෂ්පාදන ආර්ථික ක්‍රියාවලියට හවුල්කර ගන්නා අතර ඒ සඳහා අවශ්‍ය අධ්‍යාපනය සහ තාක්ෂණික පහසුකම් රජය මගින් ලබා දේ.
- සංවර්ධන ක්‍රියාවලියේදී මෙම පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වූ නෛතික තත්වයන් ස්ථාපිත කරන අතර අදාල රාජ්‍ය ආයතන මඟින් තාක්ෂණික මගපෙන්වීම් සිදු කෙරේ.
- වැඩිහිටි පුරවැසියන්ගේ දැනුම සහ අත්දැකීම් ප්‍රයෝජනයට ගතහැකි ආකාරයට විවිධ ආයතන හා සේවාවන්වල කටයුතු සඳහා ඔවුන් හැකි උපරිමයෙන් සම්බන්ධකර ගැනේ.
- දැනට සේවයේ නියුතු රජයේ සේවකයින්ගේ මූලික වැටුපට එකතු කරනු ලබන වැටුප් වර්ධකයන් රජයේ විශ්‍රාමිකයින්ටද ගෙවීමට කටයුතු කෙරේ.

- වයස අවුරුදු 65ට වැඩි වයසේ පසුවන පුද්ගලයන් වෙසෙන නිවාස නියමිත නිර්දේශයන්ට අනුකූලව ඉදිකිරීම තුළින් ගෘහස්ථව සිදුවන අනතුරු වළක්වා ගැනීම වෙනුවෙන් අදාළ අවශ්‍යතාවය සලකා ඔවුන්ට ණය ආධාර ලබාදේ.

## සමාජ සුභසාධනය

- සමාජයීය රැකවරණය ලැබිය යුතු සියලු පුරවැසියන් වෙනුවෙන් සමාජ සුභසාධනය හා පුනරුත්ථාපනය සඳහා පූර්ණ බලැති අධිකාරියක් ස්ථාපිත කෙරේ.
- සමාජ සුභසාධනය සඳහා අවශ්‍ය සියලු මූල්‍ය ප්‍රතිපාදන රජය මගින් සැපයේ.
- පුරවැසියන්ගේ ජීවන තත්වය පිළිබඳව වරින්වර සමීක්ෂණ සිදුකරමින් ජීවන තත්වය නඟා සිටුවිය යුතු පුරවැසියන් සියලු දෙනාට ප්‍රමාණවත් සහන ලබාදීමට කටයුතු කෙරේ.
- දෙමාපිය රැකවරණය නොමැති දරුවන්, රැකබලා ගැනීම සඳහා වගකිව යුතු කිසිවකු නොමැති වැඩිහිටියන්, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන්, බාල අපරාධකරුවන් ආදීන් රැක බලා ගැනීමට හා පුනරුත්ථාපනය කිරීමට කටයුතු කෙරේ.
- මත්කුඩු සඳහා යොමුවීම අපරාධයක් ලෙසින් නොව දුබලතාවයක් ලෙසින් සලකා පුනරුත්ථාපනය සඳහා වැඩසටහන් ඇති කෙරේ. එම පුනරුත්ථාපන ආයතන නවීන පහසුකම් සහිතව ස්ථාපිත කෙරේ.
- වෘත්තීමය මත් ජාවාරම්කරුවන් සඳහා දැඩි දඬුවම් පැනවේ.

## නාස්තිය, දූෂණය සහ වංචා වැළැක්වීම

- දැනට වාර්තා වී ඇති සියලු වංචා සහ දූෂණ කඩිනමින් පරීක්ෂා කිරීමත් චූදිතයින්ට වහා දඬුවම් කිරීමත් රජයේ ප්‍රමුඛ කාර්යයක් වේ.
- දූෂණ සහ වංචා පිළිබඳව පරීක්ෂා කිරීමට සහ වගකිවයුත්තන්ට දඬුවම් කිරීම සඳහා පිහිටුවා ඇති සියලු ආයතන වඩාත් ශක්තිමත් සහ මුළුමනින්ම ස්වාධීන ආයතන බවට පත්කෙරේ.
- චූදිතයින්ට කිසිදු ආකාරයක දේශපාලන රැකවරණයක් ලබා දීමට ඉඩ නොදෙන අතර එසේ ලබා දීමට උත්සාහ කරන්නන්ද වැරදිවලට හවුල්වූවන් බවට පත් කිරීමට අවශ්‍ය නීති සකස් කෙරේ.
- දඬුවම් දීමෙන් පමණක් නොනැවතී මේ දක්වා සිදුවූ වංචා, දූෂණ සහ නාස්ති සිදුවූ ආකාරයන් සහ ඊට හේතුවූ රාජ්‍ය යාන්ත්‍රණයේ දුර්වලතා (උදා- නීතිරීති, නීතිරීති පිළිබඳ නොදැනුවත්කම, ඉහළින් එන තර්ජන, පොලිස්, බුද්ධි අංශ, විගණන,

බදු, රේගු, කොමිෂන් සභා ආදී විවිධ ක්ෂේත්‍රයන්හි දුර්වලතා වැනි) ගැඹුරින් අධ්‍යයනය කර වංචා, දූෂණ සහ නාස්ති නැවත නැවතත් ඇතිවීම වැළැක්වීමට අවශ්‍ය විධිමත් පියවර ගැනේ.

- වංචා, දූෂණ, නාස්ති හා අපරාධ ආදිය සැලසුම් කිරීම් හෝ ක්‍රියාත්මක කිරීම් සම්බන්ධයෙන් තොරතුරු එක් රැස් කිරීම සඳහා දින 365 පැය 24 පුරා ක්‍රියාත්මක, ඊමේල් සහ දුරකථනවලින් තොරතුරු ලබා දිය හැකි මධ්‍යස්ථානයක් පිහිටවනු ලබන අතර දැනුම් දෙන්නන් (Whisleblower) ආරක්ෂා කිරීමටත් වළක්වන ලද නාස්තියේ හෝ වංචාවේ හෝ අපරාධයේ ප්‍රමාණය අනුව යම් දිරි දීමනාවක් දැනුම් දෙන්නාට ගෙවීමටත් කටයුතු කෙරේ.
- සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ වෙබ් අඩවියක් ආරම්භ කර මහජන මුදල් රු. ලක්ෂ 100 ඉක්මවන සියලු ව්‍යාපෘති සම්බන්ධ මූලික අධ්‍යයන වාර්තා, පරිසර වාර්තා, ඇස්තමේන්තු, විකල්ප යෝජනා, ටෙන්ඩර් කැඳවීම්, ප්‍රදානයන්, සැලසුම් වෙනස් කිරීම් (variations - scope changes) සහ ප්‍රගති වාර්තා මෙම වෙබ් අඩවිය හරහා කඩිනමින් ප්‍රසිද්ධ කෙරේ. මේ සඳහා වූ පනතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරේ.
- සියලු මධ්‍යම සහ මහා පරිමාණ ව්‍යාපෘති සඳහා ඵලදායී සහ ලාභදායී විකල්ප මෙන්ම ඵලදායී විවේචන ඉදිරිපත් කිරීමේ අවස්ථාව පොදුවේ ලබා දීම සඳහා රාජ්‍ය හෝ පෞද්ගලික ආයතන මගින් සකසන මුල් මොඩලය හෝ ව්‍යාපෘති යෝජනාව භාෂා ත්‍රිත්වයෙන් ප්‍රසිද්ධියට පත්කෙරේ.

## 02.පෞද්ගලික සමාගම්වල හා ආයතනවල කාර්යභාරය

සාධාරණ සමාජයක් ගොඩනැංවීමේදී පෞද්ගලික සමාගම් සහ ආයතන විසින් සිදුකරනු ලබන අධිපතිවාදී ප්‍රවේශයන් හා ක්‍රියාවන් නතර කළ යුතුය. ඒ සඳහා,

- මූලික අයිතීන් උල්ලංඝනය වීමේදී පෞද්ගලික සමාගම් සහ ආයතන ආවරණය වන පරිදි නෛතික විධිවිධාන සකස් කෙරේ.
- විශාල මූල්‍ය, මාධ්‍ය හෝ පිරිස් බලයක් ඇති සමාගම්වලින් සහ ආයතනවලින් සිදුවිය හැකි අධිපතිවාදී ක්‍රියාකාරකම් සීමා කෙරෙන රෙගුලාසි හා ආචාරධර්ම පද්ධතියක් සකස් කෙරේ.
- ජන ජීවිතයට පුළුල් ලෙස බලපාන ආර්ථික, මූල්‍ය හා සංස්කෘතික ක්ෂේත්‍රවල ඒකාධිකාරයන් ගොඩ නැගීමට නොහැකිවන සේ නීති හා රෙගුලාසි සකස් කෙරේ. එවැනි සමාගම් හා ආයතන පාර්ලිමේන්තුවට වගකියන ආකාරයෙන් ව්‍යවස්ථා ප්‍රතිපාදන ඇති කිරීම මගින් සමාජයේ සාධාරණ පැවැත්ම සහතික කෙරේ.

- පාරිභෝගික ආරක්ෂාව සහ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා ඒ ඒ අංශවලට අදාල සියලු රජයේ ආයතන (උදා - පාරිභෝගික සේවා අධිකාරිය, මහජන සෞඛ්‍ය පරීක්ෂක, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වැනි) ශක්තිමත් කරන අතර පාරිභෝගිකයින් ලෙස පෙනී සිටින අහඹු පරීක්ෂකයින් (Mystery Shoppers) මගින් නීති හෝ සදාචාර විරෝධී ලෙස භාණ්ඩ හෝ සේවා සපයන්නන්ගේ තොරතුරු රැස් කිරීමට කටයුතු කෙරේ.

## 03. පවුල සහ පුද්ගල කාර්යභාරය

සමාජ සාධාරණත්වය සහිත සමාජයක් ගොඩනැංවීමේ දී පවුල තුළද එම සාධාරණත්වයේ මූලධර්ම ක්‍රියාත්මක වීම අත්‍යවශ්‍ය වේ. ගෘහස්ථ හිංසනය, කාන්තා හිංසනය, ළමා හිංසනය, විශේෂයෙන්ම කාන්තාවන්ට විවාහය, රැකියාව හා සංස්කෘතිය භුක්ති විඳීම හා සමානයන් ලෙස ජීවිතය පවත්වාගෙන යාමට බාධාකාරී තත්වයන් පවුල් ඒකකය තුළ වර්ධනය වීම නැවැත්වීම සාධාරණ සමාජයක් බිහි කිරීමේදී අත්‍යවශ්‍ය වේ.

තනි තනි පුරවැසියටද සාධාරණ සමාජයක් ගොඩනැංවීමේ ක්‍රියාවලියට දායක වීම අනිවාර්ය වගකීමක් වේ.

# නිවහල්
# මිනිසෙක්

නවීන සමාජවාදී සමාජයක මුඛ්‍ය පරමාර්ථය වන්නේ නිවහල් පුරවැසියකු හෙවත් තමා ගැන හා තම රට ගැන ස්වාභිමානයෙන් යුත්, තම යුතුකම්, වගකීම් හා අයිතීන් ගැන දන්නා, සිය නිදහස හා ආරක්ෂාව පිළිබඳ දැඩි විශ්වාසයෙන් යුත්, උගත් හා සංවේදී මනසක් ඇති තෘප්තිමත් පරිපූර්ණ පුද්ගලයකු ගොඩනැගීමය.

පාසැල් හා සරසවි අධ්‍යාපනයද, සංස්කෘතික හා කලා ක්ෂේත්‍රයේද ඉහත අරමුණින් යළි සංවිධානය කළ යුතුය. අප රටේ අතීත පරම්පරාවන් විසින් දායාද කර ඇති යහපත් භෞතික හා අධ්‍යාත්මික උරුමයන් පිළිබඳ අගයීමක් ඇති පුද්ගලයින් බවට පත් කිරීමට එම ක්ෂේත්‍රයන් මෙම අරමුණට මෙහෙය විය යුතුය. එමෙන්ම ලොව අන්‍ය ජාතීන් සහ ජනතාවන්ගේ නිදහස හා ස්වෛරීත්වය ගරු කරන පුද්ගලයකු ගොඩනැගීම උදෙසා ජනමාධ්‍ය හා පොදු ජන කටයුතු මෙහෙයවිය යුතුය. මේ ලක්ෂණවලින් යුත් නිවහල් මිනිසකු ගොඩනැගීම වෙනුවෙන් අධ්‍යාපන, සංස්කෘතික හා කලා,  නෛතික ප්‍රතිසංස්කරණ, ජනමාධ්‍ය හා සදාචාරය වැනි ක්ෂේත්‍ර එම අරමුණට අනුව සකස් කළ යුතුය.

- සෑම පුරවැසියකුම උසස් රසවින්දනයෙන් යුක්ත වූවකු බවට පත් කිරීම රජයේ ප්‍රමුඛ කාර්යභාරයක් ලෙස සලකා කටයුතු කෙරේ.
- සිංහල, දෙමළ, මුස්ලිම් ඇතුළු සියලු ජනතාවගේ කලා හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කර පෝෂණය කරන අතර ඒවා මගින් ජනතාව අතර මිත්‍රත්වය, සහෝදරත්වය හා සමගිය ගොඩනැගීම සඳහා කටයුතු කෙරේ.
- කලාකරුවන්ගේ ආත්ම ප්‍රකාශනය සඳහාවන අයිතිය හා පුරවැසියාට එම කලා නිර්මාණ රසවිඳීමට ඇති අයිතිය සුරක්ෂිතවන පරිදි ඒ පිළිබඳ ජාතික ප්‍රඥප්තියක් සකස් කෙරෙන අතර ඒ සඳහා ක්ෂේත්‍රයේ නියුතු වූවන්ගෙන් සමන්විත මණ්ඩලයක් පත් කෙරේ.
- කලා නිර්මාණකරුවන්ගේ අයිතිය තහවුරු කිරීම සඳහා ජාතික බුද්ධිමය දේපොළ කාර්යාංශය බලගැන්වේ.

- රූපවාහිනිය, නාට්‍ය, චිත්‍ර, මූර්ති ආදී කලා මාධ්‍ය සඳහා විධිමත් පුහුණුවක් ලබා දීමේ පුහුණු ආයතන බිහි කරන අතර ආරම්භයක් ලෙස පළමු වසර තුළ එවැනි ආයතන දෙකක් ස්ථාපිත කෙරේ.
- ජාත්‍යන්තර මට්ටමේ රංගකලා සහ චිත්‍රපට අභ්‍යාස විද්‍යාලයක් ආරම්භ කෙරේ.
- නාට්‍ය කලාව ජනතාව අතරට ගෙනයාම අරමුණු කර ගනිමින් ප්‍රාදේශීය මට්ටමින් නාට්‍ය හා රංග ශාලා ගොඩනැඟීමට කටයුතු කෙරේ.
- ජාත්‍යන්තර චිත්‍රපට උළෙලක් රජයේ මැදිහත්වීමෙන් සෑම වසරකම පැවැත්වේ.
- චිත්‍ර ප්‍රදර්ශන පැවැත්වීම සඳහා දැනට කොළඹට සීමාවී ඇති ප්‍රදර්ශන ශාලාවට (Art Gallary) අමතරව පළාත් මට්ටමින් ප්‍රදර්ශන ශාලා ඉදි කෙරෙන අතර චිත්‍ර ශිල්පීන්ට ඉතාම සහන මිලකට ඒවා ලබා දේ.
- ශ්‍රී ලාංකේය චිත්‍ර ශිල්පීන් වෙනුවෙන් උසස් මට්ටමේ චිත්‍ර කලා ප්‍රදර්ශනයක් හා සම්මාන උළෙලක් පැවත්වා දක්ෂයින් දිරිමත් කිරීම සඳහා සම්මාන ප්‍රදානය කෙරේ.
- අන්තර්ජාතික සහ ජාතික චිත්‍ර තරගයක්, ප්‍රදර්ශනයක් හා සම්මාන උළෙලක් වාර්ෂිකව පැවැත්වේ.
- පාසැල් හා ග්‍රාමීය මට්ටමේ සිටම දක්ෂ කලාකරුවන් හඳුනාගෙන ඔවුන් ජාතික හා ජාත්‍යන්තර මට්ටමට පත් කිරීමට අවශ්‍ය පුළුල් යාන්ත්‍රණයක් ස්ථාපිත කෙරේ.
- කලාකරුවන් උදෙසා ජීවිත රක්‍ෂණ ක්‍රමයක්, සෞඛ්‍ය රක්‍ෂණ ක්‍රමයක් මෙන්ම විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දේ.
- සාහිත්‍ය සහ අනෙකුත් කලා කෘති නිර්මාණය පිණිස කලාකරුවන්ට අඩු පොලී බැංකු ණය පිරිනැමේ.
- නවක තරුණ කලාකරුවන්, සිනමාකරුවන් සහ වේදිකා නාට්‍ය නිර්මාණකරුවන්ගේ නිර්මාණ එළිදැක්වීමට රාජ්‍ය ආයතන සතු රංග ශාලා සහන මිලට ලබා දේ.
- සමාජයේ උන්නතිය වෙනුවෙන් රාජ්‍ය හා පෞද්ගලික ජනමාධ්‍ය සංස්කෘතික විප්ලවීය වෙනසකට භාජනය කර ඒවා රජයේ හෝ බලධාරින්ගේ හෝ වෙනත් බලවේගයන්ගේ මතවාදයන් ජනතාව මත පටවන නොදියුණු තත්වයෙන් මුදා ගැනේ.
- දරුවන්ගේද පොදුවේ පුරවැසියන්ගේද අධ්‍යාපනය, සාහිත්‍ය හා කලා රසවින්දනය, නව තොරතුරු හා ප්‍රවෘත්ති දැන ගැනීම යන අරමුණු වෙනුවෙන් ප්‍රධාන වශයෙන් ජනමාධ්‍ය යොදා ගැනීමට කටයුතු කෙරේ.

- පුරවැසි අයිතිය හා මාධ්‍ය වගකීම පිළිබඳව දැනට පවතින විසංවාදයන් පිළිබඳව සලකා බලා ඊට අදාළ ප්‍රඥාප්තියක් සකස් කිරීම සඳහා මාධ්‍යවේදීන්, මාධ්‍ය හිමියන් හා පුරවැසි නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවක් ස්ථාපිත කෙරේ.
- ශ්‍රී ලංකාවේ ඓතිහාසික උරුමයන් වූ පෞරාණික ස්ථාන හා භාණ්ඩ සංරක්ෂණය කිරීම, ඒවායේ තිරසාර පැවැත්ම තහවුරු කිරීම හා අනාගත පරපුර උදෙසා ඒවා ජාතික උරුමයන් ලෙස සුරැකීම රජයේ ප්‍රමුඛ වගකීමක් බවට පත් කෙරේ.
- පුරාවස්තු වැනසීමේ අපරාධකාරී ක්‍රියාවලිය මුළුමනින්ම නතර කිරීමට වහාම පියවර ගැනේ.

නිවහල් පුරවැසියන් බිහිවන්නේ, ශ්‍රී ලංකාව ලෝකය තුළ නිවහල් ජාතියක් ලෙස ස්ථාපිත වීමත් සමගය. ඒ අනුව අධිරාජ්‍යවාදී දේශපාලන, ආර්ථික හා සංස්කෘතික නව යටත්විජිතවාදී ආක්‍රමණවලින් මාතෘභූමිය ආරක්ෂා කරගැනීමත් ජනතාවගේ පරමාධිපත්‍ය බලය හා රටේ ආර්ථික, දේශපාලන, සමාජීය හා සංස්කෘතික ස්වෛරීත්වය ඉහළින්ම පවත්වාගෙන යෑමත් රටේ ගරුත්වය හා කීර්තිනාමය කිසි ලෙසකින් හෝ කෙළෙසීමට ඉඩ නොදීමත් ශ්‍රී ලාංකේය ජාතිය සතු හැකියාවන් හා වටිනාකම් පිළිබඳ ස්වාභිමානයෙන් පිරුණු පුරවැසි සමාජයක් ගොඩනැගීමත් නවීන සමාජවාදී රාජ්‍යයේ ප්‍රතිඥාවක් සහ මුඛ්‍ය පරමාර්ථයක් බවට පත්වේ.